# මැදහත්කමේ

# යාච්ඤාව

## භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන ආකාරය . . . . . . . 3

කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . 4

හැඳින්වීම . . . . . . . . . 5

පාඨමාලාවේ අරමුණු . . . . . . . . 6

1. යාච්ඤාව සඳහා හැඳින්වීමක් . . . . . . . 7

2. මැදහත්කමේ යාච්ඤාව . . . . . . . 14

3. මැදහත්කම උදෙසා වූ ආත්මික සම්පත්. . . . . 19

4. මැදහත්කම් කරන ආකාරය . . . . . . . 30

5. බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමට ඇති බාධාවන් . . 40

6. මැදහත්කම් කිරීම සඳහා ආදර්ශ යාච්ඤාව පාවිච්චි කිරීම . . 44

7. පිබිදීමක් උදෙසා මැදහත්කම් කිරීම . . . . . 54

8. ආරම්භ කිරීම හා ඉදිරියට පවත්වාගෙන යාම . . . . . 66

උපග්‍රන්ථය . . . . . . . . . 75

දෙවන උපග්‍රන්ථය . . . . . . . . 85

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . . 86

# මෙම අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ.

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තීරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයනය කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවති.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයින් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයින්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්:** ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යැමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

# හැඳින්වීම

ඔබ මේ සූදානමින් සිටින්නේ උද්යෝගිමත් ආත්මික ගමනක් ආරම්භ කිරීමටය. මෙම අත්පොතේ පිටු අතර ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය උදෙසා වූ බලවත් අධිස්වභාවික සම්පතක් වන මැදහත්කමේ යාච්ඤාව පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇත.

මෙම අධ්‍යයනය තුළ දී මැදහත්කමේ යාච්ඤාව යනු කුමක්ද යන්නත් එය ඉෂ්ට කිරීම සඳහා පවරා දී ඇති බලවත් ආත්මික සම්පත් පාවිච්චි කරමින් එය කාර්ක්ෂමව සිදු කරන්නේ කෙසේද යන්නත් ඔබ ඉගෙන ගනු ඇත. යාච්ඤා කළ යුත්තේ මොනවා උදෙසාද, මැදහත්කමේ යාච්ඤාවට ඇති බාධාවන් ජය ගන්නේ කෙසේද හා ආරම්භ කර දිගටම කරගෙන යන්නේ කෙසේද යන්න ඔබ ඉගෙන ගනු ඇත.

ඔබේ ආත්මික ජීවිතය හා සේවය අනිවාර්යෙන්ම වෙනස් වනු ඇත. මෙම අනගි අධිස්වභාවික ගමනාන්තය වෙත ඔබේ ගමන ආරම්භ කිරීමට ඔබ සූදානම්ද?

*ක්ෂණිකව සම්පූර්ණ පෙනීම ලැබීම සඳහා*
*ඔබට අන්ධ මිනිසුන්ගේ දෑස් ස්පර්ශ කළ හැකි ස්ථානයක් තිබේ*
*රාත්‍රිය නමැති දම්වැල්වලින් බැඳ මරණාසන්නව සිටින වහලුන්ට*
*"නැගිටින්න!" යැයි පැවසිය හැකි ස්ථානයක් තිබේ.*

*රැස්කර ඇති රත්තරන් වෙත ළඟා වී*
*දෙවියන්වහන්සේ උදෙසා ඔබට ඒවා නිදහස් කළ හැකි ස්ථානයක් තිබේ*
*යම් දුරකින් එහා ස්ථානයක් තිබේ*
*එතනට ඔබට සේවකයන් හා වචනය යැවිය හැකිය*
*ඔබගේ අයාචනයන්ට පිළිතුරක් ලෙස*
*ස්වර්ගීය බලය ක්‍රියාත්මක වන ස්ථානයක් තිබේ.*

*දෙවියන්වහන්සේම ඔබ උදෙසා බැස ඇවිත් සටන් කරන,*
*ස්ථානයක්-නියමිත නිහඬ පැයක් තිබේ,*
*එම රහසිගත ස්ථානය කොහිද? ඒ කොහිදැයි ඔබ නොඅසන්නේද?*
*අහෝ ආත්මය, එය යාච්ඤාව නම් රහසිගත ස්ථානයයි!*

-රචකයා නොදනී-

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින්:

- යාච්ඤාව නිර්වචනය කිරීමට
- යාච්ඤාවට පිළිතුරු ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය තුළ යාච්ඤාවේ භූමිකාව සාරාංශ ගත කිරීමට
- යාච්ඤාවේ මට්ටම් හඳුනාගැනීමට
- විවිධාකාර යාච්ඤා ක්‍රම හඳුනාගැනීමට
- මැදහත්කමේ යාච්ඤාව නිර්වචනය කිරීමට
- මැදහත්කරුවකු ලෙස ඇදහිලිවන්තයෙකුගේ සේවය පිළිබඳ බයිබලීය පදනම පැහැදිලි කිරීමට
- අපගේ මැදහත්කාරකමේ ආදර්ශය ලෙස යේසුස්වහන්සේ හඳුනාගැනීමට
- මැදහත්කාරකම සිදු කෙරෙන ආකාරය විස්තර කිරීමට
- මැදහත්කාරකම වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කිරීමට
- පවරා දී ඇති බලය හා ආධිපත්‍යය, බැඳීම හා නිදහස්කිරීම, යේසුස්වහන්සේගේ නාමය, යේසුස්වහන්සේගේ ලේ හා නිරාහාරය ද ඇතුළුව මැදහත්කම සඳහා වූ ආත්මික සම්පත් පාවිච්චි කිරීමට
- මැදහත්කම් කරන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ මැදහත්කමක් උදෙසා වූ ප්‍රතිපත්ති සාරාංශගත කිරීමට
- මැදහත්කම් කළ යුත්තේ මොනවා උදෙසාදැයි හඳුනාගැනීමට
- මැදහත්කම සඳහා දෙවියන්වහන්සේගේ පොරොන්දු පාවිච්චි කිරීමට
- බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් උදෙසා වූ බාධාවන් හඳුනාගැනීම හා ඒවා ඉවත් කිරීම
- යාච්ඤා නොකළ යුතු අවස්ථා දැන ගැනීමට
- ආදර්ශ යාච්ඤා සඳහා බයිබල් කොටස් සැපයීමට
- ස්වාමින්වහන්සේගේ යාච්ඤාව සැබවින්ම මැදහත්කමේ යාච්ඤාවක් වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- ආදර්ශ යාච්ඤාව මතකයෙන් පැවසීමට
- මැදහත්කම සඳහා මාර්ගෝපදේශකයක් ලෙස ආදර්ශ යාච්ඤාව පාවිච්චි කිරීමට
- පිබිදීම නිර්වචනය කිරීමට
- අපට පිබිදීම සඳහා සූදානම්විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- පිබිදීමක් අවශ්‍ය වන්නේ කවර අවස්ථාවේදී ද යන්න හඳුනාගැනීමට
- පසුබටවීමේ ඇති අවස්ථාවන් හඳුනාගැනීමට
- පිබිදීම උදෙසා වූ බයිබලීය ප්‍රතිපත්ති සාරාංශගත කිරීමට
- පිබිදීම උදෙසා වූ බාධාවන් හඳුනාගැනීමට
- පිබිදීම උදෙසා මැදහත්කම් කිරීම සඳහා “දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැලැස්ම” පාවිච්චි කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- සංවිධානය කරන ලද යාච්ඤාවන් සඳහා සැලැස්මක් සෑදීමට
- පෞද්ගලික යාච්ඤා අත්පොතක් සෑදීමට
- අන්තර්ජාතික මැදහත්කමට සහභාගී වීමට
- ආරම්භ කිරීමට හා දිගින් දිගටම පවත්වාගෙන යාමට ඇති ගැටලු හා ඒවාට විසඳුම හඳුනාගැනීමට
- මැදහත්කමේ සේවය සඳහා ඔබ කැප වීම ඔබට හැකිවනු ඇත.

# පළමුවන පරිච්ඡේදය

## යාච්ඤාව සඳහා හැඳින්වීමක්

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- යාච්ඤාව නිර්වචනය කිරීමට,
- යාච්ඤාවට පිළිතුරු ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය තුළ යාච්ඤාවේ භූමිකාව සාරාංශගත කිරීමට
- යාච්ඤාවේ මට්ටම් හඳුනාගැනීමට
- විවිධ ආකාරයන් යාච්ඤාවන් හඳුනාගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ, සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ. තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටුකරන්නාට දොර හරිනු ලැබ්. (මතෙව් 7:7-8)**

### හැඳින්වීම

මෙම පරිච්ඡේදය යාච්ඤාව නමැති විෂය හඳුන්වා දෙයි. යාච්ඤාවේ නිර්වචනය හා යේසුස්වහන්සේ එයට ලබාදුන් වැදගත්කම ඔබ ඉගෙන ගනු ඇත. යාච්ඤාවට පිළිතුරු ලැබෙන ආකාරය හා යාච්ඤාවේ විවිධ මට්ටම් හා වර්ග ඔබ ඉගෙන ගනු ඇත.

### යාච්ඤාව පිළිබඳ නිර්වචනය

යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමග සන්නිවේදනය කිරීමයි. එය විවිධ ආකාර ගනී. නමුත් මූලිකවම එය සිදුවන්නේ මිනිසා දෙවියන්වහන්සේ සමග හා දෙවියන්වහන්සේ මිනිසා සමග කතා කරන විටය. යාච්ඤාව පහත පරිදි විස්තර කර තිබේ.

| | |
|---|---|
| දෙවියන්වහන්සේගේ නම කියා හඬගැසීම | උත්පත්ති 12:8 |
| දෙවියන්වහන්සේට මොරගැසීම | ගීතාවලිය 27:7, 34:6 |
| දෙවියන්වහන්සේ වෙතට ළඟාවීම | ගීතාවලිය 73:28, හෙබ්‍රෙව් 10:22 |
| ඉහළ බැලීම | ගීතාවලිය 5:3 |
| ආත්මය එසැවීම | ගීතාවලිය 25:1 |
| හදවත එසැවීම | විලාප ගී 3:41 |
| හදවත වැගිරීම | ගීතාවලිය 62:8 |
| ආත්මය වැගිරීම | 1 සාමුවෙල් 1:15 |
| ස්වර්ගයට මොරගැසීම | 2 ලේකම් 32:20 |
| ස්වාමින්වහන්සේට කන්නලව්කිරීම | නික්මයාම 32:11 |
| දෙවියන්වහන්සේව සෙවීම | යෝබ් 8:5 |
| ස්වාමින්වහන්සේගේ මුහුණ සෙවීම | ගීතාවලිය 27:8 |
| ආයාචනා කිරීම | යෝබ් 8:5, යෙරමියා 36:7 |

යාච්ඤාව යනු, දෙවියන්වහන්සේට කතා කිරීම පමණක් නොවේ. නමුත් දෙවියන්වහන්සේට සවන් දීමද අන්තර්ගත වේ. යාච්ඤාව යනු සන්නිවේදනය වන අතර එක් පාර්ශවයකින් පමණක් සිදුවන කතා බහක් වැඩි කාලයක් පවතින්නේ නැත. ඔබ යාච්ඤා කරන විට, දෙවියන්වහන්සේ ඔබට කතා කරනු ඇතැයි බලාපොරොත්තු වන්න. බොහෝ වේලාවන්හි දී උන්වහන්සේ මෙය තම වචනය තුළින් හෝ ඔබේ හදවතට "කතා කරන" "සිහින් හඬක්" මගින් සිදු කරනු ඇත. ඇතැම් විට උන්වහන්සේ ඔබට

දර්ශනයක් දීම හෝ ඔබ ඔබගේ ස්වර්ගික භාෂාවෙන් කරන ලද යාච්ඤාව ඔබේ හදවතට තේරුම් කරදීම සිදු කරනු ඇත.

හදිස්සියෙන් ඔබේ ඉල්ලීම් දෙවියන්වහන්සේ ඉදිරියේ ගොඩගසා ඔබේ යාච්ඤාව අවසන් නොකරන්න. උන්වහන්සේට ඔබට කතා කිරීමට කාලය දෙන්න. උන්වහන්සේ ඔබේ ප්‍රශ්න වලට පිළිතුරුද, ඔබ ඉදිරියේ ඇති දවසට අවශ්‍ය මඟපෙන්වීමද, ඔබේ ප්‍රමුඛතාවයන් පිළිවෙළකට සකස් කිරීමට ඔබට උපකාරද වනු ඇත. ඇතැම් විට ඔබ මැදහත්කම් කරන කෙනෙකු සමග බෙදා ගැනීමට ධෛර්යවත් කිරීමේ විශේෂ පණිවුඩයක් උන්වහන්සේ ඔබට දෙනු ඇත.

ඔබ යාච්ඤා කරන විට, ඒ සඳහා අනුමත ඉරියව්වක් නැත. ඔබට පහත ඕනෑම ආකාරයකින් සිට යාච්ඤා කළ හැක:

| | |
|---|---|
| සිටගෙන: | 1 රාජාවලිය 8:22, මාර්ක් 11:25 |
| වැඳ වැටී: | ගීතාවලිය 95:6 |
| දණ නමා: | 2 ලේකම් 6:13, ගීතාවලිය 95:6, ලූක් 22:41, ක්‍රියා 20:36. |
| මුහුණින් වැටී: | ගණන්කථාව 16:22, යෝෂුවා 5:14, 1 රාජාවලිය 21:16, මතෙව් 26:39 |
| ඔබේ දෑත් දිගුකරමින්: | යෙසායා 1:15, 2 ලේකම් 6:13 |
| ඔබේ දෑත් ඔසවමින්: | ගීතාවලිය 28:2, විලාප ගී 2:19, 1 තිමෝති 2:8 |

## යාච්ඤාවට පිළිතුරු ලැබෙන ආකාරය

පහත ආකාරයන්ගෙන් යාච්ඤාවන්ට පිළිතුරු ලැබෙන බව බයිබලය එළිදරව් කරයි.

| | |
|---|---|
| ක්ෂණිකව ඒ වේලාවේදීම: | යෙසායා 65:24, දානියෙල් 9:21-23 |
| ඇතැම්විට ප්‍රමාද වී: | ලූක් 18:7 |
| අපගේ ආශාවන්ගෙන් වෙනස් වේ: | කොරින්ති 12:8-9 |
| අපගේ බලාපොරොත්තු වලටත් ඉහළින්: | යරමියා 33:3, එපීස 3:20 |

## යේසුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය

යාච්ඤාව ස්වාමිවූ යේසුස්වහන්සේට වැදගත් වූ බැවින් එය අපට ද වැදගත් විය යුතුය. යේසුස්වහන්සේ අපගේ මැදහත්කමේ යාච්ඤාවේ ශ්‍රේෂ්ඨ ආදර්ශයයි. යේසුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය පිළිබඳ පහත බයිබල් කොටස් එකින් එක අධ්‍යයනය කරන්න.

**යේසුස්වහන්සේ යාච්ඤාවට ප්‍රමුඛ ස්ථානයක් දුන් සේක:**

| | |
|---|---|
| - උන්වහන්සේ දිවා රාත්‍රි දෙකේදීම ඕනෑම වේලාවක යාච්ඤා කළ සේක | ලූක් 6:12-13 |
| - යාච්ඤාව කෑමටත් වඩා වැදගත් විය: | යොහන් 4:31-32 |
| - යාච්ඤාව වැඩවලට වඩා වැදගත් විය: | යොහන් 4:31-32 |
| - උන්වහන්සේ තම ගෝලයන්ට යාච්ඤාව ඉගැන්වූ සේක: | මතෙව් 6:9-13 |

**උන්වහන්සේගේ ජීවිතයේ ඕනෑම වැදගත් අවස්ථාවකදීම යාච්ඤාව පැවතුනි:**

| | |
|---|---|
| - උන්වහන්සේගේ බව්තිස්මයේදී: | ලූක් 3:21-22 |
| - පළමු ධර්මදූත ගමන තුළදී: | මාර්ක් 1:35, ලූක් 5:16 |
| - ගෝලයන් තෝරාගැනීමට පෙර: | ලූක් 6:12-13 |
| - 5,000කට කන්න දීමට පෙර/පසු: | මතෙව් 14:19,23, මාර්ක් 6:41,46, යොහන් 6:11, 14-15. |
| - 4,000 කට කන්න දීමේදී: | මතෙව් 15:36, මාර්ක් 8:6,7 |
| - පේත්‍රුස් උන්වහන්සේ කවුද,යි ප්‍රකාශ කිරීමට පෙර: | ලූක් 9:18 |
| - අන්වෙසක් වීමට පෙර: | ලූක් 9:28, 29 |

| | |
|---|---|
| - සැත්තැදෙනා නැවත පැමිණීමේදී: | මතෙව් 11:25, ලූක් 10:21 |
| - ලාසරස්ගේ සොහොන ළඟදී: | යොහන් 11:41-42 |
| - ළමයින්ට ආශිර්වාද කරන විට: | මතෙව් 19:13 |
| - සමහර ග්‍රීකයෝ පැමිණි විට | යොහන් 12:27-28 - - |
| - පේත්‍රුස් උදෙසා: | ලූක් 22:32 |
| - ශුද්ධාත්මයාණන්වහන්සේ ලබාදීම උදෙසා: | ලූක් 14: 16 |
| - එම්මාවුස් ගමනේදී: | ලූක් 24:30-31 |
| - ස්වර්ගාරෝහණයට පෙර: | ලූක් 24:50-53 |
| - තම අනුගාමිකයන් උදෙසා: | යොහන් 17 |
| - තම විශාලතම සෝදිසිකිරීමට පෙර: | මතෙව් 26:26-27, මාර්ක් 14:22-23, ලූක් 22:17-19, |

## යාච්ඤාවේ මට්ටම

ප්‍රබලත්වය අනුව යාච්ඤාවේ මට්ටම් තුනකි: ඉල්ලීම, සෙවීම හා තට්ටුකිරීම

> **ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ, සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ. තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ. සොයන්නාට සම්බවේ. තට්ටුකරන්නාට දොර හරිනු ලැබි. (මතෙව් 7:7-8)**

ඉල්ලීම යාච්ඤාවේ පළමු මට්ටමයි. එය සරලව දෙවියන්වහන්සේට ඉල්ලීමක් ඉදිරිපත් කර ක්ෂණික පිළිතුරක් ලැබීමයි. ලබාගැනීම සඳහාවූ කොන්දේසිය ඉල්ලීමයි.

> **...නුඹලා නොඉල්ලන බැවින් නුඹලාට නොලැබෙන්නේය (යාකොබ් 4:2)**

සෙවීම යනු, යාච්ඤාවේ වඩා ගැඹුරු මට්ටමකි. මෙය ඉල්ලීමේ මට්ටමේ තරමට ක්ෂණික ලෙස පිළිතුරු නොලැබෙන යාච්ඤාවේ මට්ටමකි. උඩුමහල් මැදුරේ රැස්වූ 120 දෙනා නොනවත්වා යාච්ඤා කිරීම සෙවීම සඳහා උදාහරණයකි. මෙම පුරුෂයන් හා කාන්තාවන් ශුද්ධාත්මයාණන් එවීම පිළිබඳ පොරොන්දුව සම්පූර්ණ වීම සෙවූ අතර, පිළිතුර ලැබෙනතුරු නොනවත්වා සෙවූවෝය (ක්‍රියා 1-2).

තට්ටු කිරීම ඊටත් ගැඹුරු මට්ටමකි. මෙය පිළිතුරු ලැබීමට දිගු කාලයක් ගතවන විට නොනවත්වා කෙරෙන යාච්ඤාවකි. ලූක් 11:5-10 හි යේසුස්වහන්සේ පැවසූ උපමාවේ මෙය පෙන්නුම් කෙරේ. දෙවියන්වහන්සේගෙන් පිළිතුරු ලැබීම සාතන් විසින් බාධා කර ඇති විට තමා කිසිඳු දෘෂ්‍යමාන ප්‍රතිඵලයක් නොදුටුව ද දානියෙල් නොනවත්වා "තට්ටු කිරීම" මගින් ද මෙය නිරූපණය කෙරේ (දානියෙල් 10).

## යාච්ඤාවේ වර්ග

පාවුල් හැමවිටම "සියලු යාච්ඤා" වලින් යාච්ඤා කරන ලෙස ඇදහිලිවන්තයන්ට පැවසුවේය (එපීස 6:18). මෙයින් දැක්වෙන්නේ පහත සඳහන් ආකාරයේ විවිධ යාච්ඤාවන්ය.

**1. නමස්කාරය හා ප්‍රශංසාව**

ඔබ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ඇතුළු වන්නේ නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙන්ය.

> **ස්තුතිකරමින් උන්වහන්සේගේ දෙරටුවලින් ඇතුල්ව, ප්‍රශංසාකරමින් උන්වහන්සේගේ මණ්ඩපවලට පැමිණෙව්. උන්වහන්සේට ස්තුතිදෙමින් උන්වහන්සේගේ නාමයට ප්‍රශංසාකරව්. (ගීතාවලිය 100:4)**

නමස්කාරය යනු ගෞරවය හා භක්තිය දීමය. ප්‍රශංසාව යනු දෙවියන්වහන්සේ කර ඇති දේවල් වලට පමණක් නොව උන්වහන්සේගේ ස්වභාවය ගැන ස්තුතිදීම හා කෘතගුණ දැක්වීම වේ. ඔබ ආත්මයෙන්ද සත්‍යයෙන්ද දෙවියන්වහන්සේට නමස්කාර කළ යුතුය.

**නුමුත් සැබෑ නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද පියාණන්වහන්සේට නමස්කාර කරන කාලය පැමිණෙන්නේය. දැනටම පැමිණ තිබේ. මක්නිසාද පියාණන්වහන්සේ තමන්ට නමස්කාරකරන්නන් වන පිණිස එබඳුවුවන් සොයන සේක. දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාරකරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑකමෙන්ද නමස්කාර කළ යුතුයයි කීසේක. (යොහන් 4:23-24)**

සත්‍යයෙන් දෙවියන්වහන්සේට නමස්කාර කිරීම යනු, දේව වචනයේ එළිදරව් කර ඇති දේවල් මත පදනම්ව ඔබ උන්වහන්සේ නමස්කාර කිරීමයි. ආත්මයෙන් උන්වහන්සේට නමස්කාර කිරීම යනු උන්වහන්සේ අන් සියල්ලටම වඩා ඉහළින් තබමින් ඔබගේ අභ්‍යන්තරයෙන්ම ශුද්ධාත්මයන්ගේ බලය තුළින් ඉතා අවංකව නමස්කාර කිරීමයි. ඔබ ආත්මයෙන් නමස්කාර කරන විට ඔබ ඔබේ නමස්කාරයට මඟපෙන්වීමට ශුද්ධාත්මයාණන්ට ඉඩ හරී. ඔබ නමස්කාරය සඳහා මිනිසා විසින් නිර්මාණය කළ ක්‍රමවේද හෝ පිළිවෙත් පාවිච්චි කරන්නේ නැත. ඔබ ඔබේ මනස වෙනත් තැනක තබා ගෙන ගීතිකා හෝ යාච්ඤා පැවසීම පමණක් කරන්නේ නැත.

ඒ වෙනුවට ඔබ ඔබේ හදවතේ හා මනසේ ගැඹුරු අභ්‍යන්තරය විවර කර, ඔබගේම වචනයෙන් උන්වහන්සේට ප්‍රශංසාවන් හා නමස්කාරය ගෙන එයි. ඇතැම්විට ශුද්ධාත්මයාණන්වහන්සේ සියල්ල භාරගනු ඇති අතර ඔබ ඔබගේ යාච්ඤා භාෂාවේ "අන්‍ය භාෂා" වලින් නමස්කාර කරනු ඇත.

ප්‍රශංසාව හා නමස්කාරය සමග පහත දේවල්ද පැවතිය හැකිය:

| | |
|---|---|
| ගීතිකා ගැයීම: | ගීතාවලිය 9:2,11, 40:3, මාර්ක් 14:26 |
| ඇසෙන ප්‍රශංසාවන් : | ගීතාවලිය 103:1 |
| කෑගැසීම : | ගීතාවලිය 47:1 |
| අත් එසැවීම: | ගීතාවලිය 63:4, 134:2, 1 තිමෝති 2:8 |
| අත්පොළසන් දීම: | ගීතාවලිය 47:1 |
| සංගීත භාණ්ඩ: | ගීතාවලිය 105:3-5 |
| සිටගෙන සිටීම: | 2 ලේකම් 20:19 |
| වැඳ වැටීම: | ගීතාවලිය 95:6 |
| නැටීම: | ගීතාවලිය 149:3 |
| දණනැමීම: | ගීතාවලිය 95:6 |
| වැතිර සිටීම: | ගීතාවලිය 149:5 |

**2. කැපකිරීම**

මෙය ඔබේ ජීවිතය හා කැමැත්ත දෙවියන්වහන්සේට කැපකිරීමේ යාච්ඤාවයි. මේ තුළ දෙවියන්වහන්සේට උන්වහන්සේගේ ක්‍රියාවට හා උන්වහන්සේගේ අරමුණුවලට භාරවීමේ හා කැපවීමේ යාච්ඤාවන්ද අන්තර්ගත වේ.

**3. අයැදීම**

අයැදීමේ යාච්ඤාවන් යනු ඉල්ලීම්ය. ඉල්ලීම් කළ යුත්තේ දේව වචනය තුළ එළිදරව් කර ඇති දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව වේ. අයදීම ඉල්ලීම, සෙවීම හෝ තට්ටුකිරීම යන මට්ටම් වලින් සිදු විය හැකිය. කන්නලව්කිරීමද මේ ආකාරයේ යාච්ඤාව සඳහා යොදා ගත හැකි තවත් වචනයකි. කන්නලව් කිරීම යන වචනයේ අර්ථය "දෙවියන්වහන්සේට ආයාචනා කිරීම හෝ කිසියම් අවශ්‍යතාවයක් උදෙසා උන්වහන්සේගෙන් තදින් ඉල්ලා සිටීමයි".

**4. පාපොච්චාරණය හා පසුතැවිලිවීම**

පාපොච්චාරණය කිරීමේ යාච්ඤාවක් යනු පසුතැවිලිවීම හා පාපයට සමාව අයදීමයි.

**අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටින සේක. (1 යොහන් 1:9)**

## 5. මැදහත්කම

මැදහත්කම යනු අන්‍යයන් උදෙසා යාච්ඤා කිරීමයි. මැදහත්කරුවකු යනු වෙන කෙනෙකුගේ ස්ථානයක් ගන්නා හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් ඉල්ලීමක් කරන්නාය. මෙම අත්පොතේ ඉතිරි කොටසේ අවධානය යොමුවන්නේ මේ ආකාරයේ යාච්ඤාව කෙරෙහිය.

# ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. යාච්ඤාව නිර්වචනය කරන්න.

3. යාච්ඤාවට පිළිතුරු ලැබෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

4. යේසුස්වහන්සේගේ ජීවිතය තුළ යාච්ඤාවේ භූමිකාව සාරාංශගත කරන්න.

5. මෙම පරිච්ඡේදය තුළ විස්තර කරන ලද යාච්ඤාවේ මට්ටම් හඳුනාගෙන නිර්වචනය කරන්න.

6. මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද යාච්ඤාවේ ආකාර පහ පිළිබඳව කෙටි විස්තරයක් ලියන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යනය සඳහා

1. ලෝකයේ මහද්වීප උදෙසා යාච්ඤා කිරීමට ඔබට උපකාර කරන යාච්ඤා මඟපෙන්වීමක් පහත දැක්වේ

| | | |
|---|---|---|
| සඳුදා | : | ආසියාව උදෙසා යාච්ඤා කරන්න |
| අඟහරුවාදා | : | යුරෝපය උදෙසා යාච්ඤා කරන්න |
| බදාදා | : | අප්‍රිකාව උදෙසා යාච්ඤා කරන්න |
| බ්‍රහස්පතින්දා | : | උතුරු ඇමෙරිකාව උදෙසා යාච්ඤා කරන්න |
| සිකුරාදා | : | ලතින් ඇමෙරිකාව උදෙසා යාච්ඤා කරන්න |
| සෙනසුරාදා | : | දූපත් උදෙසා යාච්ඤා කරන්න |
| ඉරිදා | : | මුළු ලෝකයම උදෙසා යාච්ඤා කරන්න |

2. පහත සඳහන් බයිබල් පද නැවත කියවා විවිධ ඉරියව් වලින් යාච්ඤා කරමින් පරීක්ෂා කර බලන්න.

| | | |
|---|---|---|
| සිටගෙන | : | 1 රාජාවලිය 8:22, මාර්ක් 11:25 |
| වැඳවැටී | : | ගීතාවලිය 95:6 |
| දණනමා | : | 2 රාජාවලිය 6:13, ගීතාවලිය 95:6, ලූක් 22:41, ක්‍රියා 20:36 |
| ඔබේ මුහුණින් වැටී | : | ගණන්කථාව 16:22, යෝෂුවා 5:14, 1 ලේකම් 21:16, මතෙව් 26:39 |
| ඔබේ දෑත් දිගහැර | : | යෙසායා 1:15, 2 ලේකම් 6:13 |
| දෑත් ඔසවමින් | : | ගීතාවලිය 28:2, විලාප ගී 2:19, 1 තිමෝති 2:8 |

3. පහත සඳහන් බයිබල් පද නැවත කියවා බයිබලයේ සඳහන් විවිධ ආකාර වලින් ප්‍රශංසා හා නමස්කාර කිරීම අත්හදා බලන්න.

| | | |
|---|---|---|
| ගීතිකා ගැයීම | : | ගීතාවලිය 9:2. 11, 40:3, මාර්ක් 14:26 |
| ඇසෙන ප්‍රශංසාවන් | : | ගීතාවලිය 103:1 |
| කෑගැසීම | : | ගීතාවලිය 47:1 |
| අත් එසැවීම | : | ගීතාවලිය 63:4, 134:2, 1 තිමෝති 2:8 |
| අත්පොළසන් දීම | : | ගීතාවලිය 47:1 |
| සංගීත භාණ්ඩ | : | ගීතාවලිය 105:3-5 |
| සිටගෙන සිටීම | : | 2 ලේකම් 20:19 |
| වැඳ වැටීම | : | ගීතාවලිය 95:6 |
| නැටීම | : | ගීතාවලිය 149:3 |
| දණ නැමීම | : | ගීතාවලිය 95:6 |
| වැතිර සිටීම | : | ගීතාවලිය 149:5 |

# දෙවන පරිච්ඡේදය

# මැදහත්කමේ යාච්ඤාව

**අරමුණු:**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- මැදහත්කමේ යාච්ඤාව නිර්වචනය කිරීමට
- මැදහත්කරුවකු ලෙස ඇදහිලිවන්තයෙකුගේ සේවය පිළිබඳ බයිබලීය පදනම පැහැදිලි කිරීමට
- අපගේ මැදහත්කාරකමේ ආදර්ශය ලෙස යේසුස්වහන්සේ හඳුනාගැනීමට
- මැදහත්කාරකම් සිදු කෙරෙන ආකාරය පැහැදිලි කිරීමට
- මැදහත්කාරකම වැදගත්වන්නේ ඇයිදැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය**

> **එබැවින්, උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන. (හෙබ්‍රෙව් 7:25)**

## හැඳින්වීම

**මැදහත්කම** යනු අන්‍යයන් උදෙසා යාච්ඤා කිරීම බව ඔබ පසුගිය පාඩමේදී ඉගෙන ගත්තේය. **මැදහත්කම් කරන්නා** යනු වෙනත් කෙනෙකු උදෙසා පෙනී සිටින හෝ වෙනත් කෙනෙකු වෙනුවෙන් ඉල්ලීමක් කරන්නාය. ඔබ මේ ආකාරයෙන් යාච්ඤා කරන විට, ඔබ **මැදහත්කාරකම් කරන්නේය:**

> *"කිසියම් කෙනෙකු, දෙවියන්වහන්සේගේ මැදහත්වීම දැඩි ලෙස අවශ්‍ය කරන වෙනත් පුද්ගලයෙකු හෝ පුද්ගලයන් කීපදෙනෙකු උදෙසා දෙවියන්වහන්සේට ආයාචනා කරන ශුද්ධ ඇදහිල්ලෙන්, දැඩි උත්සාහයෙන් කරන යාච්ඤාවක් ලෙස මැදහත්කම නිර්වචනය කළ හැකිය" (full life Bible)*

මෙම අත්පොතේ ඉතිරි කොටසින් අවධානය යොමු කරන්නේ මේ ආකාරයේ යාච්ඤාව පිළිබඳවය. මෙම පාඩමේදී මැදහත්කම පිළිබඳ බයිබලීය පදනම හා මැදහත්කම පිළිබඳ අපගේ ආදර්ශය වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇත. එසේම මැදහත්කම් කරන්නේ කෙසේද හා එය සේවයේදී වැදගත්වන්නේ කෙසේද යන්න ද ඔබ ඉගෙන ගනු ඇත.

## මැදහත්කම පිළිබඳ බයිබලීය පදනම

නව ගිවිසුම් ඇදහිලිවන්තයෙකුගේ මැදහත්කමේ සේවය පිළිබඳ බයිබලීය පදනම නම්, දෙවියන්වහන්සේ සඳහා පූජකයන් ලෙස අපට ඇති කැඳවීම වේ. අප ශුද්ධ වූ පූජකවංශයක් (1 පේත්‍රුස් 2:5), රාජකීය පූජකවංශයක් (1 පේත්‍රුස් 2:9), හා දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ පූජකයන් (එළිදරව් 1:6) බව දේව වචනය ප්‍රකාශ කරයි.

මෙම පූජකයෙකු ලෙස මැදහත්කම් කිරීමේ කැඳවීම තේරුම් ගැනීමේ පසුබිම හමුවන්නේ ලෙවී පූජකවංශය පිළිබඳ පැරණි ගිවිසුමේ ඇති නිදර්ශනයෙන්ය. පූජකයෙකුගේ වගකීම වූයේ **ඉදිරියේ** හා **අතරමැද** සිට ගැනීම වේ. පූජාවන් හා දීමනා වලින් දෙවියන්වහන්සේට මෙහෙකිරීම සඳහා ඔහු උන්වහන්සේ ඉදිරියේ සිටගත්තේය. එසේම ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේ හා පාපී මිනිසා එක් කිරීම උදෙසා රුධිර පූජාව සිදු වන ස්ථානයේදී පූජකයා ඔවුන් දෙදෙනා අතරද සිටගත්තේය.

පැරණි ගිවිසුමේ පූජකයෙකු හා නව ගිවිසුමේ පූජකයකු අතර වෙනස හෙබ්‍රෙව් 7:11-19 හි දැක්වේ. පැරණි ගිවිසුමේ ලෙවීගේ පූජකවංශය ලෙවී ගෝත්‍රයෙන් පැවත එන අයට පරම්පරාවෙන් පරම්පරාවට හිමි විය. මෙහි සඳහන් "මෙල්කිසදෙක්ගේ පූජකවංශය" නම්, ස්වාමිවූ යේසුස්වහන්සේ උත්තම පූජකයා කොටගත් ආත්මික පූජකයන්ගේ "නව පිළිවෙළයි". එය අප වෙතට ලැබෙන්නේ උන්වහන්සේගේ රුධිරය හා ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවියෙකු ලෙස අප ලබන නැවත ඉපදීම තුළින් වේ.

## ආදර්ශ මැදහත්කරුවාණෝ

යේසුස්වහන්සේ මොලොවට එවීමේ දෙවියන්වහන්සේගේ අරමුණ, උන්වහන්සේ මැදහත්කරුවකු වශයෙන් සේවය කිරීම බව බයිබලය සඳහන් කරයි.

> **උන්වහන්සේද කිසිවෙක් නැති බව දැක, මැදහත්කාරයෙක් නැති බැවින් පුදුමවූසේක. ඒ නිසා උන්වහන්සේගේම බාහුව තමන්වහන්සේට ගැළවීම ගෙනායේය. උන්වහන්සේගේම ධර්මිෂ්ඨකම උන්වහන්සේව ඉසුලුවේය. (යෙසායා 59:16)**

පැරණි ගිවිසුමේ පූජකයන් සිදු කළ ලෙසම, යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ ඉදිරියේ සහ උන්වහන්සේත් පව්කාර මනුෂ්‍යයාත් අතරමැද සිටගත් සේක.

> **මක්නිසාද ඇත්තේ එක දෙවිකෙනෙක් සහ දෙවියන්වහන්සේටත් මනුෂ්‍යයන්ටත් අතරේ එක මැදහත්කාර කෙනකුත්ය. (1 තිමෝති 2:5)**
>
> **මැරුණෙත්, ඒ ඇර මළවුන්ගෙන් නැගුටුවනු ලැබුවෙත්, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි සිට අප උදෙසා මැදහත්කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය. (රෝම 8:34)**
>
> **බැවින්, උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ නිරතුරුවම ජීවත්වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන. (හෙබ්‍රෙව් 7:25)**

පාපය උදෙසා තම රුධිර පූජාව සිදු කළ ස්ථානයේදී යේසුස්වහන්සේ ධර්මිෂ්ඨ දෙවිඳුන්ව හා පාපී මනුෂ්‍යයාව එක් කළ සේක. පැරණි ගිවිසුමේදී අවශ්‍ය වූ ආකාරයට සතුන්ගේ රුධිරය තවදුරටත් අවශ්‍ය නොවේ. පාපයට සමාව දීම උදෙසා කල්වාරි කුරුසියේදී වගුරනු ලැබූ යේසුස්වහන්සේගේ රුධිරය මත පදනම්ව අපට දැන් දෙවියන්වහන්සේට ළඟා විය හැකිය. යේසුස්වහන්සේගේ රුධිරය නිසා ඔබට නිර්භයව බයාදුකමින් තොරව දෙවියන්වහන්සේ වෙත ළඟා විය හැකිය (හෙබ්‍රෙව් 4:14-16).

යේසුස්වහන්සේ මේ පොළොව මත සිටියදී උන්වහන්සේ මැදහත්කරුවකු විය. උන්වහන්සේ රෝගී හා යක්ෂ ආත්මවලට හසුවී සිටි අය උදෙසා යාච්ඥා කළ සේක. උන්වහන්සේ තම ගෝලයන් උදෙසා යාච්ඥා කළ සේක. උන්වහන්සේ තමන්වහන්සේ ගැන අදහන සියලු දෙනා ගැන මැදහත්කම් කිරීමේදී ඔබ උදෙසා ද යාච්ඥා කළ සේක. තම මරණයෙන් හා නැවත නැගිටීමෙන් අනතුරුව ස්වර්ගයට යන විටද යේසුස්වහන්සේ තම මැදහත්කම් කිරීමේ සේවය කරගෙන ගිය සේක. දැන් උන්වහන්සේ ස්වර්ගයෙහි අපගේ මැදහත්කරුවාණෝ ලෙස මෙහෙකරන සේක.

## මැදහත්කම් කරන ආකාරය

පැරණි ගිවිසුමේ පූජකයන්ගේ ක්‍රියාකාරකම් හා නවගිවිසුමේ යේසුස්වහන්සේගේ පිළිවෙත අනුගමනය කරන මැදහත්කරුවන් ලෙස, අප දෙවියන්වහන්සේ ඉදිරියේ හා ධර්මිෂ්ඨ දෙවියන්වහන්සේත් පාපී මිනිසාත් අතරමැද සිට ගනිමු. බලපෑමක් කළ හැකි ලෙස "අතරමැද" සිටගැනීම සඳහා මෙම භූමිකාව ඉටුකිරීමට අවශ්‍ය සමීප බව වර්ධනය කරගැනීම සඳහා අප මුලින්ම දෙවියන්වහන්සේ ඉදිරියේ සිටගත යුතුය.

ගණන් කථාව 14 යනු, බයිබලයේ සඳහන් වන ශ්‍රේෂ්ඨ මැදහත්කමේ යාච්ඥාවන්ගෙන් එකකි. මෝසෙස් දෙවියන්වහන්සේ "ඉදිරියේ" සිටගෙන උන්වහන්සේ සමග සමීප බවක් වර්ධනය කරගෙන තිබුණු බැවින් ඔහුට උන්වහන්සේ හා පාපී මිනිසුන් අතරමැද සිටගැනීමට හැකිවිය. දෙවියන්වහන්සේ අනෙකුත් ප්‍රොපේතවරු සමග කතා කළ පරිදි දර්ශන හා සිහින තුළින් නොව, මිතුරෙකු තවත් මිතුරෙකුට කතා කරන ලෙස දෙවියන්වහන්සේ මෝසෙස් සමග කතා කළ බව ගණන්කථාව 12:8 හි වාර්තා වේ.

නව ගිවිසුම් ඇදහිලිවන්තයන් ලෙස අප තවදුරටත් පැරණි ගිවිසුම කාලයේදී මෙන් සතුන් පූජා නොකරන්නෙමු. අප දෙවියන්වහන්සේ ඉදිරියේ සිටගන්නේ ප්‍රශංසාවේ ආත්මික පූජා (හෙබ්‍රෙව් 13:5) හා අපේම ජීවිත යාගයක් කොට (රෝම 12:1) ඔප්පු කිරීමටය. වෙනත් කෙනෙකු වෙනුවෙන් පෙනී සිටින්නෙකු හෝ මැදහත්කම් කරන්නෙකු ලෙස සේවය කරමින් අපට දෙවියන්වහන්සේ හා අන්‍යයන් "අතරමැද" සිටගත හැකිවන්නේ උන්වහන්සේ සමග ඇති මෙම සමීප සම්බන්ධතාවය පදනම් කොට ගෙන වේ.

මෙම පූජක සේවය විස්තර කිරීම සඳහා පේත්‍රුස් වචන දෙකක් පාවිච්චි කළේය. "ශුද්ධ වූ" හා "රාජකීය" වේ. දෙවියන්වහන්සේ ඉදිරියේ සිට ගැනීමට ශුද්ධකම අවශ්‍යය වේ (හෙබ්‍රෙව් 12:14). අපට එය කිරීමට හැකියාව ලැබෙන්නේ ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨකම මත පමණක් පදනම්ව වන අතර අපගේ ධර්මිෂ්ඨකම මත නොවේ. රාජකීයත්වය තුළින් විස්තර කෙරෙන්නේ "රාජකීය පවුලේ" සාමාජිකයන් ලෙස, දෙවියන්වහන්සේගේ සිංහාසනය වෙත යාමට අවසරය ඇතිව, කතා කිරීමට අපට පවරා දී ඇති රාජකීය ආධිපත්‍යයයි.

ඇතැම්විට මෙම පූජකයෙකු ලෙස මැදහත්කම් කිරීම තේරුම් ගැනීමක් ඇතිව කරනු ලැබේ. මෙය සිදුවන්නේ අප අපේම භාෂාවෙන් අන් අය උදෙසා මැදහත්කම් කරන විට වන අතර එවිට ඔබ පවසන්නේ කුමක්දැයි ඔබට වැටහේ.

> **ඉතින් අප විසින් සියලු ආකාර භක්තියෙන් සහ සන්සුන්කමින් සමාදානවූ නිශ්චල ජීවිතයක් ගතකරන පිණිස, රජවරුන් හා උසස් තනතුරු දරන සියල්ලන් ඇතුළුව, සියලු මනුෂ්‍යයන් උදෙසා ඉල්ලීම්ද යාච්ඤාද මැදහත්කමින්ද ස්තුතිදීම්ද පවත්වන්ට සියල්ලට පළමුවෙන් අවවාදකරමි. (1 තිමෝති 2:1-2)**

අනෙක් අවස්ථාවන්හිදී මැදහත්කම සිදුවන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළින්ය. එය දැඩි ආත්මික බරක් නිසා ඇතිවන කන්නලව්වක් සමග සිදු විය හැකිය. එසේම එය නොදන්නා භාෂාවකින් ද සිදුවිය හැකිය. මෙය සිදුවන විට, ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ යාච්ඤාව තුළින් දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව සෘජුවම උන්වහන්සේට කතා කරන සේක.

> **එලෙසම ආත්මයාණන්වහන්සෙත් අපගේ දුර්වලකම්වලදී උපකාරකරන සේක. මක්නිසාද යුතු ලෙස යාච්ඤාකරන්ට අපි නොදනිමුව, නමුත් ආත්මයාණන්වහන්සේම කිය නොහැකි කෙඳිරිගෑම්වලින් අප උදෙසා මැදහත්කම්කරන සේක. (රෝම 8:26)**
>
> **මක්නිසාද අන් භාෂාවකින් කථාකරන්නා මනුෂ්‍යයන්ට නොව දෙවියන්වහන්සේට කථාකරන්නේය. ඔහු ආත්මයෙන් රහස් කථාකරන නමුත් කාටවත් තේරෙන්නේ නැත. (1 කොරින්ති 14:2)**

මේ ආකාරයේ මැදහත්කමක් ඔබට ඔබගේ මනසින් තේරුම් ගත නොහැකි නමුත්, එය මැදහත්කමේ යාච්ඤාවේ ගැඹුරුම මට්ටම වන අතර එය "දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව" සිදු කෙරෙන බැවින් වඩාම බලපෑමක් කළ හැකි ආකාරයේ යාච්ඤාව ද වේ. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළින් ඔබ නොදන්නා භාෂාවකින් කරන යාච්ඤාවකට ඔබේ මනසින් හා කැමැත්තෙන් බලපෑමක් සිදු නොවේ.[1]

## මැදහත්කම් වැදගත්වන්නේ ඇයි

යේසුස්වහන්සේ තම සේවය තුළදී මැදහත්කමට දැක්වූ විශේෂත්වය නිසාම එය ඉතාම වැදගත් වේ. බලවත් මැදහත්කම තුළින් බලවත් ප්‍රතිඵල අත්දුටු මිනිසුන්ගේ හා කාන්තාවන්ගේ කතා පුවත් වලින් පිරුණු බයිබලීය වාර්තා තුළින් ද එහි වැදගත්කම එළිදරව් වේ.

බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කම් තුළින් ඔබට ආත්මිකව ලෝකයේ ඕනෑම තැනකට යාමේ හැකියාව ඇත. ඔබගේ යාච්ඤාවන්ට, ළඟාවිය නොහැකි ජාතීන්ට ඇතුළුව භූගෝලීය සංස්කෘතික හා දේශපාලනික බාධාවන් අබිබවා යා හැකි බැවින් එයට දුර පිළිබඳ කිසිදු සීමාවක් නොමැත. ඔබට තනි පුද්ගලයන්ගේ හා මුළු මහත් ජාතීන්ගේ ඉරණමට බලපෑම් කළ හැකිය. ඔබ යාච්ඤාවෙන් මැදහත්කම් කරන විට, ඔබට සැබවින්ම මිනිසුන්ගේ හා කාන්තාවන්ගේ පිරිමි හා ගැහැණු ළමයින්ගේ ජීවිත හා ආත්ම බේරා ගැනීමට උදව් කිරීමට හා දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය ලෝකය පුරා ගෙන යාමට හැකිය.

---

[1] අන්‍යභාෂා වලින් කතා කිරීම පිළිබඳ අතිරේක තොරතුරු සඳහා හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය" නම් වූ පාඨමාලාව බලන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. මැදහත්කමේ යාච්ඤාව නිර්වචනය කරන්න.

3. මැදහත්කරුවකු ලෙස ඇදහිලිවන්තයන්ගේ සේවය පිළිබඳ බයිබලීය පදනම පැහැදිලි කරන්න.

4. අපගේ මැදහත්කමේ ආදර්ශය කවුද?

5. මැදහත්කම සිදු කෙරෙන ආකාරය විස්තර කරන්න.

6. මැදහත්කම වැදගත් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

යොහන් 17 හි දැක්වෙන යේසුස්වහන්සේගේ යාච්ඤාව මැදහත්කමේ යාච්ඤාවන්ට අනර්ඝ උදාහරණයකි. පහත සටහන උපයෝගි කරගනිමින් මෙම යාච්ඤාව අධ්‍යනය කරන්න.

**යේසුස්වහන්සේ උන්වහන්සේ උදෙසා යාච්ඤා කළ සේක:** යොහන් 17:1-5

තමන්වහන්සේ උදෙසා වූ උන්වහන්සේගේ ඉල්ලීම් සාරාංශගත කරන්න.

______________________________________________

**යේසුස්වහන්සේ එවෙලෙහි සිටි තම ගෝලයන් උදෙසා යාච්ඤා කළ සේක:** යොහන් 17:6-19

එවෙලෙහි සිටි තම ගෝලයන් උදෙසා වූ උන්වහන්සේගේ ඉල්ලීම සාරාංශගත කරන්න.

______________________________________________

**යේසුස්වහන්සේ තම අනාගත ගෝලයන් උදෙසා යාච්ඤා කළ සේක.** යොහන් 17:20-23

උන්වහන්සේ තම අනාගත ගෝලයන් උදෙසා කළ නිශ්චිත ඉල්ලීම් ලියා දක්වන්න.

______________________________________________

**යේසුස්වහන්සේ තම යාච්ඤාව අවසන් කළ සේක:** යොහන් 17:24-26

යේසුස්වහන්සේ තම යාච්ඤාව අවසන් කළ ආකාරය සාරාංශගත කරන්න.

______________________________________________

උන්වහන්සේගේ නිශ්චිත ආශාව වූයේ කුමක්ද?

______________________________________________

උන්වහන්සේ තම අනුගාමිකයන්ට ප්‍රකාශ කළේ කුමක්ද?

______________________________________________

උන්වහන්සේට “ඔවුන් තුළ” තිබෙනු දැකීමට අවශ්‍ය වූයේ කුමක්ද? ______________________

# තුන්වන පරිච්ඡේදය

## මැදහත්කම උදෙසා වූ ආත්මික සම්පත්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- මැදහත්කම උදෙසා වූ ආත්මික සම්පත් හඳුනාගැනීමට හා පහත කරුණුද ඇතුළත්ව,
- පවරාදෙනු ලැබූ බලය හා ආධිපත්‍ය
- බැඳීම හා නිදහස් කිරීම
- යේසුස්වහන්සේගේ නාමය
- යේසුස්වහන්සේගේ රුධිරය
- නිරාහාරය
- මැදහත්කමේදී මෙම ආත්මික සම්පත් පාවිච්චි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **එකළ උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, (ලූක් 9:1)**

## හැඳින්වීම

අප කැඳවා ඇති මෙම මැදහත්කමේ සේවය සඳහා දෙවියන්වහන්සේ අනර්ඝ ආත්මික සම්පත් සපයා දී තිබේ. පවරා දෙනු ලැබූ බලය හා ආධිපත්‍යය, බැඳීම හා නිදහස්කිරීම, යේසුස්වහන්සේගේ නාමය, යේසුස්වහන්සේගේ රුධිරය හා නිරාහාරය යන කරුණු ද ඇතුළත්ව මෙම සම්පත් පිළිබඳව ඔබ මෙම පාඩමේදී ඉගෙන ගනු ඇත.

## පවරා දෙනු ලැබූ බලය සහ ආධිපත්‍යය

අප අපගේ යාච්ඤාවෙන් මැදහත්කම් කරන විට අප සැබවින්ම මිනිසුන්ගේ හා ස්ත්‍රීන්ගේ, පිරිමි සහ ගැහැණු ළමයින්ගේ ආත්ම උදෙසා, ජාතීන් උදෙසා හා ආත්මික හා දේශපාලන නායකයින් උදෙසා අපගේ සතුරා වන සාතන් සමඟ සටන් කරන්නෙමු. අප මෙය සිදු කරන්නේ අපේම හැකියාවෙන් හෝ ශක්තියෙන් නොවේ. එහෙත් යේසුස්වහන්සේ විසින් අපට පවරා දෙනු ලැබූ ආත්මික බලය හා ආධිපත්‍ය මත පදනම්ව වේ:

> **එකළ උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, (ලූක් 9:1)**

ආධිපත්‍ය හා බලය අතර වෙනසක් පවතී. පොලිස් නිළධාරියෙකු උදාහරණයක් ලෙස සළකා බලන්න. ඔහුට ඔහුගේ ආධිපත්‍යයේ සළකුණු වශයෙන් පදක්කම් හා නිල ඇඳුමක් තිබේ. ඔහුට ආධිපත්‍ය ලැබෙන්නේ රජයේ ඔහු දරණ තනතුර නිසාය. නමුත් සැම මිනිසෙකුම එම ආධිපත්‍යයට ගරු කරන්නේ නැති නිසා පොලිස් නිළධාරියා සතුව ආයුධයක්ද තිබෙන අතර එම අවිය ඔහුගේ බලයයි. සතුරාට එරෙහි ආධිපත්‍ය ඔබට ලැබෙන්නේ යේසුස්වහන්සේ තුළින් හා ඇදහිලිවන්තයෙකු ලෙස උන්වහන්සේ තුළ ඔබගේ තත්වය තුළිනි. සතුරාට එරෙහි බලය පැමිණෙන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ තුළිනි:

> **බලව, මම මාගේ පියාණන්වහන්සේගේ පොරොන්දුව නුඹලා වෙතට එවමි, නුමුත් ඉහළින් නුඹලා බලයෙන් සරසනු ලබන තුරු නුවර නැවතී සිටපල්ලායයි කීසේක (ලූක් 24:49).**

පොලිස් නිළධාරියා මෙන්, ඔබ සැබවින්ම සාතන් සමඟ ආත්මික සටනක් කරන බැවින්, මැදිහත්කමේදී බලපෑමක් ඇති කිරීමට ඔබට ආධිපත්‍ය හා බලය යන දෙකම තිබිය යුතුය. නැවත උත්පාදනය ලැබීමේ

අත්දැකීම හා ක්‍රිස්තුස්වහන්සේ තුළ තමන්ට හිමි තත්වය තුළින් ඇදහිලිවන්තයන්ට ආධිපත්‍ය ලැබෙන නමුත්, ඇතැම් අය බලපෑමක් කළ හැකි පරිදි මැදහත්කම් කිරීම සඳහා ආධිපත්‍ය සමඟ එකතු විය යුතු ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය කිසිදාක ලබාගන්නේ නැත.

සාතන්ට සීමිත බලයක් ඇති නමුත්, ඔහුට ආධිපත්‍යයක් නැත. යේසුස්වහන්සේ සතුරාගේ සියලු බලයන්ට ඉහළින් බලය හා ආධිපත්‍ය අපට ලබාදුන් සේක. යේසුස්වහන්සේ ලබාදුන් බලය මැදහත්කාරමේ යම් නිශ්චිත අරමුණු උදෙසා පාවිච්චි කළ යුතු ලෙස පෙන්වමින් ලබාදුන් බලයකි.

### සතුරාට එරෙහි බලය :

සුවය හා මිදීම අවශ්‍ය අය උදෙසා යාච්ඤාවෙන් මැදහත්කම් කිරීමට ඔබට බලය ඇත :

> **එකළ උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, (ලූක් 9:1)**

### පාපයට එරෙහි බලය :

ගැළවීම අවශ්‍ය අය උදෙසා මැදහත්කම් කිරීමට ඔබට බලය ඇත:

> **යමෙකුගේ පව් නුඹලා කමාකරවුද ඒවා ඔවුන්ට කමාකරනු ලැබේ; යමෙකුගේ පව් නුඹලා කමා නොකරවුද ඒවා කමාකරනු නොලැබේයයි ඔවුන්ට කීසේක. (යොහන් 20:23)**

### ශුභාරංචිය ව්‍යප්ත කිරීම සඳහා බලය :

ශුභාරංචිය ප්‍රකාශ කිරීමට සේවකයන් ඉල්ලා යාච්ඤා කිරීමේ බලය ඔබට ඇත.

> **උන්වහන්සේ සමූහයන් දැක, ඔවුන් එඬේරෙකු නැති බැටළුවන් ලෙස හිරිහැර විඳිමින් විසිර ගොස් සිටිය බැවින් ඔවුන් කෙරෙහි අනුකම්පාකළසේක. එවිට උන්වහන්සේ තමන් ගෝලයන්ට කතාකොට: ගොයම් නම් බොහෝය නුමුත් ගොවියෝ ස්වල්ප දෙනෙක්ය. (මතෙව් 9:36-37)**

## බැඳීම හා මුදා හැරීම

"බැඳීම" යන වචනය අසාර් (asar) නමැති හෙබ්‍රෙව් වචනයෙන් සෑදී ඇති අතර එහි අර්ථය "බැඳ තැබීම, සිර කිරීම, ගැට ගැසීම, එතීම, වැඩ ගැනීම" යන්නයි. මෙම වචනය හෙබ්‍රෙව් පැරණි ගිවිසුම් තුළ ආසන්න වශයෙන් 70 වතාවක් පමණ යෙදී ඇති අතර බොහෝවිට යොදාගෙන ඇත්තේ අශ්වයන් හා කොටළුවන් බැඳීම සම්බන්ධව වේ (2 රාජාවලිය 7:10).

මතෙව් 12:28-29 දක්වා ඇති යේසුස්වහන්සේගේ ප්‍රකාශයේ විශේෂ වැදගත්කමක් ඇත.

> **නුමුත් මම දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, සැබවින්ම දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා කරා පැමිණ තිබේ. නොහොත් බලවන්තයා පළමුකොට නොබැඳ, යමෙකුට ඔහුගේ ගෙට වැද ඔහුගේ වස්තු කොල්ල කන්ට කෙසේ හැකි වේද? බැඳලාම ඔහුගේ ගෙය කොල්ලකන්නේය. (මතෙව් 12:28-29)**

පළමුකොට බලවන්තයා නොබැඳ ඔහු සතු වස්තුව පැහැර ගැනීම අපහසුය. යේසුස්වහන්සේ බලවන්තයා ගැන කතා කරමින් සඳහන් කරන්නේ සාතන් ගැනය. සාතන් පැහැර ගැනීමට ඇති වස්තුව නම්, "යක්ෂ ආත්ම වලට හසුවූවන්" ද ඇතුළුව, ඔහු විසින් යටත් කරගෙන සිටින විනාශ වන්නාවූ පුද්ගලයන් වන අතර ඔවුන් සාතන්ට අන් සියල්ලටම වඩා වටින වස්තුවයි.

යේසුස්වහන්සේ ඇදහිලිවන්තයන්ට බැඳීමට හා මුදාහැරීමට බලය දුන්සේක:

> **ස්වර්ගරාජ්‍යයේ යතුරු නුඹට දෙන්නෙමි. නුඹ පොළොවෙහිදී යමක් බඳින්නෙහිද ඒක ස්වර්ගයෙහිදී බඳිනු ලබන්නේය, නුඹ පොළොවෙහිදී යමක් මුදන්නෙහිද ඒක ස්වර්ගයෙහිදී මුදනු ලබන්නේයයි ඔහුට කීසේක. (මතෙව් 16:19)**

යක්ෂ ආත්ම පළවා හැරීමට පෙර ඒවා බැඳීමේ වැදගත්කම යේසුස්වහන්සේ ඉගැන්වූ නමුත්, බැඳීම හා මුදා හැරීම පිළිබඳ ප්‍රතිපත්තිය යක්ෂ ආත්ම පළවා හැරීමෙන් එහාට විහිදෙන්නකි. ඔබේ ජීවිතයේ, නිවසේ, සමාජයේ සහ සභාවේ ක්‍රියා කරන සතුරාගේ බලය බැඳ දැමීමට ඔබට හැකිය. සතුරාගේ පාපයේ, දොම්නසේ හා අධෛර්යයේ බැඳීම් වලින් ඔබට මිනිසුන් හා කාන්තාවන් නිදහස් කළ හැකිය. සෑම අවස්ථාවකදීම...සෑම ගැටලුවකදීම, සෑම අභියෝගයකදීම...ආත්මික යතුරක් තිබේ. එම යතුර නම් මැදහත්කමේ යාච්ඤාව තුළින් බැඳීම හා මුදාහැරීමයි.

## යේසුස්වහන්සේගේ නාමය

අප මැදහත්කම් කරන දේ කෙරෙහි වූ ආධිපත්‍ය යේසුස්වහන්සේගේ නාමයයි. යේසුස්වහන්සේ මෙසේ පොරොන්දු වූ සේක :

> **නුඹලා විසින් මාගේ නාමයෙන් කොයි දෙයක් ඉල්ලුවත්, මම ඒක ඉෂ්ටකරන්නෙමි. (යොහන් 14:14)**
>
> **ඒ දවසේදී නුඹලා මගෙන් කිසිවක් අසන්නේ නැත. සැබැවක් සැබැවක් නුඹලාට කියමි- පියාණන්වහන්සේගෙන් නුඹලා යමක් ඉල්ලුවොත්, උන්වහන්සේ මාගේ නාමයෙන් ඒ දේ නුඹලාට දෙනසේක. (යොහන් 16:23)**
>
> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරු කරන්නේය: අන් භාෂා වලින් කථාකරන්නෝය: සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය: ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:17-18)**
>
> **යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තීස්ම කරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:18-20)**

ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කිරීම, දේශනා කිරීම, ඉගැන්වීම, බව්තීස්ම කිරීම, යක්ෂයන් පළවා හැරීම, රෝගීන් සුව කිරීම සහ සතුරාගේ බලය ජයගැනීම සිදු කළ යුතුය. යේසුස්වහන්සේගේ නාමය අන් සියලු නාමයන්ට වඩා බලවත් ය.

> **තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධකරන්නාවූ තැනන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියම කරනු ලැබ ක්‍රිස්තුස්වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව. (එපීස 1:21)**
>
> **එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඒත්තුගන්න පිණිසත්ය. (පිලිප්පි 2:9-11)**

## යේසුස්වහන්සේගේ රුධිරය

යේසුස්වහන්සේගේ රුධිරය යනු අපට මැදහත්කම් කිරීමේ හැකියාව ලබාදෙන තවත් බලවත් ආත්මික සම්පතකි. අපට පියවූ දෙවියන්වහන්සේ වෙත ළඟා වීමේ හැකියාව ඇත්තේ උන්වහන්සේගේ රුධිරය තුළිනි:

> **එබැවින්, සහෝදරවරුනි, යේසුස්වහන්සේ ස්වකීය මාංසය නමැති තිරය මැදින් අප උදෙසා කැපකළාවූ මාර්ගය වන අලුත්වූ ජීවමාන මාර්ගයකින්, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන ශුද්ධස්ථානයට ඇතුල්වීමට අපට නිදහස්කම තිබෙන බැවින්ද, දෙවියන්වහන්සේගේ ගෘහය කෙරෙහි අපට උතුම්වූ පූජකයෙක් සිටින බැවින්ද, නපුරු හෘදසාක්ෂියකින් පිරිසිදුවීම පිණිස අපගේ සිත් ඉසිනු ලැබ, අපේ ශරීරය පිරිසිදු වතුරෙන් සෝදනු ලැබ, සැබෑවූ සිතක් ඇතුව ඇදහීමේ නිසැකකමින් ළඟාවෙමු. (හෙබ්‍රෙව් 10:19-22)**

"අතිශුද්ධස්ථානය" දෙවියන්වහන්සේ වැඩ සිටින ස්ථානයයි. ආගමික චාරිත්‍ර හා සංකීර්ණ ක්‍රමවේද තුළින් අපට දෙවියන්වහන්සේගේ අභිමුඛයට ළඟා විය නොහැක. අපි දෙවියන්වහන්සේගේ අභිමුඛයට ළඟා වන්නේ යේසුස්වහන්සේගේ රුධිරය තුළිනි.

රුධිරය පිළිබඳ විෂය උත්පත්ති පොතේ සිට එළිදරව් පොත දක්වා සම්පූර්ණ බයිබලය පුරාම විහිදෙන රතු පැහැති නූලක් වැනිය. මිනිසුන්ගේ හා සතුන්ගේ ජීවය ඇත්තේ රුධිරයේ බව බයිබලය උගන්වයි. (ලෙවී කතාව 17:11,14). පාපයේ කුලිය නම් මරණය වන බැවින් (රෝම 6:23) හා ජීවය ඇත්තේ රුධිරයේ වන බැවින්, පාපයට කමාව ලැබෙන්නේ රුධිරය වැගිරීමෙන් පමණක්ය යන ප්‍රතිපත්තිය දෙවියන්වහන්සේ පිහිටවූ සේක.

> **ව්‍යවස්ථාවේ ප්‍රකාරයට සියලු දේවල්ම ලෙයින් පවිත්‍රකරනු ලැබේයයි කියන්ට පුළුවන්වා වාගේ පෙනේ, ලේ වැගිරීමක්ද නැතුව ක්ෂමා කිරීමකුත් නැත. (හෙබ්‍රෙව් 9:22)**

ඒදන් උයනේදී ආදම් හා ඒව පව් කිරීමෙන් අනතුරුව, ක්‍රිස්තුස්වහන්සේගේ ධර්මිෂ්ඨ කම නිරූපණය කෙරෙන සම් වලින් සාදන ලද ඇඳුම් වලින් ආදම් හා ඒව පැලඳවීම සඳහා සතෙක් මැරීමෙන් දෙවියන්වහන්සේ පළමු රුධිර පූජාව සිදු කළසේක. කායින්ගේ හා ආබෙල්ගේ කතාව තුළින්, ඉශ්‍රායෙල් සෙනඟ සමඟ වූ චර්මඡේදනයේ ගිවිසුම හා මණ්ඩපයේ සිදු කෙරෙන ලෙවීවරුන්ගේ චාරිත්‍ර තුළින් රුධිර පූජාවේ වැදගත්කම අවධාරණය කර ඇත. පැරණි ගිවිසුම තුළදී මිනිසා පව් කළ සෑම අවස්ථාවකදීම නැවත නැවත සතුන්ගේ රුධිරය පූජාවක් ලෙස ඔප්පු කරනු ලැබීය. හෙබ්‍රෙව් 8 මේ පිළිබඳ කරුණු දක්වන අතර එය "පැරණි ගිවිසුම" ලෙස හඳුන්වයි.

නව ගිවිසුමේදී එක් වතාවක් සියලු දෙනාගේම පාපය උදෙසා තම රුධිරය වැගිරීමට දෙවියන්වහන්සේ යේසුස්වහන්සේ එවූ සේක. උන්වහන්සේගේ රුධිරය "නව ගිවිසුම" ලෙස පැහැදිලි කර ඇති අතර (මාර්ක් 14:24), උන්වහන්සේ මෙම නව ගිවිසුමේ මැදහත්කාරුව සිටින තැනැත්තාය (හෙබ්‍රෙව් 8:6). මෙමඟින් පැරණි ගිවිසුම යල්පැනපු තත්වයට පත් කරන අතර, එහි අදහස තවදුරටත් පාපය උදෙසා පූජාවක් වශයෙන් සතුන්ගේ රුධිරය අවශ්‍ය නොවන බවය:

> **එළුවන්ගේත් වස්සන්ගේත් ලේ කරණකොටගෙන නොව තමන්ගේම ලේ කරණකොටගෙන, අප උදෙසා සදාකාල මිදීම ලබාගෙන එකම වරක් ශුද්ධස්ථානයට ඇතුල්වූසේක. (හෙබ්‍රෙව් 9:12)**

යේසුස්වහන්සේගේ රුධිරය අප උදෙසා කතා කරන බව හා එමගින් ප්‍රකාශ කරන දේ තුළින් අපට වටිනා සදාකාලික ප්‍රතිලාභ ලැබෙන බව හෙබ්‍රෙව් 12:24 හි සඳහන් වේ. "අපගේ ප්‍රකාශ කිරීම තදින් අල්ලාගන්න" (හෙබ්‍රෙව් 10:23) යි පාවුල් අපට මඟපෙන්වූ විට, අපට අතිශුද්ධස්ථානයට ළඟා වීමට අයිතිය ඇති බව පවසන පෙර පදයට එය සම්බන්ධ වේ.

ඔබ යාච්ඤාව තුළින් දෙවියන්වහන්සේගේ අභිමුඛයට ළඟා වන්නේ ඔබ ගැළවීම ලැබූ ලෙසටමය. එනම් යේසුස්වහන්සේගේ රුධිරයේ ප්‍රතිලාභ ප්‍රකාශ කිරීමෙන්ය :

> **යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේයයි නුඹේ මුඛයෙන් ප්‍රකාශ කරන්නෙහි නම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහාගන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය. මක්නිසාද, මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහාගන්නේය; ගැළවීම පිණිස මුඛයෙන් කියාදෙන්නේය. (රෝම 10:9-10)**

යේසුස්වහන්සේගේ රුධිරයේ සාක්ෂිය මත පදනම් වී ඇති බැවින් අධිපත්‍යය සහිත වූ ඔබගේ ප්‍රකාශයට ප්‍රතිචාර වශයෙන් දෙවියන්වහන්සේ ක්‍රියා කරන සේක. දෙවියන්වහන්සේ වැඩ සිටින හා මැදහත්කම් කරන අතිශුද්ධස්ථානයට ඔබට මේ මොහොතේදී ඇතුළු විය හැකි බව රුධිරය මඟින් ප්‍රකාශ කරයි.

## නිරාහාරය

බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කාරකමක් උදෙසා වූ තවත් ආත්මික මූලාශ්‍රයකි නිරාහාරය. ඉතාම සරල ලෙස නිර්වචනය කළහොත්, නිරාහාරය යන්නෙහි අර්ථය ආහාර නොගෙන සිටීමයි. නිරාහාරය යනු අප දෙවියන්වහන්සේගේ සේවකයන් බව පෙන්නුම් කරන දේවල් වලින් එකකි (2 කොරින්ති 6:3-10). නිරාහාරව හිඳ යාච්ඤා කිරීම මුල් කාලීන සභාවේ ක්‍රියාත්මක වූ අතර (ක්‍රියා 14:23) එහි නිරතවන ලෙස පාවුල් අප ධෛර්යවත් කරයි (1 කොරින්ති 7:5).

## නිරාහාරයේ ආකාරයන් :

බයිබලයට අනුව නිරාහාරයේ ආකාරයන් දෙකකි. සම්පූර්ණ නිරාහාරය යනු ඔබ කිසිම කෑමක් හෝ බීමක් නොගෙන සිටීමයි. මේ සඳහා උදාහරණයක් ක්‍රියා 9:9 හමුවේ. අර්ධ නිරාහාරය යනු ආහාර වේල් සීමා කර ඇති අවස්ථාවයි. දානියෙල් 10:3 හි මේ සඳහා උදාහරණයක් තිබේ.

## නිරාහාරය සඳහා බයිබලීය උදාහරණ :

-ඊසාක්ට නිවැරදි භාර්යාව තෝරා ගැනීමේදී ආබ්‍රහම්ගේ සේවකයා නිරාහාරව සිටියේය. (උත්පත්ති 24:33)

-ව්‍යවස්ථාව සහ මණ්ඩපය පිළිබඳ එළිදරව්ව ලැබීමට පෙර මෝසෙස් දින 40 හා රාත්‍රී 40 ක් නිරාහාරව සිටියේය. (නික්මයාම 34)

-හන්නා දරුවෙකු උදෙසා නිරාහාරව සිටියාය. (2 සාමුවෙල් 1:7-8)

-යෙරුසලම නැවත ගොඩනැගීම උදෙසා නෙහෙමියා නිරාහාරව සිටියාය. (නෙහෙමියා 1:4)

-මරණය උදෙසා වූ හාමන්ගේ නපුරු නියෝගය ගැන යුදෙව්වන් නිරාහාරව සිටියෝය. (එස්තර් 4)

-පසුතැවිලිවීම උදෙසා වූ යෝනා ගේ කැඳවීමට පිළිතුරු ලෙස මුළු නිනිවය නගරයම නිරාහාරව සිටියේය. (යෝනා 3:5-10)

-ඉශ්‍රායෙලයේ රජු වශයෙන් තමාට දෙවියන්වහන්සේගෙන් ලැබුණු ඉරණම භාර ගැනීමට පෙර දාවිත් නිරාහාරව සිටියේය. (1 සාමුවෙල් 31)

-දානියෙල් දින 21 ක් නිරාහාරව සිටි අතර අවසානයේදී වහල්කමේ සිටි හෙබ්‍රෙව් ජනයා තීරණාත්මක මංසන්ධියකට ගෙන ආ පණිවුඩයක් දෙවියන්වහන්සේගෙන් ලැබුවේය.

-යෙහෝෂාපාට් යුද්ධයට පෙර නිරාහාරයක් ප්‍රකාශ කළෝය. (2 ලේකම් 20:3)

-එස්රා රටින් නෙරපා තිබූ අයට අහාවා ගංතෙර පසුතැවිල්ලේ නිරාහාරයකට කැඳවීමක් දුන්නේය. (එස්රා 8-9)

-යේසුස්වහන්සේ තම සේවයට ඇතුළු වීමට පෙර නිරාහාරව සිටි සේක. (මතෙව් 4)

-තම හැරීමෙන් අනතුරුව අපෝස්තුළුවර පාවුල් නිරාහාරව සිටියේය. (ක්‍රියා 9)

-අන්‍යජාතීන් සමඟ සුභාරංචිය බෙදාගැනීමට පේත්‍රුස් කැඳවීම ලැබුණේ සහ එළිදරව්ව බාර ගැනීමට කොර්නේලියස්ව සූදානම්කරනු ලැබුවේ නිරාහාරව සිටි කාලයක් තුළදීය. (ක්‍රියා 10)

-ශුද්ධාත්මයාණන්වහන්සේ පාවුල් හා බාර්ණබස් සේවය සඳහා වෙන් කළ අවස්ථාවේදී ගෝලයන් නිරාහාරව යාච්ඤා කරමින් සිටියෝය. (ක්‍රියා 13:2)

## නිරාහාරයේ අරමුණු :

නිරාහාරය මගින් දෙවියන්වහන්සේ වෙනස් කරන්නේ නැත. එය ඔබ වෙනස් කරයි. ඔබට දෙවියන්වහන්සේ ඔබ සමඟ ක්‍රියා කරන්නේ ඔබ උන්වහන්සේ සමඟ පවත්වන සම්බන්ධතාවය මත පදනම්ව වේ. ඔබ වෙනස් වූ විට, දෙවියන්වහන්සේ ඔබ සමඟ ගනුදෙනු කරන ආකාරයට බලපෑමක් ඇති වේ. දෙවියන්වහන්සේ වෙනස් නොවන බැවින් ඔබ නිරාහාරව සිටින්නේ දෙවියන්වහන්සේ වෙනස් කිරීමට නොවේ. නිරාහාරය මඟින් වෙනස් වන්නේ උන්වහන්සේ ඔබ සමඟ ගනුදෙනු කරන ආකාරයයි. මේ පිළිබඳ උදාහරණයක් වශයෙන් නිනිවය නගරයේ සිදු වූ දෙය යෝනාගේ පොතෙන් කියවන්න.

එක් අවස්ථාවකදී යක්ෂ ආත්මයක් සහිත වූ තරුණයෙකුට උපකාර කිරීමට ගෝලයන් අසමත් වූ විට, නිරාහාරයෙන් හා යාච්ඤාවෙන් මිස "මේ ජාතිය" දුරු කරන්නට බැරි බව යේසුස්වහන්සේ පැවසූ සේක

(මාර්ක් 9:29). යාච්ඤාවෙන් හා නිරාහාරයෙන් තොරව ඔබට මුහුණ දීමට නොහැකි ඇතැම් අවස්ථාවන් ජීවිතයේ තිබේ. අවසාන කාලය වඩ වඩා ළං වෙත්ම, අප මීට පෙර අත් දැක නොමැති "මේ ජාතිය" ට සමාන අත්දැකීම් හා උභතෝකෝටික ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවේ. ඒවාට එරෙහිව අපට ජය ගැනීමට නිරාහාරය අවශ්‍ය වනු ඇත.

නිරාහාරය සඳහා වූ අනිවාර්ය ආත්මික අරමුණු තිබේ. ඔබ මෙම අරමුණු තේරුම් ගැනීම වැදගත් වේ. ඔබ වැරදි හේතුවක් උදෙසා හෝ නිශ්චිත අරමුණක් නැතිව නිරාහාරව සිටියහොත්, ඔබේ නිරාහාරව සිටීමෙන් පලක් නොවනු ඇත. පහත එක් එක් පාඨ අධ්‍යයනය කරන්න. ඒවායින් එළිදරව් කරන පරිදි මිනිසුන් නිරාහාරව සිටියේ :

| | |
|---|---|
| -දෙවියන්වහන්සේගෙන් ලැබුණු පණිවුඩයකට ප්‍රතිචාර ලෙස: | යෝනා 3:5 |
| -පරීක්ෂාවන් සහිත කාලවලදී: | ලූක් 4:1 |
| -ජාතික ව්‍යසනයක් හෝ යුද්ධයක් ගැන බියක් වූ කාලවලදී: | 2 ලේකම් 20:3 |
| -දෙවියන්වහන්සේගෙන් එළිදරව්වක් අවශ්‍ය වූ විට: | දානියෙල් 9:3-4 |
| -තීරණ ගැනීමේදී: | ක්‍රියා 13:2-3 |
| -අධිපතින් ඉදිරියේ විශේෂ ඉල්ලීම් කිරීමේදී: | එස්තර් 4:16 |
| -යක්ෂ ක්‍රියාකාරකම් වලට මුහුණ දීමට සූදානම් වීම සඳහා: | මාර්ක් 9:29 |
| -තමාගේ ජීවිතයේ යටහත් වීම සඳහා: | ගීතාවලිය 35:13; 69:10 |
| -පව් ගැන පසුතැවිලිවීමට: | යෝවෙල් 2:12 |
| -ශාරීරිකව හා ආත්මිකව දුර්වලයන් පෝෂණය කිරීමට: | යෙසායා 58:7 |
| -දෙවියන්වහන්සේ විසින් අසනු ලැබීමට: | 2 සාමුවෙල් 12:16; 22; යෝනා 3:5,10 |
| -දුෂ්ටකමේ විලංගු මුදාහැරීමට වියගහේ බැඳුම් ලිහිමට, බලාත්කාරය විඳින්නන් නිදහස්කර ගැනීමට, සහ සියලුම වියගස් කඩා දැමීමට: | යෙසායා 58:6 |

## නිරාහාරව සිටින කාල පරාසය

ඔබ නිරාහාරව සිටිය යුතු කාලය කොතරම්ද යන්න රඳා පවතින්නේ දෙවියන්වහන්සේ ඔබේ ආත්මයට කතා කරන දේ මත වේ. කෙටි කාලයක් හෝ දිගු කාලයක් නිරාහාරව සිටීමට උන්වහන්සේ ඔබ මෙහෙයවනු ඇත. ඒසව්ගේ හා යාකොබ්ගේ කතාව ඔබට මතකද? යාකොබ් තමා උදෙසා ආහාර වේලක් පිළියෙල කරමින් සිටි නමුත් කුළුඳුල්කම උදෙසා එය ගැනීමෙන් වැළකී සිටියේය. ඒසව් එම ආහාර වේල නොගෙන නිරාහාරව සිටියා නම් කොතරම් අපූරුද?

ඔබ කිසිදාක නිරාහාරව සිට නොමැතිනම් එක් වේලක් නිරාහාරව සිටීමෙන් ආරම්භ කරන්න. ඊළඟට එක් දිනක ඉර බැස යන අවස්ථාවේ සිට පසු දින ඉර බසින රාත්‍රිය දක්වා නිරාහාරව සිටීමට උත්සහ කිරීමට ඔබට අවශ්‍ය වනු ඇත. ඊළඟට ඔබ ඔබේ නිරාහාරය වඩා දිගු කාල පරිච්ඡේදයක් දක්වා වැඩි කරනු ඇත. ඔබ දිගු කලක් නිරාහාරව සිටින හැම විටම ජලය පානය කළ යුතුය. ඔබට ආහාර නැතිව දිගු කාලයක් සිටිය හැකිය. නමුත් ශරීරයේ ක්‍රියාකාරීත්වය සඳහා ජලය අවශ්‍ය වේ.

## ප්‍රසිද්ධ හා පෞද්ගලික නිරාහාරය :

නිරාහාරය යනු පුද්ගලයෙකු හා දෙවියන්වහන්සේ අතර ඇතිවන පෞද්ගලික දෙයකි. එය පෞද්ගලිකව කළ යුතු දෙයක් වන අතර ඒ ගැන පුරසාරම් දෙඩවිය යුතු නැත.

> **එසේම මනුෂ්‍යයන් විසින් නුඹලාගේ යහපත් ක්‍රියා දැක, ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේට ගෞරව කරන පිණිස නුඹලාගේ ආලෝකය ඔවුන් ඉදිරියේ බබළවා. ව්‍යවස්ථාව හෝ අනාගතවාක්‍යය හෝ අවලංගුකරන පිණස මම ආවෙමියි නොසිතල්ලා. සම්පූර්ණකරන්ට මිස අවලංගුකරන්ට නාවෙමි. සැබෑවක් නුඹලාට කියමි; අහසත් පොළොවත් පහව යන තෙක්, සියල්ල සිදුවන තුරු, ව්‍යවස්ථාවෙන් එක අකුරක්වත් බින්දුවක්වත් කිසිසේත් පහව නොයන්නේය. (මතෙව් 6:16-18)**

නායකයන් ප්‍රසිද්ධ නිරාහාරයක් කැඳවා මුළු සභාවටම නිරාහාරව සිටින ලෙස ඉල්ලිය හැකිය :

> **සියොන්හි හොරණෑව පිඹ, ශුද්ධ වූ උපවාසයක්ද රැස්වීමක්ද ප්‍රසිද්ධකරපල්ලා. (යෝවෙල් 2:15)**

## දෙවියන්වහන්සේ විසින් තෝරාගත් නිරාහාරය :

දෙවියන්වහන්සේ “තෝරාගත්” හෝ දිව්‍යමය අනුමැතිය ලද නිරාහාරය ගැන යෙසායා 58 හි විස්තර කෙරේ. දෙවියන්වහන්සේ තෝරාගත් උපවාසය නම් :

-ඔබ දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබේ ප්‍රාණය යටත් කරගන්නා අවස්ථාවයි : 5 වන පදය.

-දුෂ්ඨකමේ විලංගු මුදා හැරීමයි: 6 වන පදය

-වියගහේ බැඳුම් ලිහිමයි: 6 වන පදය

-බලාත්කාරය විඳින්නන් නිදහස්කර ගැනීමයි: 6 වන පදය

-ආත්මාර්ථකාමී අභිප්‍රායන් රහිත හා ත්‍යාගශීලීභාවය පෙන්නුම් කරන උපවාසයයි: 7 වන පදය

## නිරාහාරයේ ප්‍රතිඵල :

ඔබ නිරාහාරව සිටින විට මුලින්ම සිදුවන දෙය නම්, දෙවියන්වහන්සේ උන්වහන්සේ ඔබට එළිදරව් කිරීමට පටන් ගැනීමයි. ”එවිට නුඹ යාච්ඤා කරන්නෙහිය, ස්වාමීන්වහන්සේ උත්තර දෙනසේක꞉ නුඹ මොරගසන කල්හි: මම මෙහියයි උන්වහන්සේ කියනසේක” (යෙසායා 58:9) යි පියාණන්වහන්සේ පවසන සේක. යෙසායා 58 හි දක්වා ඇති නිරාහාරව සිටීමේ සෙසු ප්‍රතිඵල නම්:

**-ආලෝකවත් කිරීම :** ඔබගේ ජීවිතයේ අඳුරු කාලයන් දහවල මෙන් එළිය වනු ඇති බව 8 සහ 10 පද විස්තර කරයි. ඔවුන් ඔබේ ආත්මික ආලෝකය නිවාදමා ඇති බව අන්‍යයන් සිතන විට, එය නැවත නැගී උදාසන මෙන් වනු ඇත.

**-මඟපෙන්වීම :** “ස්වාමීන්වහන්සේ නිතරම නුඹට මඟපෙන්වන...” බව 11 වන පදයෙන් පොරොන්දු වේ.

**-සෑපයීම :** දෙවියන්වහන්සේ “වියළි තැන්වල නුඹේ ප්‍රාණය තෘප්තියට පමුණුවන” බව 11 වන පදයෙන් ප්‍රකාශවේ (මෙය භෞතික මෙන්ම ආත්මිකවද හිඟකම් සහිත කාල වලට අදාළ කරගත හැකිය) . එසේම අසීමිත ආත්මික සම්පත් ගැනද 11 වන පදය විස්තර කරයි. ඔබ “වතුර ඇති උයනක්” මෙන් සහ “සිඳී නොයන උල්පතක්” මෙන්ද වනු ඇත.

**-යළි ප්‍රාණවත් වීම :** දෙවියන්වහන්සේ “නුඹේ ඇට ශක්තිමත් කරන” බව 11 වන පදයේ දැක්වෙන අතර “නුඹේ සුවය ඉක්මනින් හට ගන්නා” බව 8 වන පදය පවසයි.

**-යලි ගොඩනැගීම :** ඔබේ ආත්මික බීජය “..නටඹුන් තැන් ගොඩනඟන්නෝය...බොහෝ පරම්පරා වල අත්තිවාරම් ගොඩනඟන්නෙහිය...කැඩුම් හරිගස්සන්නාය, වාසය පිණිස මාවත් අලුත් වැඩියා කරන්නායයි නුඹට කියනු ලැබේ” යනුවෙන් 12 වන පදයේ දැක්වේ.

# මැදහත්කම උදෙසා වූ සම්පත්

බලපෑමක් කළහැකි ආකාරයේ මැදහත්කමකට උපකාර කරන ආත්මික සම්පත් ඇදහිලිවන්තයන්ට තිබේ. මෙම පරිච්ඡේදය තුළ ඔබ ඉගෙන ගත් පරිදි ඒවා තුළ පහත සඳහන් දේ ඇතුළු වෙයි :

- පවරා දෙනු ලැබූ බලය හා ආධිපත්‍ය
- බැඳීම් හා මුදාහැරීම
- යේසුස්වහන්සේගේ නාමය
- යේසුස්වහන්සේගේ රුධිරය
- නිරාහාරය

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ආත්මික බලය හා ආධිපත්‍ය අතර වෙනස පැහැදිලි කරන්න.

3. යමක් ආත්මිකව බැඳීම යන්නෙහි අදහස කුමක්ද?

4. යමක් ආත්මිකව මුදා හැරීම යන්නෙහි අදහස කුමක්ද?

5. බැඳීමට හා මුදා හැරීමට ආධිපත්‍ය ලබා දෙන බයිබල් පදය කුමක්ද?

6. යේසුස්වහන්සේගේ නාමය මැදහත්කම උදෙසා වූ බලවත් සම්පතක් වන්නේ ඇයිදැයි පැහැදිලි කරන්න.

7. යේසුස්වහන්සේගේ රුධිරය මැදහත්කම උදෙසා වූ සම්පතක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

8. බයිබලයේ දක්වා ඇති නිරාහාරයේ ආකාර දෙක ලියා නිර්වචනය කරන්න.

9. නිරාහාරයේ අරමුණු සාරාංශ ගත කරන්න.

10. දෙවියන්වහන්සේගේ "තෝරාගත්" උපවාසය විස්තර කරන බයිබල් කොටස කුමක්ද?

11. නිරාහාරව සිටීමේ ඇතැම් ධනාත්මක ප්‍රතිඵල මොනවාද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

අප දෙවියන්වහන්සේ වෙත මැදහත්කම් කරන ආධිපත්‍ය යේසුස්වහන්සේගේ නාමයයි. "යේසුස්" යන නාමයේ ඇති අනර්ඝ බලය පිළිබඳ ඔබගේ දැනුම වැඩි කරගැනීම සඳහා පහත දැක්වෙන උන්වහන්සේගේ නම් ලැයිස්තුව අධ්‍යයනය කරන්න :

| | |
|---|---|
| මැදහත්කාරයාණෝ | 1 යොහන් 2:1 |
| සර්වපරාක්‍රමයාණෝ | එළිදරව් 1:8 |
| ඇල්ෆා සහ ඕමේගා | එළිදරව් 21:6 |
| ආමෙන් | එළිදරව් 3:14 |
| කර්තෘවරයාණෝ / ඇදහිල්ලේ සම්පූර්ණකරන්නා | හෙබ්‍රෙව් 12:2 |
| සදාකාල ගැලවුම් කර්තෘ | හෙබ්‍රෙව් 5:10 |
| දෙවියන්වහන්සේගෙන් උපන් තැනැත්තා | 1 යොහන් 5:18 |
| ප්‍රේමවන්තයාණන්වහන්සේ | එපීස 1:6 |
| පැළෑටිය | සෙකරියා 3:8 |
| ජීවනදායක කෑම | යොහන් 6:48 |
| දීප්තිමත් පහන් තාරකාව | එළිදරව් 22:16 |
| ස්වාමීන්වහන්සේගේ සේනාපතියා | යොෂුවා 5:15 |
| කොණේ ප්‍රධාන ගල | 1 පේත්‍රුස් 2:6 |
| දසදහසක් අතරේ උතුම් තැනැත්තා | සළමොන්ගේ ගීතිකා 5:10 |
| ක්‍රිස්තුස්වහන්සේ | යොහන් 1:41 |
| මන්ත්‍රිවරයාණෝ | යෙසායා 9:6 |
| ගැළවුම්කාරයාණෝ | රෝම 11:26 |
| දොරකඩ | යොහන් 10:9 |
| එම්මැනුවෙල් | මතෙව් 1:23 |
| සදාකාල ජීවනය | 1 යොහන් 5:20 |
| විශ්වාසය, සැබෑය කියනු ලබන තැනන්වහන්සේ | එළිදරව් 19:11 |
| විශ්වාස සාක්ෂිකාරයාණෝ | එළිදරව් 1:5 |
| කුළුඳුලා | හෙබ්‍රෙව් 1:6 |
| ආරම්භය හා අවසානය | එළිදරව් 22:13 |
| මහිමයෙන් යුක්ත ස්වාමීන්වහන්සේ | යෙසායා 33:21 |
| ශ්‍රේෂ්ඨ උත්තම පූජකයාණෝ | හෙබ්‍රෙව් 4:14 |
| ශරීරයේ හිස | කොලොස්සි 1:18 |
| සියල්ලට ප්‍රධානියා | එපීස 1:22 |
| ප්‍රධාන ගල | ගීතාවලිය 118:22 |
| සියල්ලට උරුමක්කාරයා | හෙබ්‍රෙව් 1:2 |
| ඉශ්‍රායෙල් හි ශුද්ධ තැනන්වහන්සේ | යෙසායා 41:14 |
| මහිමයේ බලාපොරොත්තුව | කොලොස්සි 1:27 |
| මම | යොහන් 8:58 |
| අදෘෂ්‍යමාන දෙවියන්වහන්සේගේ ස්වරූපය | කොලොස්සි 1:15 |
| අප ස්වාමි වූ ක්‍රිස්තුස්වහන්සේ | රෝම 1:3 |
| මහිමයේ රජතුමා | ගීතාවලිය 24:7 |
| දෙවියන්වහන්සේගේ බැටලු පැටවාණෝ | යොහන් 1:29 |
| ලෝකයේ ආලෝකය | යොහන් 8:12 |
| මිටියාවත්වල මහනෙල් මල | සළමොන්ගේ ගීතිකා 2:1 |
| ජීවනදායක කෑම | යොහන් 6:51 |
| සර්වපරාක්‍රම වූ ස්වාමි වූ දෙවියන්වහන්සේ | එළිදරව් 4:8 |
| සියල්ලන්ගේ ස්වාමියා | ක්‍රියා 10:36 |
| අපේ ධර්මිෂ්ඨකම වූ ස්වාමීන්වහන්සේ | යෙරමියා 23:6 |
| ප්‍රේමය | 1 යොහන් 4:8 |
| දුක දන්නා වූ මනුෂ්‍යයා | යෙසායා 53:3 |
| ස්වාමියා | මතෙව් 23:10 |
| මෙසියස්වහන්සේ | දානියෙල් 9:25 |
| අති ශුද්ධ | දානියෙල් 9:24 |
| නාසරීයයා | මතෙව් 2:23 |

| | |
|---|---|
| එකම දෙවිවූ | 1 තිමෝති 1:17 |
| අපගේ පාස්කුව | 1 කොරින්ති 5:7 |
| වෙදාණෝ | ලූක් 4:23 |
| සාමයේ කුමරා | යෙසායා 9:6 |
| පව් නසන පූජාව | රෝම 3:25 |
| මිදුම්කාරයාණෝ | යෙසායා 59:20 |
| නැවත නැඟිටීම | යොහන් 11:25 |
| ධර්මිෂ්ඨ සේවකයා | යෙසායා 53:11 |
| පර්වතය | 1 කොරින්ති 10:4 |
| ෂාරෝන් හි පුෂ්පය | සාළමොන්ගේ ගීතිකා 2:1 |
| ලෝකයේ ගැළවුම්කරුවාණෝ | 1 යොහන් 4:14 |
| එඬේරා | යොහන් 10:11 |
| දෙවියන්වහන්සේගේ පුත්‍රයා | රෝම 1:4 |
| මනුෂ්‍ය පුත්‍රයා | ක්‍රියා 7:56 |
| මරියාගේ පුත්‍රයා | මාර්ක් 6:3 |
| ගල | මතෙව් 21:42 |
| සවි අත්තිවාරම | යෙසායා 28:16 |
| ගුරුවරයා | යොහන් 3:2 |
| සත්‍ය | යොහන් 14:6 |
| වියවහාර නොකළ දීමනාව | 1 කොරින්ති 9:15 |
| මිදිවැල | යොහන් 15:1 |
| මාර්ගය | යොහන් 14:6 |
| අපූර්වය | යෙසායා 9:6 |
| දෙවියන්වහන්සේගේ වචනය | එළිදරව් 19:13 |

# හතරවන පරිච්ඡේදය

## මැදහත්කම් කරන ආකාරය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- මැදහත්කම් කරන ආකාරය පැහැදිලි කිරීමට,
- බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමකට අවශ්‍ය ප්‍රතිපත්ති සාරාංශ කිරීමට,
- මැදහත්කම් කළ යුත්තේ කුමක් උදෙසා දැයි හඳුනාගැනීමට,
- මැදහත්කම් කිරීමට දෙවියන්වහන්සේගේ පොරොන්දු පාවිච්චි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැක කම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව. (1 යොහන් 5:14-15)**

## හැඳින්වීම

මැදහත්කමේ යාච්ඤාවේ මූලිකාංග වන්නේ අපට කෙතරම් ශබ්ද නගා යාච්ඤා කළ හැකිද යන්න හෝ අපගේ යාච්ඤාවන් තුළ අප කෙතරම් උද්යෝගිමත්ද යන්න හෝ නොවේ (මෙහි අදහස මේවා වැරදි යන්න නොවේ). නමුත් එහි මූලිකාංග වන්නේ අපගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දැන්වීමේදී අප කෙතරම් අවංක ද යන්න වේ. සාතන්ගේ මූලික ඉලක්කය දෙවියන්වහන්සේට මහිමය ලැබීම වැළැක්වීම වන බැවින්, අපගේ යාච්ඤාවන් අවසානයේ දෙවියන්වහන්සේ මහිමයට පත් වීම අත්‍යවශ්‍ය වේ. මේ හේතුවෙන්, දෙවියන්වහන්සේ මහිමයට පත් කිරීම අපගේ මූලික අරමුණ වශයෙන් තබා ගෙන අපගේ මුළු ආත්මය හා මුළු පැවැත්මෙන් මැදහත්කමේ යාච්ඤාවට කැප වුවහොත්, දෙවියන්වහන්සේ තමන්ව ප්‍රකාශ කරනු ඇත. "නුඹලා මා සොයනවා ඇත, නුඹලාගේ මුළු සිතින් මා සොයන කල මා නුඹලාට සම්බවෙනවා ඇත. මම නුඹලාට සම්බවන්නෙමියි ස්වාමින්වහන්සේ කියනසේක..." (යෙරමියා 29: 13-14)

දෙවියන්වහන්සේගේ කැමැත්තේ ප්‍රකාරයට ඇදහිල්ලෙන් අපගේ යාච්ඤාවන් එසවිය යුතු වේ.

> **උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැක කම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව. (1 යොහන් 5:14-15)**

මෙම පාඩමේදී මැදහත්කම් කරන ආකාරය හා මැදහත්කම් කළ යුත්තේ කුමක් උදෙසා දැයි පිළිබඳව බයිබලය සඳහන් කරන්නේ මොනවාද කියා ඉගෙන ගනු ලැබේ. ඔබගේ මැදහත්කමේ යාච්ඤාව දෙවියන්වහන්සේගේ වචනයේ පොරොන්දු මත පදනම් කරන්නේ කෙසේද යන්න ඉගෙන ගනු ලැබේ.

## මැදහත්කම් කළ හැක්කේ කෙසේද

පහත දැක්වෙන බයිබල් පද එකින් එක ඔබගේ බයිබලයෙන් බලන්න. මේ ඡේදයන් ඔබට මැදහත්කාරකම සඳහා බයිබලීය ප්‍රතිපත්ති සපයන්නේය.

- යාච්ඤාව දෙවියන්වහන්සේ වෙත ඉදිරිපත් කළයුතුය: ගීතාවලිය 5:2
- ගණනට වඩා ගුණය අවධාරණය කරන්නේය
  යාච්ඤාව සාර්ථක වන්නේ බොහෝ වචන කීම නිසා නොවේ මතෙව් 6:7

- හිස් ලෙස යමක් නැවත පැවසීම එපා කරන නමුත්, අවංක ලෙස නැවත පැවසීමේදී එසේ සිදු නොවේ: දානියෙල් 6:10, ලූක් 11:5-13, 18:1-8
- තේරුමක් ඇතිව යාච්ඤා කරන්න (දන්නා භාෂාවකින්) එපීස 6:18
- ශුද්ධාත්මයාණන් තුළ අන්‍ය භාෂාවන්ගෙන් යාච්ඤා කරන්න: රෝම 8:26; යූද් 20
- දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව මැදහත්කාරකම් කරන්න: 1 යොහන් 5:14-15
- රහසින් යාච්ඤා කරන්න: මතෙව් 6:6
- සැමවිටම යාච්ඤා කරන්න: ලූක් 21:36; එපීස 6:18
- නොකඩවා දිගින් දිගටම යාච්ඤා කරන්න: රෝම 12:12; 1 තෙසලෝනික 5:17
- යේසුස්වහන්සේගේ නාමයෙන් පියාණන්වහන්සේට මැදහත්කම් කරන්න: යොහන් 14:13-14
- සිහියෙන් යුක්ත ආකල්පයකින් යාච්ඤා කරන්න: 1 පේත්‍රුස් 4:7
- ආදර්ශ යාච්ඤාවේ උදාහරණය උපයෝගි කර ගනිමින් යාච්ඤා කරන්න. මතෙව් 6:9-13
- සමාවදීමේ ආත්මයකින් යුක්තව යාච්ඤා කරන්න: මාර්ක් 11:25
- යටහත්කමින් යුතුව යාච්ඤා කරන්න: මතෙව් 6:7
- ඇතැම්විට නිරාහාරව සිටිමින් යාච්ඤා කරන්න: මතෙව් 17:21
- ජ්වලිතව මැදහත්කම් කරන්න: යාකොබ් 5:16, කොලොස්සි 4:12
- දෙවියන්වහන්සේට යටත්ව යාච්ඤා කරන්න: ලූක් 22:2
- යාච්ඤාවෙන් බැඳීමේ හා නිදහස් කිරීමේ උපක්‍රම පාවිච්චි කරන්න: මතෙව් 16:19

## බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් සඳහා වූ ප්‍රතිපත්ති

පහත සඳහන් බයිබල් පදවලින් උපුටා ගත් බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් සඳහා වූ ප්‍රතිපත්ති සමහරක් පහත සඳහන් දැක්වේ:

1. දෙවියන්වහන්සේ කවුරුන්ද යන්න පිළිබඳව හා ස්වාමී වූ යේසුස්වහන්සේ නිරත වූ සේවයේම නියැලීමට ලැබුණු භාග්‍ය උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න (හෙබ්‍රෙව් 7:25). යාච්ඤාව තුළින් මිනිසුන් සම්බන්ධ කාරණා වලදී දෙවියන්වහන්සේ සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට ලැබුණු භාග්‍ය ගැන උන්වහන්සේට ප්‍රශංසා කරන්න.

2. ඔබ තුළ සමාව නොගත් පාපයක් තිබේද යන්න නිශ්චය කිරීමට ශුද්ධාත්මයාණන්වහන්සේට ඉඩදීම තුළින්, ඔබගේ හදවත දෙවියන්වහන්සේ ඉදිරියේ පවිත්‍ර බව සැකහැර දැනගන්න. (ගීතාවලිය 66:28; 29:23-24)

3. ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීම හා ශක්තිය නොමැතිව ඔබට සැබවින්ම යාච්ඤා කළ නොහැකි බව දැනගන්න (රෝම 8:26). ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේ විසින් කරනු ඇති බව විශ්වාස කරමින්, උන්වහන්සේගේ ආත්මයෙන් ඔබ සම්පූර්ණයෙන්ම පාලනය කරන මෙන් ඉල්ලා, උන්වහන්සේට ප්‍රශංසා කරන්න. (එපීස 5:18)

4. තදින් සතුරා සමඟ ගනුදෙනු කරන්න. සියලු බලැති ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය හා "ආත්මයේ කඩුව" වන දේව වචනය ගෙන ඔහුට විරුද්ධව සිටින්න. (යාකොබ් 4:7)

5. ඔබේ සිතුවිලි, ආශාවන් හා ඔබ විසින් යාච්ඤා කළ යුතු බවට ඔබට හැඟෙන වියගස් උදෙසා මළ කෙනෙක් වන්න. (හිතෝපදේශ 3:5-6; 28:26; යෙසායා 55:8)

6. ඔබ පැවැත්වීමට යන විශේෂ යාච්ඤා රැස්වීම උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. උන්වහන්සේ සුවිශේෂී දෙවිකෙනෙකු වන අතර උන්වහන්සේගේ චරිතය හා ගැලපෙන යමක් සිදුකරනු ඇත.

7. නිහඬ අපේක්ෂාවකින් දෙවියන්වහන්සේ ඉදිරියේ සිටිමින්, උන්වහන්සේගේ මඟපෙන්වීමට සවන් දෙන්න. (ගීතාවලිය 62:5; මීකා 7:7; ගීතාවලිය 81:11-13)

8. කීකරු කමින් හා ඇදහිල්ලෙන් යුතුව, විශ්වාසකරමින් දෙවියන්වහන්සේ ඔබේ මනසට ගෙනෙන දෙය ප්‍රකාශ කරන්න (යොහන් 10:27). දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්වන බව විශ්වාස කරමින් දෙවියන්වහන්සේගෙන් මඟපෙන්වීම ඉල්ලන්න. උන්වහන්සේ එසේ කරනු ඇත (ගීතාවලිය 32:8). විශේෂයෙන් කණ්ඩායමක් ලෙස යාච්ඤා කරන විට, එක් ප්‍රශ්නයක් පිළිබඳව දෙවියන්වහන්සේට ඔබට පැවසීමට අවශ්‍ය දේ සඳහා උන්වහන්සේට කාලය දීමෙන් තොරව ඊළඟ ප්‍රශ්නයට නොයෑමට වගබලා ගන්න. මැදහත්කම තම ජීවන රටාව කරගන්නා අයට දෙවියන්වහන්සේ එළිදරව් වීම් දෙන බව දැනගෙන මෝසෙස්, දානියෙල්, පාවුල් හා ආනා වැනි අයගේ ජීවිත තුළින් ධෛර්යමත් වන්න.

9. ඔබට හැකිනම්, දෙවියන්වහන්සේට මඟපෙන්වීම් හා ස්ථිරකිරීම් ලබා දීමට ඔබගේ බයිබලය ළඟ තබා ගන්න. (ගීතාවලිය 119:10-15)

10. යාච්ඤා කළයුතු දේවල් ඔබේ මනසට ගෙන ඒම දෙවියන්වහන්සේ නැවැත්වූ විට, රෝම 11:36 මක්නිසාද සියල්ල උන්වහන්සේ කෙරෙන්ය. උන්වහන්සේ කරණකොටගෙනය, උන්වහන්සේ උදෙසාය, උන්වහන්සේට සදාකල්ම මහිමය වේවා. ආමෙන්. (රෝම 11:36) ඔබට මතක් කර දෙමින්, දෙවියන්වහන්සේ කර ඇති දේවල් උදෙසා උන්වහන්සේට ප්‍රශංසා හා ස්තුති කරමින් අවසන් කරන්න. [1]

## මැදහත්කම් කළ යුත්තේ මොනවා උදෙසාද

ඔබ මැදහත්කම් කළ යුත්තේ මොනවා උදෙසාද යන්න එළිදරව් කරන පහත බයිබල් කොටස් අධ්‍යයනය කරන්න:

| | |
|---|---|
| -යෙරුසලමේ සමාදානය උදෙසා: | ගීතාවලිය 122:6 |
| -ගොයම් කැපීමට මෙහෙකරුවන් උදෙසා: | මතෙව් 9:38; ලූක් 10:2 |
| -ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස: | ලූක් 22:40-46 |
| -ඔබව විරුද්ධවාදී ලෙස පාවිච්චි කරන අය උදෙසා (ඔබේ සතුරන්): | ලූක් 6:28 |
| -සියලු ශුද්ධවන්තයන් උදෙසා: | එපීස 6:18 |
| -රෝගීන් උදෙසා: | යාකොබ් 5:14 |
| -එකිනෙකා උදෙසා (එකිනෙකාගේ බර දරා ගනිමින්): | යාකොබ් 5:16 |
| -(අන්‍යයන් උදෙසා යාච්ඤා කිරීම මඟහැරීමෙන් ඔබ කරන්නේ පාපයකි: | 1 සාමුවෙල් 12-23) |
| -සියලු මිනිසුන්, රජවරු හා ආධිපත්‍ය දරන අය උදෙසා: | 1 තිමෝති 2:1-4 |
| -දෛනික අවශ්‍යතා උදෙසා: | මතෙව් 6:11 |
| -ප්‍රඥාව උදෙසා: | යාකොබ් 1:5 |
| -සුවය උදෙසා: | යාකොබ් 5:14-15 |
| -පව් සමාව උදෙසා: | මතෙව් 6:12 |
| -දෙවියන්වහන්සේගේ කැමැත්ත හා රාජ්‍ය පැමිණෙන ලෙස: | මතෙව් 6:10 |
| -විපත්තියෙන් ගැලවීම උදෙසා: | යාකොබ් 5:13 |
| -ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ එක්සත් බව උදෙසා: | යොහන් 17 |
| -ලෝකය පුරා ඇති පීඩා විඳින සහාවන් උදෙසා: | හෙබ්‍රෙව් 13:3 |

## පොරොන්දු සමඟ මැදහත්කම් කිරීම

දෙවියන්වහන්සේ තම කැමැත්තට අනුකූල යාච්ඤාවන්ට පිළිතුරු දෙන අතර උන්වහන්සේගේ වචනයේ සඳහන් පොරොන්දු තුළින් උන්වහන්සේගේ කැමැත්ත එළිදරව් කර තිබේ. ඔබ මෙම පොරොන්දු මත පදනම් නොකර ඉල්ලූ විට ඔබගේ යාච්ඤාවන්ට පිළිතුරු නොලැබේ.

> **නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම් කරන පිණිස වැරදිලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)**

එය පියෙකු තම දරුවන්ට සම්බන්ධ වන ආකාරයට සමාන වේ. කිසිම දෙමව්පියෙකු තම දරුවන් ඉල්ලන හෝ ඔවුන්ට අවශ්‍ය ඕනෑම දෙයක් ඔවුන්ට දීමට බැඳී නැත. ඔහු ඇතැම් දේවල් කරනු ඇති

බව හා ඇතැම් දේවල් නොකරනු ඇති බව ඔහු පැහැදිලිව දක්වයි. මෙම සීමාවන් තුළ පියා තම දරුවාගේ ඉල්ලීමට පිළිතුරු දෙනු ඇත.

දෙවියන්වහන්සේද ඒ ආකාරමය. උන්වහන්සේ පොරොන්දු දී තිබෙන අතර ඒවා යාච්ඤාව සඳහා නිසි පදනමක් සකස් කර දෙයි. දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇත්තේ මොනවාදැයි ඉගෙන ගෙන එම පොරොන්දු අනුව යාච්ඤා කරන්න. ඔබේ බයිබලය කියවා සියලු පොරොන්දු ලකුණු කර ඔබේ යාච්ඤාව එම පොරොන්දු මත පදනම් කිරීම මෙය කළ හැකි එක් ආකාරයකි. ඔබ පොරොන්දුවක් අනුව යාච්ඤා කරන විට, ඔබ සැබවින්ම කරනුයේ දෙවියන්වහන්සේගේ වචනය නැවත උන්වහන්සේට ප්‍රකාශ කිරීම වේ. උදාරහණයක් පහත දැක්වේ :

> *"දෙවියන්වහන්ස මට අවශ්‍ය දෙය මා පැවසීමටත් පෙර ඔබ එය දන්නා නිසා ස්තූතියි (මතෙව් 6:8). යේසුස්වහන්සේගේ නාමයේ බලය හඳුනාගනිමින් ඒ නාමය තුළින් මම ඔබවහන්සේ වෙතට යමි. (යොහන් 14:4). දේව රාජ්‍යය ප්‍රකට කිරීමට ගොයමට සේවකයන් ලැබෙන මෙන් මම යාච්ඤා කරමි (මතෙව් 9:37-38)..." ආදී වශයෙන්.*

බයිබලිය පොරොන්දු සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ. මෙම පොරොන්දු විශේෂයෙන්ම යාච්ඤාව හා සම්බන්ධ වේ.

| | |
|---|---|
| -ඔබ ඉල්ලීමටත් පෙර ඔබට අවශ්‍ය දේ පියාණන්වහන්සේ දන්නා සේක: | මතෙව් 6:8 |
| -දෙදෙනෙක් යාච්ඤාවෙන් එකඟ වුවහොත්, එයට පිළිතුරු ලැබෙනු ඇත: | මතෙව් 18:19 |
| -දෙවියන්වහන්සේට සියල්ල කළ හැකිය: | මතෙව් 19:26 |
| | ලූක් 18:27 |
| -ඇදහිල්ල සමඟ එකතු වූ යාච්ඤාව බලවත්ය: | මතෙව් 21:22 |
| | මාර්ක් 11:24 |
| -ඔබ යේසුස්වහන්සේගේ නාමයෙන් ඉල්ලූ විට, එය ඉටුවනු ඇත: | යොහන් 14:14 |
| -ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙකුගේ යාච්ඤාව නිසා මහත් දේ සිදුවෙයි: | යාකොබ් 5:16 |

---

[1] බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් උදෙසා වු ප්‍රතිපත්ති උපුටා ගන්නා ලද්දේ 1992 *Personal Prayer Diary*, (Seattle, Washington: Youth With A Mission, 1991), 16

# ස්වයං-පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. කෙනෙක් යාච්ඤාවෙන් මැදහත්කම් කරන්නේ කෙසේද?

3. අප යාච්ඤාවෙන් මැදහත්කම් කළ යුත්තේ මොනවා උදෙසාද?

4. මෙම පරිච්ජේදය තුළදී ඔබ ඉගෙන ගත් බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් උදෙසා වූ ප්‍රතිපත්ති සමහරක් සාරාංශගත කරන්න.

5. යාච්ඤාවෙන් මැදහත්කම් කිරීම සඳහා ඔබට දෙවියන්වහන්සේගේ පොරොන්දු පාවිච්චි කළහැක්කේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යනය සඳහා

මැදහත්කාරකමේ යාච්ඤාවේ නිරතව සිටින ලෝක නායකයන් නගර හා ජාතින් උදෙසා යාච්ඤා කිරීම සඳහා "ආත්මික සිතියම්ගත කිරීම්" නම් උපක්‍රමයක් බොහෝවිට පාවිච්චි කර තිබේ. "ආත්මික සිතියම්ගත කිරීම" යනු නගරයක්, ජාතියක් හෝ ලෝකය එය පෙනෙන ආකාරයට නොව, එය සැබවින්ම පැවතිය යුතු ආකාරයට දැකීමට ගන්නා උත්සාහයකි. මෙම උපාය පදනම් වී ඇත්තේ ස්වාභාවික දෙයට පිටුපසින් ආත්මික යථාර්ථය පවති යන උපකල්පනය මතය. මෙහිදී දෘෂ්‍ය හා අදෘෂ්‍ය දේවල් අතර වෙනස බැරෑරුම් ලෙස සලකන අතර, ඒ මත ස්වාභාවික ලෝකයේ ස්ථාන හා තත්වයන් මත ඇති ආත්මික ලෝකයේ බලවේග හා අවස්ථාවන් පිළිබඳ වැටහීම ඇති කරයි.

අප අවට ලෝකයේ ඇති දෘෂ්‍යමාන දේවල් බොහොමයක් පිටුපස ආත්මික බලවේග ඇති බව ආත්මික සිතියම්ගත කිරීම පිළිගනියි. එමෙන්ම දෘෂ්‍යමාන දේට වඩා අදෘෂ්‍යමාන ක්ෂෙත්‍රවල යථාර්තය වඩා වැදගත් බව ආත්මික සිතියම්ගත කිරීමේදී සළකයි. ආත්මික සිතියම් ගතකිරීම තුළ අපගේ සමාජ, නගර හා ජාතින් තුළ ක්‍රියා කරන ආත්මික බලවේග හඳුනාගැනීම හා ආත්මික සටන් යාච්ඤාවේ උපක්‍රමික-මට්ටම ක්‍රියාවේ යෙදවීම අන්තර්ගත වේ.

ආත්මික සිතියම්ගත කිරීම උදෙසා වූ බයිබලීය ආඥාව ලෙස සළකනුයේ දෙවියන්වහන්සේ එසකියෙල් දිවසිවරයාට මෙසේ පැවසූ අවස්ථාවයි:

> **තවද මනුෂ්‍ය පුත්‍රය, පැතලි ගඩොළක් ගෙන ඒක නුඹ ඉදිරියෙහි තබාගන නුවරක්, එනම් යෙරුසලම, ඒකේ සිතියම් කරපන්න. (එසකියෙල් 4:1)**

ගොඩොලක් මත සිතියමක් අඳින ලෙස එසකියෙල්ට පවසනු ලැබීය. ඉන්පසු "එයට විරුද්ධව වටලා ගැනීමක් පිහිටුවන්න" යි දෙවියන්වහන්සේ ඔහුට පැවසූ සේක. මෙය සැබවින්ම භෞතික යුද්ධයක් පිළිබඳව නොව, ආත්මික යුද්ධයක් පිළිබඳව පැවසූ අවස්ථාවකි. ඉන්පසු යකඩ තැටියක් ගෙන පවුරක් මෙන් එය ඔහුටත්, නුවරටත් අතර තබා ඊට විරුද්ධව ද වටලා ගැනීමක් පිහිටුවන ලෙස ඔහුට පැවසීය.

ආත්මික සිතියම්ගත කිරීමේ මට්ටම් බොහොමයක් තිබේ. ඔබ ජිවත් වන ප්‍රදේශය හෝ නගරයේ ඔබ සිටින නිශ්චිත කොටස සිතියම්ගත කිරීම කළ හැකිය. මුළු නගරයම, නගරය හා ඒ අවට ප්‍රදේශ, ප්‍රාන්තය හෝ පළාත, හෝ මුළු රටම සිතියම්ගත කිරීම සිදු කළ හැකිය. ඇතැම් අයට රටවල් සමූහයක් වුවත් සිතියම්ගත කිරීමට අවශ්‍ය වනු ඇත.

ආත්මික සිතියම්ගත කිරීමේ කොටස් දෙකක් තිබේ: පළමුව ඔබ තොරතුරු එක්රැස් කළ යුතුය. දෙවනුව, ඔබ සොයාගත් දේවල් පිළිබඳව ඔබ යාච්ඤා කළ යුතුය. ප්‍රාදේශිය පුස්තකාලයෙන්, ඓතිහාසික කෞතුකාගාර වලින්, වාණිජ මණ්ඩලයෙන්, ප්‍රාදේශිය පුවත්පත් වල පැරණි පිටපත් සැළකීමෙන්, හෝ ඔබේ නගරයේ ඓතිහාසික සමාජය නියෝජනය කරන සාමාජිකයන් ගෙන් හෝ වැඩිහිටියන්ගෙන් (එවැන්නක් පවති නම්) ඔබට තොරතුරු ලබාගත හැකිය.

ඔබේ නගරයේ ක්‍රියාත්මක වන ආත්මික බලවේග නම් කිරීමේදී හා සිතියම්ගත කිරීමේදී පහත උපදෙස් ඔබට උපකාරයක් වනු ඇත :

## ආත්මික සිතියම්ගත කිරීම් අරමුණු :

1. නිශ්චිත භූගෝලිය ප්‍රදේශයක් උදෙසා වූ සතුරාගේ සැළසුම්, උපක්‍රම හා කුමන්ත්‍රණ හඳුනාගැනීමට.

2. මෙම දැනුම සටන් යාච්ඤාවේ බුද්ධිමය උපක්‍රමික මට්ටම වෙත යොදවා අඩුම කාලයකින් හා අඩුම අවධානමකින් හා අඩුම අහිමිවීමකින් යුතුව ජය ලැබීමට.

## ඓතිහාසික සමීක්ෂණය :

### A. නගරයේ ආරම්භය

1. නගරය ආරම්භ කළ ජනතාව වූයේ කවුරුන්ද?

2. නගරය ආරම්භ කිරීමේ ඔවුන්ගේ පෞද්ගලික හෝ සාමූහික හේතුව වූයේ කුමක්ද? ඔවුන්ගේ ඇදහිලි හා දර්ශනයන් වූයේ මොනවාද? නගරයේ අනාගතය උදෙසා වූ ඔවුන්ගේ දර්ශනය කුමක්ද?

3. නගරයේ සැබෑ නමේ විශේෂත්වය කුමක්ද? නම වෙනස් වී තිබේද? නගරය සඳහා වෙනත් නම් හෝ ප්‍රසිද්ධ නිල නාම තිබේද? මෙම නම් වලට තේරුමක් තිබේද? එය මොනයම් හෝ ආකාරයේ ආගමකට සම්බන්ධ වේද? ඒවා යක්ෂයා හෝ ගුප්ත දේවල් හා සම්බන්ධ නම්ද? ඒවායින් ආශිර්වාදය හෝ ශාප සංකේතවත් වේද?

### B. නගරයේ පසුකාලින ඉතිහාසය:

1. මුළු රටේම ඉතිහාසය තුළ නගරයේ භූමිකාව කුමක්ද?

2. නගරය තුළින් ප්‍රසිද්ධ නායකයන් බිහි වනවිට, නගරය උදෙසා වූ ඔවුන්ගේ දර්ශනය කුමක්ද?

3. නගරයේ ආණ්ඩුව හෝ දේශපාලනමය නායකත්වය තුළ විප්ලවකාරී වෙනසක් සිදු වී තිබේද?

4. නගරයේ ආර්ථිකය තුළ විශේෂ හෝ හදිස්සි වෙනස්කම් සිදු වී තිබේද? සාගත? දොම්නස? තාක්ෂණය? කර්මාන්ත? ස්වාභාවික සම්පත් සොයා ගැනීම්?

5. වෙනත් පිරිසකගේ විශේෂ පදිංචිය පිණිස ආගමනයක් සිදු වී තිබේද? මුළු නගරයේම නව භාෂාවක් හෝ සංස්කෘතියක් පිළිගැනීම සිදු වී තිබේද?

6. වෙනත් ප්‍රදේශ වලින් පැමිණි අයට හෝ සුළු ජන කොටස් වලට සළකනු ලබන්නේ කෙසේද? ජාතින් හෝ වාර්ගික කොටස් අතර සම්බන්ධතාවය කෙබඳුද? නගරයේ නීතිරීති මඟින් කවර ආකාරයක හෝ ජාතිවාදී ආකල්ප නීතිගත කර තිබේද?

7. නගරයේ නායකයන් කිසියම් පොරොන්දු කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම් කඩකර තිබේද?

8. කිසියම් යුද්ධයක් සෘජු ලෙස නගරයට බලපා තිබේද? නගරය තුළ කිසියම් හෝ ආකාරයේ සටන් ඇති වී තිබේද? ලේ වැගිරීමක් සිදු වී ඇතිද?

9. නගරය දුප්පත් හා පීඩාවට පත් අයට සළකන්නේ කෙසේද? නගරයේ නායකයන් තණ්හාවෙන් යුතු පුද්ගලයින්ද? දේශපාලන, ආර්ථික හෝ සංස්කෘතික නායකයන් හා ආයතන වල දූෂණය පිළිබඳ සාක්ෂි තිබේද?

10. නගරයට බලපා ඇති ස්වභාවික උවදුරු මොනවාද?

11. නගරයට ආදර්ශ පාඨයක් හෝ උද්යෝග වාක්‍යයක් තිබේද? එහි තේරුම කුමක්ද?

12. මිනිසුන් සවන් දෙන්නේ කවර ආකාරයේ සංගීතයකටද? එම සංගීතයෙන් ඔවුන්ට ලැබෙන පණිවුඩය කුමක්ද?

13. වර්තමානයේ නගරයේ යහපත් ලක්ෂණ විග්‍රහ කිරීමට පුද්ගලයන් බොහෝ දෙනෙක් යොදා ගනු ඇති වචන පහ මොනවාද? අයහපත් ලක්ෂණ විග්‍රහ කිරීමට ඔවුන් යොදාගනු ඇති වචන පහ මොනවාද?

## නගරයේ පවතින ආගමේ ඉතිහාසය

### A. කිතුනු නොවන ආගමක්

1. නගරය ආරම්භ වීමට පෙර එම ප්‍රදේශයේ වාසය කළ මිනිසුන්ගේ ආගමික දෘෂ්ටීන් හා වත් පිළිවෙත් මොනවාද?

2. නගරය ආරම්භ කිරීමේදී ආගමික කරුණු වැදගත් කොට සළකනු ලැබුවේද?

3. සැළකිය යුතු ප්‍රමාණයකින් කිතුනු නොවන ආගම් නගරයට ඇතුළු වී තිබේද?

4. නගරය තුළ පවතින රහසිගත සමාජ (සාතන් නමස්කාර කරන අය වැනි) මොනවාද?

5. නගරය තුළ ක්‍රියාත්මක වන මායා බලවේග, සාතන්ට අයත් කණ්ඩායම් හෝ වෙනත් ගුප්ත දේවල් මොනවාද?

### B. කිතුනු දහම

1. කවදා හෝ දවසක නගරයට කිතු දහම ඇතුළු වී තිබේ නම්, ඒ කවදාද? කවර තත්වයන් යටතේද?

2. මුල්කාලීන හෝ පසුකාලීන කිතුනු නායකයන්ගෙන් කවුරුන් හෝ සාතන් නමස්කාර කරන අය වී තිබේද?

3. මුළු නගරය තුළම සැළකූ විට කිතුනු සමාජයේ භූමිකාව වී ඇත්තේ කුමක්ද? මෙහි වෙනස්කම් සිදු වී තිබේද?

4. නගරයේ කිතු දහම වර්ධනවනවාද, එකම තත්වයේ පවතිනවාද, ක්‍රමයෙන් පිරිහෙනවාද?

### C. සම්බන්ධතා

1. නගරයේ ආගම් අතර ගැටුම් ඇති වී තිබේද?

2. කිතුනුවන් අතර ගැටුම් ඇති වී තිබේද?

3. නගරයේ සාභාවන්ගේ බෙදීම් පිළිබඳ ඉතිහාසය කුමක්ද?

## භෞතික සමීක්ෂණය

1. නගරයේ විවිධ සිතියම්, විශේෂයෙන් පැරණි සිතියම් සොයා ගන්න. නගරයේ භෞතික ලක්ෂණ වල සිදු වී ඇති වෙනස්කම් මොනවාද?

2. නගරය සැළසුම් කළ සැළසුම්කරුවන් කවුරුන්ද?

3. නගරයේ මුල් සැළසුමේ හඳුනාගත හැකි විශේෂ මෝස්තර හෝ සළකුණු තිබේද?

4. විශේෂයෙන් නගරයේ දේශපාලනික, ආර්ථික, අධ්‍යාපනික හෝ ආගමික බලය නිරූපනය කරන ගොඩනැගිලි වල, විශේෂ ගෘහ නිර්මාණ ශිල්පීමය, පිහිටීම හෝ නගරයේ මධ්‍යම ගොඩනැගිලි වලට සම්බන්ධතාවයේ විශේෂත්වයක් තිබේද?

5. මෙම ගොඩනැගිලි වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් පිහිටා ඇති නිශ්චිත භූමි ප්‍රදේශයේ කිසියම් ඓතිහාසික වැදගත්කමක් තිබේද? එම භූමියේ මුල් හිමිකරුවන් කවුරුන්ද?

6. නගරයේ උද්‍යාන හා වෙළඳ සංකීර්ණයේහි ඉතිහාසය කුමක්ද? ඒවා නියම කරන ලද්දේ හා ඒවාට ප්‍රතිපාදන සැපයුවේ කවුරුන්ද? ඒවායේ නම් වලට තිබිය හැකි විශේෂත්වයන් මොනවාද?

7. නගරයේ පවතින මූර්ති හා ස්මාරක වල පසුබිම් හා ඒවායේ තිබිය හැකි විශේෂත්වයන් මොනවාද? ඒවායින් යක්ෂ ලක්ෂණ නිරූපණය කිරීමක් හෝ මැවුම්කරුවා වෙනුවට මැවිල්ල මහිමයට පත් කිරීමක් සිදුවෙනවාද?

8. නගරය තුළ, විශේෂයෙන් පොදු ගොඩනැඟිලිවල කෞතුකාගාරවල, රංගශාලාවල හෝ ඒවා තුළ දැකිය හැකි කලාකෘතීන් මොනවාද? විශේෂයෙන් කාමුක හෝ යක්ෂයා හා සම්බන්ධ දේවල් පිළිබඳව සළකා බලන්න.

9. නගරයේ ප්‍රසිද්ධ පුරා විද්‍යාත්මක ස්ථාන තිබේද? ඒවාට තිබිය හැකි තේරුම කුමක් විය හැකිද?

10. ගබ්සා මධ්‍යස්ථාන, අසභ්‍ය පොත් සාප්පු සිනමාශාලා, ගණිකා වෘත්තිය සිදු වන ප්‍රදේශ, සූදු ක්‍රීඩා සිදුවන ස්ථාන, තැබෑරුම්, සමලිංගික ක්‍රියාකාරකම් ආදිය සිදුකෙරෙන පාපය ප්‍රදර්ශනය කරන ස්ථාන වල පිහිටීම කෙබඳුද?

11. තණ්හාව, ආත්මාර්ථය, දිළිඳුබව, අසමාන සැළකිලි, ප්‍රචණ්ඩත්වය හෝ නිතර නිතර සිදුවන හදිසි අනතුරු පිළිබඳව සැලකිල්ලට ලක් වූ ප්‍රදේශ මොනවාද?

12. සමූල ඝාතන, යුද්ධ හෝ මිනීමැරීම් තුළින් අතීතයේදී හෝ වර්තමානයේදී ලේ වැගිරීම් සිදුවුණු ස්ථාන මොනවාද?

13. ගස්, කඳු, පර්වත හෝ ගංගා වල පිහිටීම කිසියම් රටාවකන් පැහැදිලිව පෙන්නුම් කරනවාද?

14. නගරයේ කිසියම් විශේෂ පිහිටීමකට දෙවියන්වහන්සේ මහිමයට පත් නොකරන නමක් තිබේද?

15. නගරයේ උසම භූගෝලීය ස්ථානය කුමක්ද සහ එම ස්ථානයේ ගොඩනඟා ඇත්තේ හෝ පිහිටා ඇත්තේ කුමක්ද? මෙය ආධිපත්‍ය පිළිබඳ ප්‍රකාශයක් විය හැකිය.

16. ඔබේ නගරය තුළ ඇති තමන්ටම ආවේනික ලක්ෂණ ඇති කලාප හෝ ප්‍රදේශ හෝ අසල්වැසි ජන කණ්ඩායම් මොනවාද? නගරයේ වෙනස් ආත්මික පරිසරයන් ඇති ප්‍රදේශ හඳුනාගැනීමට උත්සාහ කරන්න.

## ආත්මික සමීක්ෂණය :

### A. කිතුනු නොවන

1. අතීතයේදී හෝ වර්තමානයේදී නගරය සමඟ සම්බන්ධ වී ඇති ප්‍රධාන දේවතාවන් හෝ ප්‍රාදේශීය ආත්ම වල නම් මොනවාද?

2. මන්ත්‍ර ගුරුකම්, ගුප්ත දේවල්, සාස්තර කීම්, සාතන්ට වන්දනාකිරීම, පෙරදිග ආගම්, යෙහොවා සාක්ෂිකාරයෝ, මෝමන්වරු, වෙනත් ආගම් ආදී දේවල් හා සම්බන්ධව නගරයේ ඇති උසස් ස්ථාන, අල්තාර, දේවස්ථාන, ස්මාරක හෝ ගොඩනැගිලි ආදී ස්ථාන මොනවාද? මේවා සිතියමක ලකුණු කළ විට කිසියම් රටාවක් පෙන්නුම් කරයි ද?

3. අතීතයේ සිට, නගරය ආරම්භ කිරීමට පවා පෙර සිට මිථ්‍යා ඇදහිලි පවතින ස්ථාන මොනවාද?

4. මිථ්‍යා නමස්කාර හා සම්බන්ධ චිත්‍ර හෝ වෙනත් භාණ්ඩ සහිත විවිධ සංස්කෘතික මධ්‍යස්ථාන මොනවාද?

5. නගරයේ කිසියම් නායකයෙක් හෝ නායිකාවන් දැනුවත්ව තමාව කිසියම් මිථ්‍යා දෙවි කෙනෙකුට හෝ බලවේගයකට කැපකර තිබේද?

6. මුල්කාලීන වැසියන් විසින් භූමියට හෝ නගරය ආරම්භ කළ මිනිසුන්ට කිසියම් ශාපයක්ද කර තිබේද?

**B. කිතුනු**

1. දෙවියන්වහන්සේගේ පණිවුඩකරුවන් නගරය විසින් පිළිගෙන ඇත්තේ කෙසේද?

2. එවැන්ජලිස්ත සේවය පහසු දෙයක් වී ඇති ද අපහසු දෙයක් වී ඇතිද ?

3. දේවස්ථාන පිහිටා ඇත්තේ කොහේද? ඒවායෙන් "ජීවනය ලබාදෙන" සභාවන් ලෙස ඔබ දකින්නේ මොනවාද?

4. නගරයේ සභාවන්ගේ තත්වය කෙබඳුද?

5. "නගරයේ වැඩිමහල්ලන්" ලෙස සැළකෙන කිතුනු නායකයන් කවුරුන්ද?

6. නගරයේ සෑම ප්‍රදේශයකම යාච්ඤා කිරීම පහසුද?

7. ජාති හා නිකායමය ක්ෂේත්‍ර ඔස්සේ කිතුනු නායකයන්ගේ එක්සත් බව කෙබඳුද?

8. කිතුනු සභ්‍යත්වය පිළිබඳව නගරයේ නායකයන්ගේ දැක්ම කුමක්ද?

**C. එළිදරව්ව**

1. පරිණත මැදහත්කම්කරුවන් නගරය පිළිබඳව දෙවියන්වහන්සේගෙන් ඇසෙන්නේ මොනවාද?

2. මුළු නගරයම හෝ නගරයේ ජීවිතයේ කිසියම් කොටසක් හෝ ප්‍රදේශයක් තුළ ඉහළින් පාලනය කරන බවට පෙනෙන ප්‍රදේශ වල අනන්‍යතාවයන් මොනවාද?

**දැන්...ඔබගේ අසල්වැසියන්, නගරය හෝ දේශය ගැන යාච්ඤා කිරීමට ඔබ සොයාගෙන ඇති තොරතුරු පාවිච්චි කරන්න. ඔබ විසින් හඳුනාගත් යක්ෂ ආත්මික බලවේග වලට එරෙහිව නිශ්චිතව යාච්ඤා කරන්න.**

# පස්වන පරිච්ඡේදය

## බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමට ඇති බාධාවන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් උදෙසා වූ බාධාවන් හඳුනාගැනීම හා ඒවා ඉවත් කිරීමට,
- යාච්ඤා නොකළ යුතු අවස්ථා දැන ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම්කරන පිණිස වැරදිලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)**

## හැඳින්වීම

ඔබට නිසි ලෙස මැදහත්කම් කිරීමට අවශ්‍ය නම්, ඔබ බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමකට ඇති බාධාවන් හඳුනාගෙන ඒවා ඔබේ ජීවිතයෙන් ඉවත් කළ යුතුය. “බාධාවක්” යනු, ඔබ මැදහත්කම් කිරීම වළක්වන ඔබේ මාර්ගයේ තිබෙන ඕනෑම දෙයකි.

## බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමට ඇති බාධාවන්

බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමට ඇති බාධාවන් එළිදරව් කරන පහත බයිබල් පද අධ්‍යයනය කරන්න :

| | |
|---|---|
| -ඕනෑම ආකාරයක පාපයක්: | යෙසායා 59:1-2; ගීතාවලිය 66:18; යෙසායා 1:5; හිතෝපදේශ 28:9 |
| -හදවතේ ඇති දේව රූප: | එසකියෙල් 14:1-3 |
| -සමාව නොදීමේ ආත්මය: | මාර්ක් 11:25 ; මතෙව් 5:23 |
| -ආත්මාර්ථය, වැරදි අභිප්‍රායන්: | හිතෝපදේශ 21:13; යාකොබ් 4:3 |
| -බලයට ඇති ආශාව, අන්‍යයන් මෙහෙයවන යාච්ඤාවන්: | යාකොබ් 4:2-3 |
| -විවාහ සහකරුට/සහකාරියට වැරදි ලෙස සැළකීම: | 1 පේත්‍රුස් 3:7 |
| -ස්වයං ධර්මිෂ්ඨභාවය: | ලූක් 18:10-14 |
| -අවිශ්වාසය: | යාකොබ් 1:6-7 |
| -ක්‍රිස්තුස්වහන්සේත් උන්වහන්සේගේ වචනයත් තුළ නොපැවතීම: | යොහන් 15:7 |
| -අනුකම්පා විරහිත වීම: | හිතෝපදේශ 21:13 |
| -වංචාව, උඩඟුකම, තේරුමක් නැති වචන: | මතෙව් 6:5; යෝබ් 35:12-13. |
| -දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව නොඉල්ලීම: | යාකොබ් 4:2-3 |
| -යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම: | යොහන් 16:24 |
| -සාතන් ගේ යක්ෂ බාධාවන්: | දානියෙල් 10:10-13; එපීස 6:12 |
| -පළමුව දේවරාජ්‍යය නොසෙවීම. “මේ සියල්ල” ඔබට ලැබෙන බවට පොරොන්දු වී ඇත්තේ ඔබ පළමුව දේවරාජ්‍යය සෙව්වොත් පමණි: | මතෙව් 6:33 |
| -ඔබ යාච්ඤා කළ යුතු ආකාරය ඔබ නොදන්නේ නම් යාච්ඤාවට බාධා වේ. ශුද්ධාත්මයාණන්වහන්සේට ඔබ තුළින් යාච්ඤා කිරීමට ඉඩහැරීම වැදගත් වන්නේ මේ නිසාය. | රෝම 8:26 |

## මැදහත්කමට ඇති බාධාවන් ඉවත් කිරීම.

මැදහත්කමට ඇති බාධාවන් හඳුනාගැනීම පමණක් ප්‍රමාණවත් නොවන නමුත්, ඒවා ඔබේ ජීවිතයෙන් ඉවත් කිරීමට ඔබට උදව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටීමද කළයුතු බව මතක තබා ගන්න. එසේම පිළිතුරු නොලැබෙන යාච්ඤාවන් ලෙස පෙනෙන හැම දෙයක්ම ඔබේ ජීවිතයේ බාධාවන් ඇති බව පෙන්නුම් නොකරන බවද මතක තබාගන්න. අප පළමු පරිච්ඡේදයේදී සඳහන් කළ ආකාරයට යාච්ඤාවන්ට පිළිතුරු ලැබීමට ප්‍රමාද වීම (ලූක් 18:7) හෝ අපගේ ආශාවන්ට වඩා වෙනස් ලෙස පිළිතුරු ලැබීමද (2 කොරින්ති 12:8-9) සිදුවිය හැකිය.

## යාච්ඤා නොකළ යුතු අවස්ථා

ක්‍රියා කිරීමට පෙර දෙවියන්වහන්සේ උපදෙස් හා මඟපෙන්වීම ලබා ගැනීම සඳහා උන්වහන්සේ ඉදිරියේ යාච්ඤාවෙන් බලා සිටින හා මැදහත්කම් කරන ආකාරය ඉගෙන ගැනීම වැදගත් වේ. එසේම යාච්ඤා නොකළ යුතු අවස්ථාවන් දැන ගැනීමද එලෙසින්ම වැදගත් වේ. ඇතැම් විට ඔබගේ මැදහත්කමේ යාච්ඤාවේ ප්‍රතිඵලය ලෙස තවදුරටත් යාච්ඤා කරනවා වෙනුවට ක්‍රියාකිරීමට දෙවියන්වහන්සේ ඔබට කැඳවීමක් දිය හැකිය.

ඉශ්‍රායෙල් ජනතාවට තදින්ම වතුර අවශ්‍ය වූ නමුත්, ඔවුන්ට විෂ ජලය පානය කිරීමට නොහැකිව ඔවුන් මාරා හි තික්ත ජලය අසල සිටි කතාව තුළින් මෙය පෙන්නුම් කෙරේ. මෝසෙස් මැදහත්කාරකම් කරමින් දෙවියන්වහන්සේට මොරගැසූ විට, ජලය මිහිරි රස ගැන්වීම සඳහා කළ යුත්තේ කුමක්දැයි දෙවියන්වහන්සේ නිශ්චිතවම ඔහුට පෙන් වූ සේක. තවදුරටත් යාච්ඤාවෙන් ස්වාමීන්වහන්සේ තුළ රැඳී සිටීම අවශ්‍ය වූයේ නැත. දෙවියන්වහන්සේ එළිදරව් කළ දෙයට අනුව මෝසෙස් ක්‍රියා කළ යුතු විය. හායි දේශයෙහිදී ඉශ්‍රායෙල් සෙනඟ මුහුණ දුන් දරුණු පරාජය ගැන යෝෂුවා මැදහත්කම් කළ අවස්ථාවේදීද සිදු වූයේ මේ දෙයමයි. ජනතාව අතර පාපය ඇති බව දෙවියන්වහන්සේ එළිදරව් කළ අතර,

> **"නැගිටියන්න, මක්නිසා මෙසේ මුහුණින් වැතිර ඉන්නෙහිද? ඉශ්‍රායෙල්වරු පව් කළෝය...නැඟිට සෙනඟ පවිත්‍ර කරපන්න..." (යොෂුවා 7:10,12,13 න් උපුටාගත් කොටස්) යි දෙවියන්වහන්සේ යෝෂුවාට පැවසූ සේක.**

එය තවදුරටත් යාච්ඤා කිරීමට කාලය නොවූ නමුත් යාච්ඤාවෙන් ලැබුණු මඟපෙන්වීමට අනුව ක්‍රියා කිරීමට කාලය විය. ඇතැම් මිනිසුන් දෙවියන්වහන්සේ ඔවුන්ට කරන ලෙස පවසා ඇති දෙය කිරීමෙන් වැළකී සිටීමට නිදහසට කාරණයක් ලෙස මැදහත්කම් කිරීම සිදු කරයි. බලවත් මැදහත්කම තුළින් ක්‍රියාශීලි, බලපෑමක් කළ හැකි ආකාරයේ ක්‍රියාවක් වෙත මෙහෙයවනු ලබයි. දෙවියන්වහන්සේ පිළිතුරු දී ඇති පටන් තමන් පිළිතුරට අකමැති වන විට ඇතැම් මිනිසුන් දිගින් දිගටම මැදහත්කම් කරති. ගණන් කතාව 22 හි ඇති බාලාම්ගේ කතාව නැවත බලන්න. 18-19 පද විශේෂයෙන් සළකන්න. දෙවියන්වහන්සේ බාලාම්ට පිළිතුරු දී තිබුණු නිසා එම කාරණය පිළිබඳව නැවත දෙවියන්වහන්සේ ඉදිරියට යාමට බාලාම්ට කිසිදු අයිතියක් නොවීය. (12 වන පදය බලන්න.)

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. මෙම පරිච්ඡේදයේදී සාකච්ඡා කළ බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමට ඇති බාධාවන් සමහරක් ලියා දක්වන්න.

3. ඔබ යාච්ඤා නොකළ යුත්තේ කවර විටද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යනය සඳහා

මෙම පරිච්ඡේදයේ සාකච්ජා කළ බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමට ඇති බාධාවන් ලියා දක්වන්න. ඔබේ යාචිකාවට බාධා කළ හැකි ඕනෑම කරුණක් ඉදිරියේ හරි ලකුණ යොදන්න. ඔබේ ජීවිතයෙන් මෙම බාධාවන් ඉවත් කරගත හැක්කේ කෙසේද?

# හයවන පරිච්ඡේදය

## මැදහත්කම් කිරීම සඳහා ආදර්ශ යාච්ඤාව පාවිච්චි කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- ආදර්ශ යාච්ඤාවේ අනුවාදයන් දෙකටම අදාලව බයිබල් පද සැපයීමට,
- ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව සැබවින්ම මැදහත්කමේ යාච්ඤාවක් වන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට,
- ආදර්ශ යාච්ඤාව කටපාඩමින් කීම
- මැදහත්කම් කිරීමට මාර්ගෝපදේශකයක් වශයෙන් ආදර්ශ යාච්ඤාව පාවිච්චි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **එහෙයින් නුඹලා මෙසේ යාච්ඤාකරපල්ලා. ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව. අපේ ණයකාරයන්ට අප කමාකළාක්මෙන් අපේ ණයත් අපට කමාකළ මැනව. අප පරික්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගැළවුව මැනව. (මතෙව් 6:9-13)**

## හැඳින්වීම

"ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව" හෝ "ආදර්ශ යාච්ඤාව" වශයෙන් හැඳින්වෙන යාච්ඤාවේ අනුවාද දෙකක් තිබේ. ඉන් එකක් මතෙව් 6:9-13 හි දැක්වෙන අතර අනෙක ලූක් 11:2-4 හි දැක් වේ. මෙම යාච්ඤාවන් දෙක වෙනස් යාච්ඤාවන් දෙකක් වනවාට වඩා එකම යාච්ඤාවක ආකාර දෙකක් වන බව ඒවායේ සමානතා තුළින් සාධාරණීයකරණය කරන බව බයිබල් විශාරදයෝ පවසති.

මතෙව්ගේ අනුවාදය දෙනු ලැබුවේ යේසුස්වහන්සේ කන්ද උඩ දේශනාව කළ අවස්ථාවේදීය. ලූක් පොතේ දැක්වෙන කොටස දෙනු ලැබුවේ ඊට අවුරුදු දෙකහමාරකට පමණ පසුව තමන්ට යාච්ඤා කරන සැටි උගන්වන ලෙස ඉල්ලමින් ගෝලයන් යේසුස්වහන්සේ ළඟට පැමිණි අවස්ථාවේදීය. මේ අතරතුර කාලයේදී, ගෝලයෝ යේසුස්වහන්සේ යාච්ඤා කළ ආකාරය දුටු අතර, උන්වහන්සේගේ යාච්ඤාවේ ප්‍රතිඵලයක් ලෙස වූ බලය ද සියැසින් දුටුවහුය. මේ තුළින් ගෝලයන් තුළ යාච්ඤා කරන ආකාරය ඉගෙන ගැනීමේ මහත් ආශාවක් ඇති කළ අතර, එම නිසා "අපට යාච්ඤා කරන්නට ඉගැන්වුව මැනව"යි ඔවුහු ස්වාමීන්ට පැවසූහ.

"ස්වාමීන්ගේ යාච්ඤාව" නමින් හඳුන්වනු ලබන්නට යෙදුනු වචන වලින් යේසුස්වහන්සේ පිළිතුරු දුන් සේක :

> **එහෙයින් නුඹලා මෙසේ යාච්ඤාකරපල්ලා:- ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව. අපේ ණයකාරයන්ට අප කමාකළාක්මෙන් අපේ ණයත් අපට කමාකළ මැනව. අප පරික්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගැළවුව මැනව. (මතෙව් 6:9-13)**

# මැදහත්කමේ යාච්ඤාවක්

ගෝලයන් යේසුස්වහන්සේ වෙත පැමිණ පැවසුවේ “අපට යාච්ඤා කරන්නට ඉගැන්නුව මැනව” කියා මිස “අපට යාච්ඤාවක් ඉගැන්නුව මැනව” කියා නොවේය. යුදෙව් රබ්බිවරු විසින් බහුලව යොදාගනු ලැබූ ක්‍රමයකින් යේසුස්වහන්සේ ඔවුන්ගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වූ සේක. රබ්බිවරු බොහෝ විට කිසියම් නිශ්චිත සත්‍යයන් පිළිබඳ මාතෘකා ලියා දක්වන අතර, ඉන්පසුව සෑම කරුණක් යටතේම සම්පූර්ණ සටහනක් සැපයූහ.

මෙම ආදර්ශ යාච්ඤාවෙහි දී, යේසුස්වහන්සේ ද මෙම ඉගැන්වීමේ ක්‍රමයම පාවිච්චි කළ සේක. උන්වහන්සේ මාතෘකා ලබා දී, “මෙසේ යාච්ඤාකරපල්ලා”යි උපදෙස් දුන්සේක. “මෙසේ යාච්ඤාකරපල්ලා” (ග්‍රීක් භාෂාවෙන් houtos oun) හි අදහස “මෙම කරුණු ඔස්සේ යාච්ඤා කරන්න” යනුයි. යේසුස්වහන්සේ තම ගෝලයන්ට අණ කළේ යාච්ඤාව වචනයෙන් වචනය නැවත පැවසීමට නොව “මෙසේ යාච්ඤා කිරීමට”ය.

උන්වහන්සේගේ යාච්ඤාව ආරම්භ වන්නේ “අපගේ” යන උත්තම පුරුෂ බහු වචන පදයෙනි. යාච්ඤාවේ ඉදිරියට “අපට දුන මැනව” “අප නොපමුණුවා” හා “අපට කමාකළ මැනව” වැනි ප්‍රකාශ අපට දැකිය හැකිය. ඔබ ගැන මෙන්ම ඔබ අනෙක් අය ගැනද යාච්ඤා කරන බැවින් ආදර්ශ යාච්ඤාව මැදහත්කමේ යාච්ඤාවකි.

# යාච්ඤාව විශ්ලේෂණය කිරීම

පහතින් දක්වා ඇත්තේ ආදර්ශ මැදහත්කමේ යාච්ඤාවේ කෙටි විශ්ලේෂණයකි :

## ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි :

“අපගේ පියාණෙනි” යන වචන වලින් සමීප බව පෙන්වන නමුත්, “ස්වර්ගයෙහි” යන වචනයෙන් දුරස්ථ බව හැඟවේ. කෙසේ හෝ දෙවියන්වහන්සේ සෑම තැනකම සිටින බව ගීතාවලිය 139 එළිදරව් කරයි. අප “ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණන්”ට යාච්ඤා කරන විට, එයින් අප හා පියාණන් අතර දුරස්ථ බව හඟවන්නේ නැති නමුත් එය ක්ෂණිකවම අප ස්වාභාවික ලෝකයේ සිට බලවත් ආත්මික තලයකට ගෙනයයි. අධිස්වභාවික ක්ෂේත්‍රයේ සියලුම සම්පත් දෙවියන්වහන්සේට පාවිච්චි කළ හැකි බවට හා මෙම ආදර්ශ යාච්ඤාවෙහි ඇති ඉතිරි ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්විය හැකි බවට සහතිකයක් අපට ලබා දේ. අප “ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි,” යනුවෙන් යාච්ඤා කරන විට ක්‍රිස්තුස්වහන්සේ තුළින් මැදහත්කමේ යාච්ඤාවේදී පාවිච්චි කළ හැකි අසීමිත අධිස්වාභාවික සම්පත් සහිත අධිස්වාභාවික දෙවියන්වහන්සේ සමඟ අප ක්ෂණිකවම සම්බන්ධ වන්නෙමු.

## ඔබගේ නාමයට ගෞරව වේවා :

අප දෙවියන්වහන්සේගේ පවුලේ සාමාජිකයන් වූ විට, ස්වාභාවික ලෝකයේදී හදාගන්නට ගත් දරුවෙකුට ඔහුගේ අලුත් පියාගේ නම ලැබෙන පරිදිම අපගේ ස්වර්ගික පියාණන්ගේ නාමය අපට දෙනු ලැබේ. ආත්මිකව දරුකමට හදාගැනීම තුළින් අප අපගේ පියාණන්ගේ රාජ්‍යයේ උරුමකරුවන් වන බැවින් අපට දෙවියන්වහන්සේට “පියාණන්” ලෙස කතාකිරීමේ අයිතිය හා උන්වහන්සේගේ නාමයට සම්බන්ධ සියලු ප්‍රතිලාභ ලබා ගැනීමේ අයිතිය අපට හිමි වේ.

දෙවියන්වහන්සේගේ නාමය හඳුනාගැනීමේ ලේබලයක් පමණක් නොවන නමුත් එය උන්වහන්සේගේ ස්වභාවයේ හා අනන්‍යතාවයේ ප්‍රකාශනයකි. “ඔබගේ නාමයට ගෞරව වේවා”යි අප පවසන විට අප දෙවියන්වහන්සේ යන පුද්ගලයා, උන්වහන්සේගේ බලය හා ආධිපත්‍ය ප්‍රකාශ කරන්නෙමු. ඔබ අනෙක් අය උදෙසා යාච්ඤා කරන විට, ඔවුන්ගේ ජීවිත වල ක්‍රියා කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලීමට ඔබට මෙම නම් පාවිච්චි කළ හැකිය. උදාහරණයක් පහත දැක්වේ :

> *“ඔබවහන්සේ මාගේ භාර්යාවට ජෙහොවා ෂාලොම් වන පිණිස මා ඇය උදෙසා යාච්ඤා කරමි. මේ දවසේදී ඇගේ සියලු අවශ්‍යතා සපුරාලමින් ඔබවහන්සේ ඇය උදෙසා ජෙහොවා ජයිරේ වන මෙන් යාච්ඤා කරමි. ජෙහොවා නිස්සේ දෙවිඳුනි, ඔබවහන්සේ ඇගේ ජීවිතයේ ධජය වන මෙන් යාච්ඤා කරමි. ඔබවහන්සේ ජෙහොවා මකාදෙශ් මෙන් ඇගේ ජීවිතය පවිත්‍ර කරන මෙන් යාච්ඤා කරමි...” (වෙනත්)*

පහත ලැයිස්තුව දෙවියන්වහන්සේගේ නාමයන් හත හා ඒවායේ තේරුම පෙන්නුම් කරයි:

| **නම** | **තේරුම** | **සඳහන** |
|---|---|---|
| ජෙහොවා - සිඩ්කේනු | ධර්මිෂ්ඨ වූ ස්වාමීන්වහන්සේ | යෙරමියා 23:6 |
| ජෙහොවා - මකාදෙශ් | ශුද්ධ කරන ස්වාමීන්වහන්සේ | නික්මයාම 31:13 |
| ජෙහොවා - ෂාලොම් | ස්වාමීන්වහන්සේ සමාදානයයි | විනිශ්චයකාරයා 6:24 |
| ජෙහොවා - ෂම්මා | ස්වාමීන්වහන්සේ සිටි | එසකියෙල් 48:35 |
| ජෙහොවා - රාෆා | ස්වාමීන්වහන්සේ සුවකරන සේක | නික්මයාම 15:26 |
| ජෙහොවා - ජිරේ | ස්වාමීන්වහන්සේ මාගේ සැපයුම්කරුවාණෝය | උත්පත්ති 22:14 |
| ජෙහොවා - නිස්සි | ස්වාමීන්වහන්සේ මාගේ ධජයය යි | නික්මයාම 17:15 |
| ජෙහොවා - රෝහි | ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාණෝය | ගීතාවලිය 23:1 |

## ඔබගේ රාජ්‍යය ඒවා :

ග්‍රීක්, හෙබ්‍රෙව් හා ඇරමෙයික් යන භාෂා වල දෙවියන්වහන්සේගේ “රාජ්‍යය” යන්නෙන් අදහස් වන්නේ දෙවියන්වහන්සේගේ රජ පදවිය, රජකම් කිරීමේ, හෝ පාලනය කිරීමේ ක්‍රියාවයි. එය ක්‍රියාවේදී දෙවියන්වහන්සේගේ ස්වභාවය ප්‍රකාශකිරීමයි.

දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වන ප්‍රදේශය එහි විශ්වීය සංවිධානය වන දෙවියන්වහන්සේගේ රාජ්‍යය ලෙස සැලකිය හැක. එහි ප්‍රාදේශීය දෘෂ්‍ය සංවිධානය වන සභාව තුළින් රාජ්‍යය ව්‍යජ්ත වේ. එම රාජ්‍යයට අයත් වන්නේ නැවත උපත ලැබූ සැබෑ ඇදහිලිවන්තයන් වේ.

අනාගතයේ දවසකදී දෙවියන්වහන්සේගේ රාජ්‍යය දෘෂ්‍ය ආකාරයකින් පිහිටුවනු ඇත. මෙය සිදුවන දිනය අපි හරියටම නොදනිමු (ක්‍රියා 1:7). නමුත් දේව වචනයට අනුව එය අනිවාර්යයෙන්ම සිදුවේ. “ලෝකයේ සියලුම රාජ්‍යයන්” දෙවියන්වහන්සේට අයිති වී, සාතන්ගේ නපුරේ රාජ්‍යය පරාජය කරනු ලබනු ඇති අතර අපගේ රජතුමා සදහටම රජකම් කරනු ඇත (එළිදරව් 11:15).

රාජ්‍යය පිළිබඳ ප්‍රධාන පණිවුඩය නව ගිවිසුමේ වාර්තා තුළ පැහැදිලි වේ. එය මතෙව් පොත තුළ 49 වතාවක්ද, මාර්ක් පොත තුළ 16 වතාවක්ද, ලූක් පොත තුළ 38 වතාවක්ද සඳහන් වී තිබේ. යේසුස්වහන්සේ පෘථිවියේ තම සේවය ආරම්භ කළේ රාජ්‍යයේ පැමිණීම ප්‍රකාශ කිරීමෙනි (මතෙව් 4:17). උන්වහන්සේ තම පෘථිවියේ සේවය අවසන් කළේ රාජ්‍යයට අදාළ දේවල් ගැන කතා කිරීමෙනි (ක්‍රියා 1:3). උන්වහන්සේගේ පෘථිවියේ සේවයේ ආරම්භය හා අවසානය අතරමැද, සැමවිටම විශේෂකොට දැක්වූයේ රාජ්‍යය විය. උන්වහන්සේ එහි පණිවුඩය වෙනත් තැන් වල දේශනා කළ යුතු බව නිරන්තරයෙන් ප්‍රකාශ කළ සේක (ලූක් 4:43). යේසුස්වහන්සේගේ සෑම උපමාවක්ම රාජ්‍යයට සම්බන්ධ වූ අතර උන්වහන්සේගේ ජීවිතය එහි ප්‍රතිපත්ති වලට අනුව හැඩගැසී තිබුණි.

ඇදහිලිවන්තයන් ලෙස අපද, රාජ්‍යය කෙරෙහි එවැනි විශේෂත්වයක් දැක්විය යුතු බව යේසුස්වහන්සේ දැක්වූ සේක:

> **නුමුත් පළමුකොට උන්වහන්සේගේ රාජ්‍යයද උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයාපල්ලා; මේ සියල්ලත් නුඹලාට දෙනු ලබන්නේය. (මතෙව් 6:33)**

අප අපගේ යාච්ඤාවන්, දේශනාවන්, ඉගැන්වීම් හා ජීවිතය කේන්ද්‍රගත කළ යුත්තේ කුමක් කෙරෙහිද යන්න මෙම පදයෙන් දැක්වේ. ඒ සියල්ල දෙවියන්වහන්සේගේ රාජ්‍යය ඉලක්ක කරගත යුතුය. අප “පළමුකොට දේව රාජ්‍යය සෙව්වහොත් ”, ආදර්ශ යාච්ඤාවේ ඉතිරි කොටස් වලට පිළිතුරු ලැබෙන බව එමඟින් සහතික කරයි.

“ඔබගේ රාජ්‍යය ඒවා” යනුවෙන් කරනු ලබන යාච්ඤාව යේසුස්වහන්සේ නැවත පැමිණ එහි අවසන් ස්වරූපයෙන් දේව රාජ්‍යය පිහිටුවන ලෙස ඉල්ලා කරන යාච්ඤාවකට වඩා වැඩි යමකි. “ඔබගේ රාජ්‍යය

ඒවා" යනුවෙන් අප යාච්ඤා කරන විට, අප සැබවින්ම ප්‍රකාශ කරනුයේ අපගේ පියාණන්වහන්සේ සියලු ඇදහිලිවන්තයන්ගේ, නොඇදහිලිවන්තයන්ගේ හා මුළු මහත් පෘථිවියම මත රජ කරනු ඇති බවයි. දෙවියන්වහන්සේ රජතුමා ලෙස ප්‍රකාශ කරනු ලැබ, පොළොව මත ඇති සියලු ජීවිත උන්වහන්සේගේ අණට අනුව පාලනය කරනු ලැබෙන මෙන් අප මැදහත්කම් කරමු.

"ඔබගේ රාජ්‍යය ඒවා" යනුවෙන් අප යාච්ඤා කරන විට, අප සැබවින්ම දෙවියන්වහන්සේගෙන් අසනුයේ වචන, ආකල්ප, ආශාවන්, හැසිරීම හා වෙනත් දේවල්ද ඇතුළුව අප තුළ හා අන් අය තුළ ඇති උන්වහන්සේගේ රාජ්‍යයට විරුද්ධ සියල්ල වෙනස් කරන මෙන්ය.

## ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා :

දෙවියන්වහන්සේ පිළිබඳව සඳහන් කිරීමේදී "කැමැත්ත" යන්නට ග්‍රීක භාෂාවේ වචන දෙකක් පාවිච්චි කරනු ලැබේ. "boulema" යනු එක් වචනයකි. මෙයින් අදහස් වන්නේ විශ්වයේ සිදු වන සැම දෙයක් පිළිබඳවම උන්වහන්සේ විසින් කලින් නියමකරන ලද සැළැස්ම මිනිසා විසින් ගනු ලබන තීරණ වල බලපෑමකින් තොරව සම්පූර්ණ වේ. එය ලෝකය උදෙසා වූ උන්වහන්සේගේ විශාලතම සැළැස්ම වන අතර උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ කැමැත්ත මත පදනම්ව උන්වහන්සේ ලෝකයේ සියලුම දේවල් ඉටු කරමින් සිටී.

> **එසේය, තමන්ගේ කැමැත්තේ මන්ත්‍රණය හැටියට සියල්ල සිද්ධ කරන්නාවූ තැනන්වහන්සේගේ නියමයේ ප්‍රකාරයට, අපි පෙර නියමකරනු ලැබ ක්‍රිස්තුස් වහන්සේ තුළ උරුමයක්වී සිටිමුව. (එපීස 1:11)**

"boulema" නම් දෙවියන්වහන්සේගේ කැමැත්තට මනුෂ්‍යයාගේ සහයෝගය අවශ්‍ය නොවේ. "boulema" නම් දෙවියන්වහන්සේගේ කැමැත්තේදී. අවසන් ප්‍රතිඵලය කලින් තීරණය කර තිබේ. දෙවියන්වහන්සේගේ "boulema" නම් කමැත්ත උන්වහන්සේගේ වචනයේ ලියා ඇති අතර එය බොහෝ දුරට පැහැදිලිය. දෙවියන්වහන්සේගේ කැමැත්ත උන්වහන්සේගේ වචනයේ එළිදරව් කර ඇති බැවින් එය සෙවීමට අවශ්‍ය නොවේ.

දෙවියන්වහන්සේගේ කැමැත්ත උදෙසා වූ අනෙක් වචනය "thelema" වන අතර සැම පුරුෂයෙක් හා ස්ත්‍රියක් උදෙසාම වූ උන්වහන්සේගේ ඒක පුද්ගල සැළැස්ම හෝ කැමැත්ත එමඟින් දැක්වේ. දෙවියන්වහන්සේට උන්වහන්සේගේ "thelema" කැමැත්ත සම්පූර්ණ කර ගැනීම සඳහා මිනිසාගේ සහයෝගය අවශ්‍ය වේ. තමන් දෙවියන්වහන්සේගේ "thelema" කැමැත්ත තුළ ජීවත් වනවාද? නැද්ද? යන්න තෝරාගැනීමට මිනිසුන්ට බලය තිබේ. ඔබ උදෙසා අන් අය උදෙසා "ඔබගේ කැමැත්ත කරනු ලැබේවා" යනුවෙන් ඔබ යාච්ඤා කරන විට, දෙවියන්වහන්සේගේ "thelema" කැමැත්ත ඉටුවන මෙන් ඔබ මැදහත්කම් කරයි.

## අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව :

ආදර්ශ යාච්ඤාව තුළ, "ඔබගේ රාජ්‍යය ඒවා" යනුවෙන් ප්‍රකාශ කරන විට අප විසින් සිදු කරනුයේ අපගේ ජීවිතයේ සැම තත්වයකටම ඉහළින් මුලින්ම දේව රාජ්‍යය සෙවීමයි. "ඔබගේ කැමැත්ත කරනු ලැබේවා !"යි පවසමින් අප ධර්මිෂ්ඨකම තුළ අපගේ ස්වර්ගීය පියාණන්ගේ කැමැත්තට යටත් වන්නෙමු. දැන් අපට නිසැකකම ඇතිව, උන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ කරමින් හා උන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශ කිරීමේ හැකියාව ලබා දෙන මෙන් ඉල්ලමින්, "අප දවස්පතා භෝජනය අපට අද දුන මැනව" යනුවෙන් යාච්ඤා කළ හැකිය.

"දුන මැනව" යන වචනයෙන් හඟවන්නේ දෙවියන්වහන්සේ නිකායක් හෝ සමාගමක චෙක්පතක් හෝ නොව, අපගේ මූලාශ්‍රය වන බවය. මෙම ආදර්ශ යාච්ඤාව තුළ "දවස්පතා" යනුවෙන් පරිවර්තනය කර ඇති ග්‍රීක වචනය බයිබලයේ වෙනත් තැනක නොදැක්වේ. එහි අදහස, "අපගේ පැවැත්මට සෑහෙන හා උපකාරී වන, අවශ්‍ය හෝ අත්‍යවශ්‍ය ආහාර" යන්නයි. මෙම පසුබිම් තුළ එය පාවිච්චි කර තිබීමෙන් යේසුස්වහන්සේ ඉගැන්වූ ආදර්ශ යාච්ඤාව දිනපතා යාච්ඤා කළ යුතු බව තහවුරු වේ.

යාච්ඤාව ආත්මික හා ද්‍රව්‍යමය යන දෙආකාරයේම පැවැත්ම සඳහා අවශ්‍ය වූ "භෝජනය" උදෙසාය. "අප" උදෙසා යන්නෙන් පෙන්නුම් කරන්නේ අන් අය උදෙසා ද මෙම "දවස්පතා භෝජනය" සපයනු ලබන ලෙස අප මැදහත්කම් කරන බවය.

## අපේ ණයකාරයන්ට අප කමා කළාක් මෙන් අපේ ණයත් අපට කමා කළ මැනව :

අපගේ පෞද්ගලික වැරදි වලට සහ අන් අය විසින් කරන ලද අයුතුකම් වලට සමාව ලැබීම හා සමාව දීම යන දෙකම අප ඉගෙන ගත යුතුය. පෞද්ගලික වැරදි සිදු වන්නේ ඔබගේම වැරදි වලින් ඔබ දෙවියන්වහන්සේට වැරදි කළ විටය. "අපේ ණයත් අපට කමා කළ මැනව"යි පවසන විට ඔබට සමාව ලබා දෙන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලමින් ඔබ ඒවා සමඟ ගණුදෙනු කරන්නේය. බයිබලය මෙසේ පවසයි :

> **අපට පාපය නැතැයි කියමු නම්, අපි අපම රවටාගනිමුව, සැබෑවද අප තුළ නැත. අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. (1 යොහන් 1:8-9)**

ඔබ ඔබේ පව් කියාදෙන විට, ඔබ සියලු අපවිත්‍රකම් වලින් පවිත්‍ර කරමින් ඔබ පැවසූ පාපයන්ට මෙන්ම ඔබ නොදන්නා පාප වලටද දෙවියන්වහන්සේ සමාව දෙන සේක.

සමාවදීම ප්‍රකාශ විය යුතු අනෙක් ක්ෂේත්‍රය නම් අන් අයගේ සෘජු හා වක්‍ර වැරදි වලට ඔවුන්ට සමාව දීමයි. සෘජු වැරදි සිදුවන්නේ ඔබට වෙනත් කෙනෙක්ගෙන් වරදක් සිදු වූ විටය. වක්‍ර වැරදි සිදු වන්නේ කෙනෙකු ඔබගේ මිතුරෙකුට හෝ ඥාතියෙකුට වරදක් කළ විට ඔබ එය ඔබට කල දෙයක් ලෙස භාරගත් විටය. "අපගේ ණයකාරයන්ට අප කමා කළාක් මෙන් අපේ ණයත් අපට කමා කළ මැනව" යනුවෙන් යාච්ඤා කරමින් අප එවැනි වැරදි සමඟ ගනුදෙනු කළ යුතු බව යේසුස්වහන්සේ ඉගැන්වූ සේක.

මෙම පදය ග්‍රීක් බසින් කියවූ විට එහි අදහස "අප අපගේ ණයකාරයන්ට කමා කළාක් මෙන්" යනුය. ඒ අනුව එම පදය කියවිය යුතු වුයේ "අප අපගේ ණයකාරයන්ට කමා කර ඇති ලෙස අපේ ණයත් අපට කමා කළ මැනව" යනුවෙනි. මෙහි අදහස නම්, අප දෙවියන්වහන්සේට විරුද්ධව කළ පව් වලට කමාව ඉල්ලීමට පෙර, අපට විරුද්ධව පව් කළ අයට අප සමාව දිය යුතුය යන්නයි. මතෙව් 18:22-35 හි සඳහන්, අධර්මිෂ්ඨ සේවකයා පිළිබඳ උපමාවේදී යේසුස්වහන්සේ මෙම ප්‍රතිපත්තිය ඉගැන්වූ සේක.

මෙම කතාවෙන් දැක්වෙනුයේ, දෙවියන්වහන්සේගේ සමාව දීමට පෙර මනුෂ්‍යයා සමාව දීම සිදු කළ යුතු බවයි. මනුෂ්‍යයාට සමාව දීම දෙවියන්වහන්සේගේ සමාව දීමේ ප්‍රතිරූපයක් වන අතර දෙවියන්වහන්සේගේ සමාව දීම අප උදෙසා සත්‍යයක් වනුයේ අප එකිනෙකාට සමාව දීමට කැමති වන්නේ නම් පමණි.

> **නුඹලා යාච්ඤාකරමින් සිටින කල ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ නුඹලාගේ වරද නුඹලාට කමාවන පිණිස යමෙකුට විරුද්ධව යමක් නුඹලාට ඇත්නම් නුඹලාත් කමාවෙයල්ලා. නුමුත් නුඹලා කමානොවනවා නම් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ නුඹලාගේ වරදවලටත් කමා නොවනසේක. (මාර්ක් 11:25)** යි පැවසූ විට යේසුස්වහන්සේ මෙම සත්‍යයන් සාරාංශකර දැක් වූ සේක.

සාතන් ඔබගේ පවුල තුළ, මිතුරන් අතර, ඔබගේ ව්‍යාපාරික සම්බන්ධතාවයන් හා ඔබගේ සභාවේ අය අතර වැරදි සිදු වීමට සළස්වයි. "බාධා පැමිණෙන්නට ඕනෑය" (මතෙව් 18:7) යයි බයිබලය සඳහන් කරයි. මේවා සමඟ ගණුදෙනු කරන්නේ කෙසේද? ඔබ යාච්ඤාවෙන් ඒවා උදෙසා මැදහත්කම් කරනවාද නොඑසේනම් ඕපා දූප ලෙස ඒවා ගැන කතා කරමින් සිටිනවාද?

## අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගැළවුව මැනව :

"අප පරීක්ෂාවට නොපමුණුවන" ලෙස යාච්ඤා කරන ලෙස යේසුස්වහන්සේ ඉගැන්වූ නමුත්, දෙවියන්වහන්සේ මිනිසා පරීක්ෂා නොකරන බව යාකොබ් පවසන්නේය.

> **යමෙක් පරීක්ෂාකරනු ලබන කල: මම දෙවියන්වහන්සේගෙන් පරීක්ෂාකරනු ලබමියි නොකියාවා. මක්නිසාද දෙවියන්වහන්සේ නපුරෙන් පරීක්ෂාකරනු ලබන්ට නුපුළුවන. උන්වහන්සේම කිසිවෙකු පරීක්ෂා නොකරනසේක. (යාකොබ් 1:13)**

එසේ නම් යේසුස්වහන්සේ සඳහන් කරන පරීක්ෂා කරන්නා කවුද? මෙය අපගේ සතුරා වන සාතන්ගේ භූමිකාව බව බයිබලය පැහැදිලිව එළිදරව් කරයි (මතෙව් 4:3; 1 තෙසලෝනික 3:5). යක්ෂයාගෙන්

පැමිණෙන පරීක්ෂාවන් පිළිබඳව බයිබලය නැවත නැවත අනතුරු අඟවයි. (මතෙව් 4:1; 1 කොරින්ති 7:5; 1 තෙසලෝනික 3:5). බයිබලය මෙසේ පැහැදිලි කරයි...

> **නුමුත් එක එක මනුෂ්‍යයා තම තමාගේ තෘෂ්ණාවෙන් අදිනු ලබන කල්හිද පරීක්ෂාකරනු ලබයි. එවිට තෘෂ්ණාව පිළිසිඳගත් කල්හි පාපය වදන්නිය. පාපයද සම්පූර්ණවූ කල්හි මරණය උපදවයි. (යාකොබ් 1:14-15)**

සාතන් පරීක්ෂාව ගෙන එන තැනැත්තා වේ. නමුත් අප ඔහුගේ උගුලට හසුවන්නේ අපගේ මාංශික ආශාවන්ට අප පෙළඹවීමට ඉඩහැරියහොත් පමණි. එවැනි ආශාවන් පාපය උපදවන අතර පාපයේ ප්‍රතිඵලය මරණය වේ. සාතන්ගේ ඇතැම් ප්‍රහාරයන් පැමිණෙන්නේ අප අභ්‍යන්තරයේ ඇති පාලනය නොකරන ලද නපුරු ආශාවන් තුළිනි. තවත් විටෙක ඇසීම, දැකීම, දැනීම, ස්පර්ශය හා රස බැලීම යන අපගේ සංවේද වලින් තොරවද පරීක්ෂාව පැමිණේ. එහි ආරම්භය කුමක් වුවත්, අපෝස්තුළුවර පාවුල් අපට පහත සහතිකය ලබාදෙයි.

> **මනුෂ්‍යයා විසින් ඉසිලිය හැකි පරීක්ෂාවක් මිස අනිකක් නුඹලාට පැමුණුණේ නැත. නුමුත් දෙවියන්වහන්සේ විශ්වාස කෙනෙක්ය. උන්වහන්සේ නුඹලාගේ පුළුවන්කමට වඩා නුඹලා පරීක්ෂාකරනු ලබන්ට ඉඩ නොදී, නුඹලාට පරීක්ෂාව ඉවසිය හැකිවන පිණිස ඒ සමඟ ගැළවෙන මාර්ගයද සාදාදෙනසේක. (1 කොරින්ති 10:13)**

"අප පරීක්ෂාවට නොපමුණුවා" යනුවෙන් යාච්ඤා කරන විට, අප දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්නේ අප පාපයට පොළොඹවනු ලැබීමෙන් වළක්වන ලෙසයි. යේසුස්වහන්සේ පවා පරීක්ෂාවට ලක් කරනු ලැබිය, නමුත් උන්වහන්සේ ඒ තුළ ආරක්ෂා කරනු ලැබිය (හෙබ්‍රෙව් 4:18). අපෝස්තුළුවර යොහන් අපට පහත සහතිකය ලබා දෙයි :

> **දෙවියන්වහන්සේගෙන් ඉපදී සිටින කිසිවෙක් පව් නොකරන බව අපි දනිමුව; එහෙත් දෙවියන්වහන්සේගෙන් උපන් තැනැත්තේ තමාම ආරක්ෂා කරගන්නේය. නපුරා ඔහුට අතගසන්නේ නැත (1 යොහන් 5:18).**

එපිස 6:10-18 දක්වා නපුරා පිළිබඳව හා අපේ ආරක්ෂාව උදෙසා දෙවියන්වහන්සේ සපයා ඇති ආත්මික අවි ආයුධ පිළිබඳව අපෝස්තුළුවර පාවුල් විස්තරාත්මකව තොරතුරු දක්වයි. අප දෙවියන්වහන්සේ තුළ හා උන්වහන්සේගේ මහත් බලය තුළ ශක්තිමත්ව නපුරු බලවේග ඉදිරියේ නිර්භිතව සිටගත යුතු බව පාවුල් ප්‍රබල ලෙස පවසා සිටියේය. (එපිස 6:10,11,13). යක්ෂයාගේ සෑම ප්‍රයෝගයකටම (වංචාව, කපටිකම, මුලාව) එරෙහිව නැගී සිටීම කළ හැකි දෙයක් බව ඔහු ස්ථිරවම පවසයි. අප හොඳ සංග්‍රාමයක් සටන්කර (1 තිමෝති 1:18), ඇදහිල්ලේ බලවත් සටනක් සටන් කර (1 තිමෝති 6:12) අරමුණක් ඇතිව බුද්ධිමත්ව සටන් කළ යුතු බවට (1 කොරින්ති 9:26) පාවුල් අවවාද කරයි.

සටන ස්වාභාවික එකක් නොවන බැවින් ස්වාභාවික ආයුධ වලින් පලක් නැති බව පාවුල් අවධාරණය කරයි. ආත්මික සටන් කළ යුත්තේ ආත්මික ආයුධ වලිනි :

> **එබැවින් නපුරු දවසේදී විරුද්ධව සිටින්ටත් සියල්ල සම්පූර්ණකරගන ස්ථිරව සිටින්ටත් පුළුවන්වෙන පිණිස, දෙවියන්වහන්සේගේ සියලු යුද්ධායුධ අරගනිල්ලා, එබැවින් නුඹලාගේ ඉඟටි සැබෑකම නමැති පටියෙන් බැඳගෙන, ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම පැළඳගෙන, සමාදානයේ ශුභාරංචියේ සූදානම නමැති වහන් පය ලා සිටපල්ලා. ඒ සියල්ල ඇර, ඇදහිල්ල නමැති පලිහ අරගනිල්ලා. එයින් නපුරාගේ සියලු ගිනිහෙල්ල නිවන්ට නුඹලාට පුළුවන්වන්නේය. ගැළවීම නමැති ආරක්ෂාතොප්පියද, දෙවියන්වහන්සේගේ වචනය නැමති ආත්මයාණන්වහන්සේගේ කඩුවද ගනිල්ලා. සියලු යාච්ඤාවලින්ද ඉල්ලීම්වලින්ද සියලු කාලවලදී ආත්මයාණන් කරණකොටගෙන යාච්ඤාකරපල්ලා. (එපිස 6:13-18)**

ආයුධ වල අරමුණ සතුරා වන සාතන්ගේ ප්‍රයෝග වලට විරුද්ධව සිට ගැනීමට හැකි වීමයි. මෙම ආත්මික ආයුධ "පැළඳගනිල්ලා" යනුවෙන් පාවුල් ඔබට අණ කරන අතර එහි අදහස දෙවියන්වහන්සේ පවසා ඇති දෙය සුදුසු ලෙස යොදාගැනීමේ වගකීම ඔබ සතු වන බවයි. "පැළඳ ගැනීම" යනුවෙන් අදහස් වන්නේ ඔබ යමක් තදින් අල්ලා ගෙන එය ඔබට අදාළ කර ගැනීමයි. ඔබ වෙනුවෙන් හා අන් අය වෙනුවෙන් ඔබ දිනපතා මැදහත්කම් කරන විට එසේ අදාළ කරගත යුතු අයුරු පහත දැක්වේ :

| ආයුධය | කළ යුතු ප්‍රකාශය. | ප්‍රකාශ කළ යුතු පොරොන්දුව. | බැඳිය යුතු විරුද්ධ ආත්මය. |
|---|---|---|---|
| සැබෑකම නමැති ඉඟපටිය | යේසුනි, ඔබ මාගේ සත්‍යයි. | යොහන් 14:6 | රැවටිල්ල |
| ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම | යේසුනි, ඔබ මාගේ ධර්මිෂ්ඨකමයි | 2 කොරින්ති 5:21 | අධර්මිෂ්ඨකම |
| ශුභාරංචිය නමැති පාවහන් | යේසුනි, ඔබ මාගේ සුදානමයි | පිලිප්පි 4:13 | අලසබව |
| ඇදහිල්ල නමැති පලිහ | යේසුනි, ඔබ මාගේ ඇදහිල්ලයි | ගලාති 2:20 | අවිශ්වාසය, සැකය |
| ගැළවීම නමැති හිස්වැස්ම | යේසුනි, ඔබ මාගේ ගැළවීමයි | හෙබ්‍රෙව් 5:9 | වැරදි ඇදහිලි නපුරු සිතුවිලි |
| ආත්මයාණන්වහන්සේගේ කඩුව (දේව වචනය) | යේසුනි, ඔබ මාගේ ජීවමාන වචනයයි. | යොහන් 1:14 | සාතන්ගේ බොරු |

## මක්නිසාද රාජ්‍යයද බලයද මහිමයද සදහටම ඔබවහන්සේගේය:

"මක්නිසාද" යන වචනය තුළින් ආදර්ශ යාච්ඤාව පවසනු ලැබූ ආධිපත්‍යය පෙන්නුම් කරයි. එහි අදහස රාජ්‍යය ද, බලය ද, මහිමය ද, දෙවියන්වහන්සේට අයිති "බැවින්" මෙම යාච්ඤාවේ සඳහන් නියෝගයන්, පොරොන්දු හා ආරක්ෂාව අපට ප්‍රකාශ කළ හැකිය. අප මෙම ආදර්ශ යාච්ඤාවේ අවසාන කොටස වෙත පැමිණ "රාජ්‍යය ඔබවහන්සේගේය" යනුවෙන් ප්‍රකාශ කරන විට, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ රාජ්‍යය ගැන පවසන හැම දෙයක් ගැනම අපි එකඟත්වයකට පැමිණෙන්නෙමු.

> **කුඩා රැළ, භය නොවෙල්ලා; මක්නිසාද නුඹලාට රාජ්‍යය දෙන්ට නුඹලාගේ පියාණන්වහන්සේ ප්‍රසන්නව සිටිනසේක. (ලූක් 12:32)**

එය උන්වහන්සේගේ රාජ්‍යය වන නමුත්, උරුමකරුවන් ලෙස, එය අපගේ රාජ්‍යය ද වේ. එය අපගේ පියාණන්වහන්සේ විසින් පවරා දුන් උරුමයක් වන අතර එය අපට දීම උන්වහන්සේට ප්‍රසන්නව තිබේ.

බලය සඳහා වන වචනය "dunamis" වන අතර "dynamic" හා "dynamite" යන ඉංග්‍රීසි වචන ඉන් බිඳී ආ ඒවා වේ. "බලය ඔබවහන්සේගේය"යි පවසමින් අප අපගේ යාච්ඤාව අවසන් කරන විට, අප සඳහන් කරනුයේ අපගේ ඉල්ලීම් සපුරාලීමට ඩයිනමයිට් වැනි වූ හැකියාවක් ඇති දෙවියන්වහන්සේගේ ගතික බලය පිළිබඳව වේ. "බලය ඔබවහන්සේගේය" යනුවෙන් අප ප්‍රකාශ කරන විට, "සතුරාගේ සියලු බලයට එරෙහි බලය මම ඔබට දෙමි" යන යේසුස්වහන්සේගේ වදන් දෙවියන්වහන්සේ අපට නැවත මතක් කර දෙන සේක. ආදර්ශ යාච්ඤාව තුළ ඔබ මැදහත්කම් කළ සියල්ලටම පිළිතුරු ලැබෙන බව මෙය සහතික කරයි.

ඉන්පසුව අපි, "මහිමය ඔබවහන්සේගේය" යනුවෙන් ප්‍රකාශ කරන්නෙමු. "මහිමය" යනු ඉංග්‍රීසි භාෂාවේ ඇති පොහොසත්ම වචන වලින් එකකි. කිසිඳු තනි වචනයකට එහි අර්ථයට සමාන අදහසක් දිය නොහැකි නමුත් එය විග්‍රහ කරන වචන කිහිපයක් පහත දැක්වේ: ගෞරවය, ප්‍රශංසාව, තේජස, ප්‍රභාව, බලය, උසස් බව, වටිනාකම, සමානත්වය, අලංකාරය, කීර්තිය, හා තත්වය වේ. යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක:

> **අප ඒකත්වයක්ව සිටින්නා සේම ඔවුනුත් ඒකත්වයක් වන පිණිස ඔබ මට දුන් මහිමය ඔවුන්ට දුනිමි. (යොහන් 17:22)**

පියාණන්වහන්සේ විසින් යේසුස්වහන්සේ මහිමයට පත් කරනු ලැබූ මහිමයම ඔබටත් තිළිණයක් ලෙස ලැබී ඇත. ඔබට ඇත්තේ එය ප්‍රකාශ කිරීම පමණි. ඔබ පරාජයෙන් පරාජයට නොව "මහිමයෙන්

මහිමයට" ගමන් කළ යුතුය. ආත්මිකව ඇල් මැරුණු හා අප්‍රාණික බවක් දැනෙන විට ඔබ අධෛර්යට පත්ව බලාපොරොත්තු සුන් වූ තත්වයට පත්විය හැකිය, නමුත් අද දවසේ ඔබ උදෙසා වූ දෙවියන්වහන්සේගේ වචනය නම්...

> **නැගිට බැබළියන්න. මක්නිසාද නුඹේ ආලෝකය පැමුණුණේය, ස්වාමින්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය. එසේය, පොළොව අන්ධකාරයෙන්ද ජනයෝ තද අන්ධකාරයෙන්ද වසනු ලබන්නෝය. නුමුත් නුඹ කෙරෙහි ස්වාමින්වහන්සේ උදාවනසේක, උන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි පෙනෙන්නේය. (යෙසායා 60:1-2)**

දෙවියන්වහන්සේගේ මහිමය පහත දේවල් සහතික කරයි :

| | |
|---|---|
| -සැපයීම : | පිලිප්පි 4:19; එපිස 3:16 |
| -ශක්තිය : | කොලොස්සි 1:11 |
| -ප්‍රීතිය : | යෙසායා 66:5; 1 පේත්‍රුස් 1:8; 2 ලේකම් 16:10 |
| -නිදහස : | යෙසායා 60:1 |
| -විවේකය : | යෙසායා 11:10 |
| -ශුද්ධකම : | නික්මයාම 29:43 |
| -අනෙක් ඇදහිලිවන්තයන් සමඟ එක්සත්බව : | යොහන් 17:22 |

"සදහටම" යන වචනය මඟින් පවසන දේ "සදාකාලික, අවසානයක් නොමැති" බව ප්‍රකාශ කරයි. ඔබ ඔබේ යාච්ඤාව අවසන් කරන විට, ඔබේ පියාණන්ට රාජ්‍යයද, බලයද, මහිමයද, සදහටම හිමිකර දෙන්නේය. ඔබේ පියාණන්ගේ රාජ්‍යයද, බලයද, මහිමයද, ඔබටත් හිමි බව ඔබ දන්නා බැවින් ඔබත් උන්වහන්සේත් අතර සදාකාලික බැඳීමක් ඔබ ප්‍රකාශ කරන්නේය.

## ආමෙන් :

අප "ආමෙන්" යන වචනය පාවිච්චි කරන විට, "ආමෙන්" යනු ක්‍රිස්තුස්වහන්සේගේ නාමයන්ගෙන් එකක් වන බැවින්, (එළිදරව් 3:14) අප බලවත් ආධිපත්‍යයකින් අපගේ යාච්ඤාව මුද්‍රා තබන්නෙමු. දෙවියන්වහන්සේගේ සියලු පොරොන්දු ක්‍රිස්තුස්වහන්සේ තුළ සම්පූර්ණ වී ඇති බැවින්, උන්වහන්සේ "දෙවියන්වහන්සේගේ ආමෙන් නමැති තැනන්වහන්සේ" ලෙස හඳුන්වනු ලබේ. අප "ආමෙන්" කියන විට එහි අදහස නම් අප අපගේ සියලු ඉල්ලීම් යේසුස්වහන්සේගේ නාමයෙන් පවසා ඇති බවය.

"ආමෙන්" යන වචනයේ අරුත "කෙසේ හෝ මා යාච්ඤා කළෙමි !" යන්න නොවේ. මෙම වචනයේ අර්ථය, "මා යාච්ඤා කළ ලෙසම, එය ඉටුවනු ඇත" යනුයි. එම නිසා ඔබ "ආමෙන්" යි පවසන විට ඔබ සැබවින්ම කරනුයේ ඇදහිල්ලේ ප්‍රකාශයකි.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පද (ස්වාමීන්ගේ යාච්ඤාව) මතකයෙන් ලියන්න.

2. ආදර්ශ යාච්ඤාවේ අනුවාදයන් දෙක බයිබලයේ සඳහන්ව ඇත්තේ කොහේද?

3. ස්වාමින්ගේ යාච්ඤාව සැබවින්ම මැදහත්කමේ යාච්ඤාවක් වන්නේ ඇයි?

4. මැදහත්කම් කිරීම සඳහා ඔබට ආදර්ශ යාච්ඤාව පාවිච්චි කළ හැක්කේ කෙසේද?

5. අන් අය උදෙසා මැදහත්කම් කිරීමට ඔබට දෙවියන්වහන්සේගේ නාමයන් පාවිච්චි කළ හැක්කේ කෙසේද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

දේව වචනයේ පොරොන්දු ප්‍රකාශ කරමින් යාච්ඤා කිරීම ඔබගේ යාච්ඤාවන්ට පිළිතුරු ලැබෙන බව සහතික කරයි.

ඔබගේ බයිබලය කියවා සෑම පොරොන්දුවක්ම නිශ්චිත වර්ණයකින් හෝ බයිබලයේ තීරුව මත “**පො**” ලකුණ යෙදීමෙන් සළකුණු කිරීමට පටන් ගන්න.

ඔබ යාච්ඤා කරන විට මෙම පොරොන්දු පාවිච්චි කිරීමට පටන් ගන්න. ඔබ මෙය කරනුයේ සැබවින්ම මෙම පොරොන්දු ප්‍රකාශ කරමින් යාච්ඤා කිරීමේදීය. උදාහරණයක් ලෙස, ගීතාවලිය 9:9-10 අනුව ඔබට යාච්ඤා කළ හැකි අයුරු පහත දැක්වේ:

> *“විපත්ති කාලයේදී ඔබවහන්සේ (නම)ට සරණක් වන මෙන් මම ඔහු/ඇය උදෙසා යාච්ඤා කරමි. ස්වාමිනි, ඔබවහන්සේ සොයන්නේ ඔබ අත්නොහරින බැවින් ඇය ඇයගේ විශ්වාසය ඔබවහන්සේ මත තබන මෙන් මම යාච්ඤා කරමි.”*

**දැන්...ඔබ එය අත්හදා බලන්න. බයිබලයෙන් පොරොන්දුවක් තෝරා ගෙන එය යාච්ඤාවක් ලෙස පහතින් ලියා දක්වන්න:**

# හත්වන පරිච්ඡේදය

# පිබිදීමක් උදෙසා මැදහත්කම් කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- පිබිදීම නිර්වචනය කිරීමට
- අපට පිබිදීමකට සූදානම් විය හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට
- පිබිදීමක් අවශ්‍ය කුමන වේලාවකටදැයි හඳුනා ගැනීමට
- පසුබටවූ තත්වයන් සඳහා සාධක හඳුනාගැනීමට
- පිබිදීම උදෙසා වූ බයිබලීය කොන්දේසි සාරාංශගත කිරීමට
- පිබිදීම උදෙසා වූ බාධක හඳුනාගැනීමට
- පිබිදීමක් උදෙසා මැදහත්කම් කිරීමට "දෙවියන්වහන්සේගේ මැදහත්කම් කිරීමේ සැළැස්ම" පාවිච්චි කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත්වී යාච්ඤාකර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි. (2 ලේකම් 7:14)**

## හැඳින්වීම

මැදහත්කම් කිරීමේ වැදගත් ක්‍රියාවක් වන්නේ පිබිදීමක් උදෙසා යාච්ඤා කිරීමයි. මෙම පරිච්ඡේදය තුළදී පිබිදීමක් නිර්වචනය කරන ආකාරය, ඊට සූදානම් වන ආකාරය හා එය අවශ්‍ය බව හඳුනාගන්නා ආකාරය ඔබ ඉගෙන ගනු ඇත. පිබිදීමට බාධාකරන බාධක හඳුනා ගැනීමට හා ඒවා උදෙසා මැදහත්කම් කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත.

## පිබිදීම පිළිබඳ නිර්වචනය

පළමුව, පිබිදීමක් නොවන්නේ කුමක්දැයි අප පරීක්ෂා කර බලමු. පිබිදීම යනු, හැඟීම් නිසා ඇතිවන දෙයක් නොවේ. මිනිසුන් හැඟීම්බරව පිබිදීමට ප්‍රතිචාර දක්වයි. නමුත් හැඟීම් යනු පිබිදීමේ එක් කොටසක් පමණි, එය පිබිදීම නොවේ. සැබෑ පිබිදීමක් මිනිසාගේ හැඟීම් ද ඇතුළුව සම්පූර්ණ මිනිසාටම බලපෑම් කරයි. කරුණු පිළිබඳ ඇති දැනගැන්ම කිසිදාක මිනිසෙකු වෙනස් නොකරයි. මත්පැන් භාවිතය නිසා මිය යන පුද්ගලයන්ගේ මරණ පිළිබඳ සංඛ්‍යා දත්ත වලින් කිසිදාක බීමට ඇබ්බැහි වූ අයෙකු වෙනස් කළ නොහැක. අපරාධ වල ඉහළ යාම පිළිබඳ දත්ත අපරාධකාරයන් වෙනස් නොකරයි. වෙනසක් ඇති කිරීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වෙනස් කිරීමේ බලය ආත්මිකව මෙන්ම හැඟීම් වලින්ද මිනිසෙකුව ස්පර්ශ කළ යුතුය.

පිබිදීම යනු ඝෝෂාකාරී සංගීතය හා අපායේ ගින්න" පිළබඳ දේශනාවන් නොවේ. එය සාමාජිකයන් සංඛ්‍යාව වැඩි කර ගැනීමට නව සාමාජිකයන් උදෙසා වූ ව්‍යාපාරයක් නොවේ. සභාව වර්ධනය වීම පිබිදීමේ ප්‍රතිඵලයක් වන නමුත් එය පිබිදීම හා සමාන නොවේ. පිබිදීම යනු එවැන්ජලිස්ත සේවය නොවේ. එවැන්ජලිස්ත සේවය යනු ශුභාරංචි පණිවුඩය ප්‍රකාශ කිරීම වේ. මැරී සිටි අදහිලිවන්තයන් "පුබුදුනු" ලැබූ විට එවැන්ජලිස්ත සේවය සිදුවන බැවින් එය පිබිදීමට පසුව සිදුවන දෙයකි. අවසාන වශයෙන්, පවත්වනු ලබන විශේෂ රැස්වීම් මාලාවක් දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියා කිරීම් තුළින් ස්පර්ශ කරනු නොලැබුවේ නම්, පිබිදීම යනු එවැනි රැස්වීම් මාලාවක්ද නොවේ.

පිබිදීම යනු...

*"දෙවියන්වහන්සේගේ රීමා (rhema) වචනය තුළින් පිබිදීම ගැන එළිදරව් වන ප්‍රතිපත්ති ඉගෙන ගෙන අදාළකරගත් මිනිසුන් තුළින් හා ඔවුන් උදෙසා ක්‍රියාත්මක වන දෙවියන්වහන්සේගේ බලවත්, අසාමාන්‍ය ක්‍රියාවකි."*

පිබිදීම සියලු බලය සහිතව සිදු වන දෙයක් බැවින් එය මිනිසුන්ගේ නිෂ්පාදනයක් නොවේ. එය දෙවියන්වහන්සේගේ විශේෂ ක්‍රියාවක් වන බැවින් එය අසාමාන්‍ය දෙයකි. පිබිදීමක් සිදුවනුයේ මිනිසුන් කණ්ඩායමක් තුළ ඔවුන් වෙනුවෙනි. පිබිදීමකට සූදානම්වීම සඳහා, දේව වචනයේ පිබිදීම පිළිබඳව එළිදරව් කරන ප්‍රතිපත්ති අප අදාල කරගත යුතුය. පිබිදීම පිළිබඳ බයිබලය උගන්වන සෑම දෙයක්ම කරුණක් පිළිබඳව වූ දෙවියන්වහන්සේගේ " රීමා " හෙවත් "නිශ්චිත" වචනයේ සඳහන් වේ. අපට පිබිදීම යනු කුමක්දැයි මෙලෙසද පැවසිය හැකිය:

-දෙවියන්වහන්සේගේ ජනතාව ප්‍රබෝධමත්කර, ප්‍රාණවත් කර, නැවත නඟා සිටුවීම, ඉතිරිව ඇති දේවල් ශක්තිමත් කිරීම.

-දැනගැන්ම හෝ ජීවනය වෙත නැවත පැමිණීම වේ. පුබුදුවන ලැබූ දේ නැවත වරක් ක්‍රියාශීලි හා සමෘද්ධිමත් විමද වේ.

-මළසිරුරක් බවට පත්වීමේ තර්ජනයට ලක්ව තිබූ ශරීරයක් වෙත ශුද්ධාත්මයන්වහන්සේගේ පැමිණීමකි.

-ස්වාමීන්වහන්සේ ඉදිරියෙන් පැමිණෙන සැණසිලි කාලයන්. (ක්‍රියා 3:19)

## පිබිදීම උදෙසා සූදානම්වීම

පිබිදීම සඳහා සූදානම් වීම අපට ගොවිතැන් කිරීම සමඟ සැසඳිය හැකිය. ගොවියෙකුට එක්තැනක හිඳ හොඳ අස්වැන්නක් උදෙසා යාච්ඤා කළ හැකිය, නමුත් ඔහු කුඹුරු සූදානම් නොකර බීජ නොවපුරා, පැල වලට වතුර නොදමා සිටියහොත් එය සිදුවන්නේ නැත.

එසේම තමන් මෙම කාර්යයේ තමාගේ කොටස කළ පමණින් අස්වැන්න සහතික බව සිතන ගොවියාද ඒ ආකාරයේම අනුවණයෙකි. ගොයම මේරීම සඳහා වැස්ස, හිරු එළිය හා නියම කාළගුණ රටාවන් උදෙසා වූ දෙවියන්වහන්සේගේ බලයද වැදගත්වේ. වැපිරීම හා ඵල නෙලීම, පිළිබඳ දේව වචනය එළිදරව් කර ඇති ප්‍රතිපත්ති සමඟ සහයෝගයෙන් ගොවියා කටයුතු කරයි. දෙවියන්වහන්සේ පරමබලධාරී වේ. තවදුරටත් උන්වහන්සේ කෙරෙන් පැමිණෙන වර්ෂාව, හිරු එළිය හා නිසි කාළගුණ රටාවන් කෙරෙහි උන්වහන්සේ අධිපතිකම් කරන සේක.

පිබිදීම උදෙසාද ඉහත ආදර්ශයට සමාන කරුණුම අදාළ කර ගත හැකිය. එය දෙවියන්වහන්සේගේ ආධිපත්‍ය බලය නිසා සිදුවන නමුත්, පිබිදීම "නෙළාගැනීම" උදෙසා, දේව වචනය එළිදරව් කර ඇති ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් අප එය උදෙසා සූදානම් විය යුතුය. පිබිදීම යනු දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ හා දෙවියන්වහන්සේගේ ජනතාවගේ ප්‍රතිචාරය හා එක්ව සිදුවන ක්‍රියාවකි.

## පිබිදීමක් අවශ්‍ය වන්නේ කවර අවස්ථාවේදීද

සැබවින්ම පිබිදීමක් සැමවිටම අවශ්‍යය, නමුත් එය වඩා අවශ්‍ය වන්නේ පසුබටවූ තත්වයන් දැකිය හැකි වන විටය. පසුබටවූ තත්වයන් තේරුම් ගැනීමට ඉශ්‍රායෙල් සෙනගගේ උදාහරණය සළකා බලන්න. යෙරමියා ඉශ්‍රායෙලයේ පැවති තත්වයන් "පසුබටවීම්" ලෙස හඳුන්වයි. (යෙරමියා 1:3-4) බයිබලය මෙසේ පවසයි.

**සිතින් පසුබටවෙන්නා තමාගේම මාර්ගවලින්ද යහපත් මනුෂ්‍යයා තමාගේම පැවැත්මෙන්ද තෘප්තියට පැමිණෙයි. (හිතෝපදේශය 14:14)**

යෙරමියා 2 වන පරිච්ඡේදයට හරවන්න. ඉශ්‍රායෙලය තුළ පහත දේ තිබුණු බව ඔබ හඳුනාගනු ඇත...

-පෙර මෙන් දෙවියන්වහන්සේ ඔවුන්ට වැදගත් නොවන බව තීරණය කර තිබිණි. ("මම...ව සිටියෙමි") 2:5

-පෙර දවස්වලදී දෙවියන්වහන්සේ ඔවුන්ට කළ මහත් දේවල් අමතක කර තිබුණි. 2:6-7

-ඉශ්‍රායෙලයේ ආත්මික නායකයන් පවා පසුබටවීම් වලට සම්බන්ධ විය. පූජකයෝ පවා “දෙවියන්වහන්සේ කොහේද?” යි ඇසීමට අසමත් විය. 2:8

-ඔවුන් දෙවියන්වහන්සේ තම ජිවිත වලින් ඉවත් කර, වෙනත් දේවල් දෙස හැරුණෝය, ...මෙහිදී, දේවතා රූප : ...2:11-12; 27-28.

-ඔවුන් ආත්මික වතුර උල්පත අතහැර වතුර නාල්ලන කටාරම් කපා ගන්නට පටන් ගත්තෝය, ඔවුහු ජිවනයේ වතුර පල් වතුර වලට මාරු කළෝය. 2:13

-ඔවුහු ආත්මිකව එක් එක් දිශාවන්ට ගසා ගෙන යාමට පත්විය : 2:19.

-ඔවුන් ස්වධර්මිෂ්ඨකමේ තත්වයකට ඇතුළුවිය : 2:22-23

-ඔවුන් නිදහසට කරුණු කියමින් තමන් ධර්මිෂ්ඨ කර ගත්තෝය : 3:11

-ඔවුන් අන් අයවද ඔවුන්ගේ නාස්ති වීමට ඇද ගත්තෝය : 2:33-34

පසුබට වීම යනු කෙනෙකුගේ ජිවිතයෙන් දෙවියන්වහන්සේ ඉවත දමා එය මමත්වයෙන් පුරවා ගැනීමේ පාපයයි. එය ඌරෙකු මඩට හැරී යාමත්, බල්ලා වමනයට හැරී යාමත් සේ විස්තර කර ඇත. (2 පේත්‍රුස් 2:21-22)

## පසුබට වීමේ තත්වයන් සඳහා සාක්ෂි

පසුබට වීමේ තත්වයන් සඳහා සාක්ෂි කිහිපයක් පහත දැක්වේ :

ඔබ මෙම ලැයිස්තුව අධ්‍යයනය කරන කල ඔබේම හදවත් සෝදිසි කර බලන්න. ඔබ පසුබට වීමේ තත්වයකට ඇතුළු වන්නේ...

1. යාච්ඤාවට ඔබගේ ජිවිතයේ ඇති වැදගත්කම නැතිවෙයි. “යාච්ඤාව අඩාල වීමෙන් පිබිදීම ප්‍රමාද වේ” යනුවෙන් පවසා තිබේ.

2. බයිබලයේ සත්‍යයන් සෙවීම ඔබගේ ජිවිතයෙන් මග හැරී ඔබ දැනටමත් ලබා ගෙන ඇති දැනුමෙන් තෘප්තියට පත්වන විට. මෙයින් අදහස් වන්නේ පසුබට වුවන් බයිබලය නොකියවන බව නොවේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට අනිවාර්ය කාර්යයක් ලෙස මෙනෙහි කිරීම් පුරුද්දක් ලෙස කලත් ඔවුන් දේව වචනය කියවන විට ලබා ගන්නා දැනුම කරුණු වශයෙන් පමණක් සළකයි. ඒවා ඔවුන්ගේ ජිවිතයට අදාළ කර නොගනියි.

3. සදාකාලික දේවල් පිළිබඳ සිතිවිලි වල ස්ථිර බව සහ/හෝ වැදගත්කම නැතිව යන විට.

4. “මා දුර්වල පමණක් බව දෙවියන්වහන්සේ දන්නා සේක” හෝ “මේ මගේ ස්වභාවය”යි පවසමින් ඔබ ස්වධර්මිෂ්ඨ කමින් ඔබගේ පාපය සඳහා නිදහසට කරුණු දෙන විට.

5. නිශ්චිත ආත්මික සාකච්ඡාවන් ඔබට දුෂ්කර දෙයක් බව හැඟී ඔබට අපහසුවක් ගෙන දෙන විට.

6. විනෝදය, ක්‍රීඩා හා රසස්වාදය ඔබගේ ජිවිතයේ මුල් තැන ගන්නා විට.

7. ඔබගේ හෘද සාක්ෂියේ විරෝධයකින් තොරව ඔබට පාපයේ ගැලී ජිවත්විය හැකි වන විට.

8. ක්‍රිස්තුස්වහන්සේ මෙන් වූ ශුද්ධකමේ අභිලාෂයන් තවදුරටත් ඔබගේ ජිවිතයෙන් ප්‍රකාශ නොවන විට.

9. මුදල් හා භාණ්ඩ අත්පත් කර ගැනීම ඔබගේ ජිවිතයේ වැදගත් දේවල් වූ විට.

10. දෙවියන්වහන්සේගේ නාමය නිකරුණේ ව්‍යවහාර කරනු, ආත්මික කාරනා වලට අවමන් කරනු හා සදාකාලික දේවල් වැදගත් කමට නැති ලෙස ඔබට ඇසෙන නමුත් ඒ පිළිබඳ තරහවක් ඇති වීමක් හා ක්‍රියාත්මක වීමක් සිදු නොවන විට.

11. “නමස්කාරය” වෙහෙස ගෙන දෙන දෙයක් වූ විට, සභාවේ දේව මෙහෙයන් වල උද්යෝගය නැති වී, ඔබට හදවතින් නොව මුඛයෙන් පමණක් ආත්මික ගී පවසන විට ඔබේ හදවතේ තව දුරටත් ගීතයක් නොමැති වන විට, ප්‍රීතිය සමඟ ප්‍රශංසාව ඇති නොවන විට.

12. සහභාගීත්වය තුළ එක්සත් බවට ඇති වන බාධාවන් ඔබේ සැළකිල්ලට ලක් නොවන විට.

13. ඔබ කිතුනු සේවයෙන් ඈත් කර තැබීමට දිය හැකි නොවැදගත්ම කරුණු පවා ප්‍රමාණවත් වන විට.

14. ඔබගේ මාංශයේ සංවේදී ඉන්ද්‍රියන් පාලනය කළ නොහැකි වන විට: ඔබ අසභ්‍ය චිත්‍ර පට හා රූපවාහිනී වැඩසටහන් නරඹයි. නරක සංගීතයට සවන් දී සහ සදාචාරාත්මක නොවන පොත්පත් කියවයි.

15. ඔබේ ලෝකයේ ජීවන රටාවට සතුටු ලෙස හැඩගැසුනු විට : උදාහරණ ලෙස, නොගෙවූ ණය, බංකොලොත් බව, බොරුකීම, වංචකම, හමුවන වේලාවල් හා පොරොන්දු කඩ කිරීම, අවිනීත ලෙස ඇදුම් ඇඳීම, රැකියා ස්ථානයේ දවසේ කළ යුතු වැඩ සම්බන්ධයෙන් ඔබගේ ස්වාමියා රැවටීම, වැනි දේවල්.

16. ඔබේ ආත්මික බලය අඩුවීම ඔබට ගැටලුවක් නොවන විට: ඔබේ ජීවිතය තුළ දෙවියන්වහන්සේ සහ උන්වහන්සේගේ බලය උදෙසා විශාල ආශාවක් නොමැති විට.

17. ඔබේ සභාව ආත්මිකව පරිහානියට පත්ව ඇති විට දේව වචනයේ බලයෙන් යුතුව දේශනා කරනු නොලැබූ විට හා ඔබ ඉන් සෑහීමට පත් වන විට.

18. ලෝකයේ ඔබ හා ජාතියේ සදාචාරත්මක, දේශපාලනික, ආත්මික හා ආර්ථික තත්වයන් ගැන ඔබට සැළකිල්ලක් නොමැති විට.

19. ඔබේ හදවත් දැඩි වූ විට : ඔබේ කඳුළු පහසුවෙන් නොගලයි, ඔබ නොසැලිකිලිමත්ය, රළුය. විනාශ වෙන්නාවූ නගර හා මිනිසුන්ගේ ආත්මික තත්වයන්, අන් අයගේ දුක් ගැනිවිලි වැනිවූ යේසුස්වහන්සේ දුක්වූ දේවල් ගැන ඔබ දුක් නොවේ.

20. ඔබට ඔබේ ආත්මික ශක්තිය නැතිවී ඇති බව හා ඔබ ඒ බව හඳුනා නොගත් විට.

## පිබිදීම පිළිබඳ බයිබලිය ප්‍රතිපත්ති

පැරණි ගිවිසුමේ පිබිදීමක් උදෙසා යාච්ඤා කිරීමේදී අපට මගපෙන්වන බයිබලිය ප්‍රතිපත්ති පෙන්නුම් කරයි. කිසිදු පිබිදීම් දෙකක් එක හා සමාන නොවේ. නමුත් පහත ප්‍රතිපත්තින් පැරණි ගිවිසුම් වාර්තා තුළින් පෙන්වා දේ :

1. පැරණි ගිවිසුමේ පිබිදීම් වලින් බොහොමයක් සිදුවූයේ විශාල ආත්මික පසුබෑමක් හෝ බලාපොරොත්තු රහිත කාලයකින් අනතුරුව වේ. ඔබ අවට ඇති තත්වයන් පිරිහෙන විට බලාපොරොත්තු සුන් කර ගැනීමට ඔබව පොළඹවනු ලැබූ විට, එසේ කරනු වෙනුවට, ඔබ පිබිදීමක් ආසන්නයේ සිටින බැවින් ප්‍රීති වන්න !

2. සෑම පිබිදීමක්ම හට ගන්නේ එක් මිනිසෙකුගේ හදවතේය. අන් අය කැළඹීම උදෙසා දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ලැබුවේ ඔහුය. දෙවියන්වහන්සේ පිබිදීමේ ගින්නෙන් ඔබගේ හදවත ස්පර්ශ කරන විට, ඔබ පිබිදීමේ ගිනි දැල් අන් අය තුළ දල්වනු ඇත.

3. පැරණි ගිවිසුමේ සෑම පිබිදීමක්ම ඇති වූයේ දේව වචනයේ බලවත් ප්‍රකාශ කිරීමකින් අනතුරුව වේ. පිබිදීම උදෙසා වූ පණිවුඩය බලය, ප්‍රේමය, සමාදානය හා සෞභාග්‍ය පිළිබඳව පමණක් නොව පාපය, නිරය හා දෙවියන්වහන්සේගේ විනිශ්චය කෙරෙහි යොමුවිය යුතුය. මෝසෙස්ගේ (ද්විතීය කථාව 11:26-28) ; සාමුවෙල්ගේ (1 සාමුවෙල් 7:3); එසකියෙල්ගේ (එසකියෙල් 33:7-8); හා එළියාගේ (1 රාජාවලිය 18:21) පිබිදීමේ පණිවුඩ සළකා බලන්න.

4. පිබිදීමකට පෙර සෑම විටම පාපය උදෙසා පසුතැවීමක් සිදුවේ. පසුතැවිලිවීම තුළ සෑම දේවතා රූපයක්ම බිඳ දැමීම හා ලෝකයෙන් වෙන්වීම අන්තර්ගත වේ.

5. අන් අය ගැන සැළකිම, සබත ආරක්ෂා කිරීම, දීම, යාච්ඤාව හා දේව වචනය ද ඇතුළුව නියම ප්‍රමුඛත්වයන් වෙත නැවත හැරී ඒමක් සිදු වේ.

6. නැවත වරක් නියම ලෙස දෙවියන්වහන්සේ නමස්කාර කිරීම සිදුවිය. මෙය ඇල්මැරුණු හා චාරිත්‍රානුකූල නමස්කාරයක් නොව, මිනිසුන් තම දෙවියන්වහන්සේ වෙත දැක්වූ උද්යෝගිමත් හැඟිම්බර ප්‍රතිචාරයක් විය.

7. සෑම පිබිදීමකින් අනතුරුව ඵලදායිත්වයේ, සෞභාගීත්වයේ, මහත් ප්‍රීතියේ හා සතුටේ කාලයක් විය.

## පිබිදීම උදෙසා වූ බාධාවන්

සභාව තුළ දෙවියන්වහන්සේගේ මහත් බලය ක්‍රියාත්මක වීමට බාධා කරන ඇතැම් දෙවල් පහත දැක්වේ.

### නායකත්ව බාධාවන් :

බලයෙන් යුතුව දේව වචනය දේශනා කිරීම හෝ ඉගැන්වීම සිදු නොකරන නායකයන් පිබිදීමට බාධාවන් ඇති කරයි. යාච්ඤා ජීවිතයක්, බයිබල් අධ්‍යයන වැඩ සටහනක්, බලය පෙන්නුම් කිරීමක් හා දේව වචනය ප්‍රකාශ කිරීමට ආශාවක් නැති අය පිබිදීමට බාධා ඇති කරයි. තම සභාව පාලනය කරන සහ දෙවියන්වහන්සේගේ ආත්මය මැඩ පවත්වන අයද දෙවියන්වහන්සේගේ බලවත් ක්‍රියාවට බාධා ඇති කරයි.

තම බැටළුවන් ගැන සැබෑ සැළකිල්ලක් නොමැති නායකයින් පිබිදීමට බාධා ඇති කරයි. ඔවුන් තම බැටළුවන්ව පුබුදු කරවීමට අවශ්‍ය නිල් ගොඳුරු බිම් හා නිශ්චල දිය වෙත ඔවුන් ගෙන නොයයි. මියැදෙමින් සිටින ලෝකයක් උදෙසා වූ අනුකම්පාවෙන් තොරවූ නායකයන් පිබිදීමට බාධා ඇති කරයි. බොහෝ අය පිබිදීමේදී නායකත්වය ගැනීමේ තම වගකීම හඳුනා නොගනියි. (යෝවෙල් 2:15-18)

### සභාවෙන් ඇතිවෙන බාධාවන් :

දෙවියන්වහන්සේගේ සෙනඟ සිටින සභාවෙන්ද පිබිදීමට බාධා ඇති විය හැකිය. සම්ප්‍රදායන් කෙරෙහි සභාවේ කැමැත්ත පිබිදීමකට බාධාවේ. පිබිදීම හා වෙනසක් ඇති වීම එකිනෙක හා සම්බන්ධවේ. දෙවියන්වහන්සේ ක්‍රමවත් වන අතරම උන්වහන්සේ මත රඳාපැවතිය හැකිවේ. නමුත් උන්වහන්සේ නැවුම් හා ප්‍රාණවත්ද වන සේක. උන්වහන්සේ සම්ප්‍රදායානුකූල අයෙක් නොවන සේක. සභාව මිනිසුන්ගේ සම්ප්‍රදාය අනුව ගමන් කළ යුතු නම්, එය දෙවියන්වහන්සේගේ බලය හා අභිමුඛත්වයෙන් තොරව ගමන් කරනු ඇත.

සම්ප්‍රදායානුකූල පිළිවෙත් වලට සභාවක් තුළ ඇති ආශාව පිබිදීමට බාධා ඇති කරයි. දාවිත්ගේ බිරිඳ වූ මීකල්, ඔහුගේ හැඟිම් බර නමස්කාරය නිසා දොස් පැවරූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඈ වඳ බවට පත්විය. වඳ සභාවක් සම්ප්‍රදායානුකූල පිළිවෙත් වලට හා පිළිවෙලවල් වලට කැමතිය. දේව මෙහෙයන් කෙටි කිරීමට ඇති ආශාවද පිබිදීමට බාධා ඇති කරයි. අපට අවශ්‍ය ඉරු දින උදෑසන අප දෙවියන්වහන්සේ වෙනුවෙන් වෙන් කර ඇති පැය දෙක තුළදී උන්වහන්සේ පිබිදීමක් ඇති කිරීම වේ.

බොහෝ සභාවන් සැප පහසු සත්‍යයට කැමතිය. ඔවුන්ට විරුද්ධව ක්‍රිස්තුස්වහන්සේ පවසන චෝදනා හෝ පාපය හා විනිශ්චය පිළිබඳ දේශනා වලට මුහුණ දීමට ඔවුන්ට අවශ්‍ය නොවේ. පිබිදීමක් සඳහා අවශ්‍ය වූ සත්‍යයන් සැමවිටම සුවපහසු නොවේ. අන් අයගේ ගෞරවය ලැබීමට ඇති ආශාවද පිබිදීමට බාධා කරයි. ඇතැම් සභාවන් දෙවියන්වහන්සේ සිතන්නේ කුමක් ගැනද යන්නට වඩා "මිනිසුන් කුමක් සිතනු ඇද්ද" යන්න ගැන සැළකිලිමත්ය.

### පොදු බාධාවන් :

නායකත්වය හා සභාව යන දෙක තුළම දැකිය හැකි තවත් බාධාවන් තිබේ. දේවස්ථානයේ වාඩිවී සිටින ගිහි සෙනඟගේ හෝ දේශනා කුඩුවේ සිටින පුද්ගලයා තුළ හෝ ඇති අපරාධය පිබිදීමට බාධාවකි :

**බලව, ගළවන්ට බැරි ලෙස ස්වාමීන්වහන්සේගේ අත කොට-වෙලාවත් නැසෙන ලෙස උන්වහන්සේගේ කන බිහිරිවෙලාවත් නැත. නුමුත් නුඹලාගේ අපරාධම නුඹලා සහ දෙවියන්වහන්සේ අතරේ වෙන්වීමක් කෙළේය: උන්වහන්සේ නොඅසන ලෙස නුඹලාගේ පාපද උන්වහන්සේගේ මුහුණ නුඹලාගෙන් සැඟෙවුවේය. (යෙසායා 59:1-2)**

**තමාගේ වරද සඟවන්නා සවිල නොවන්නේය: එහෙත් ඒවා කියාදී අත්හරින්නාට කරුණාව ලැබේ. (හිතෝපදේශ 28:13)**

"මේවා අවසාන කාලයේ දවස් වන බැවින් අපට බලාපොරොත්තු විය හැක්කේ දේවල් වඩා නරක අතට හැරීම පමණි" යන ආකාරයේ ඉවසීමේ ආකල්පයත් පිබිදීමට බාධාවක් විය හැකිය. යාච්ඤාවට හා දේව වචනයට අවධානය නොදීම, තමාව යටහත් කර ගැනීම ප්‍රතික්ෂේප කිරීම, හා ස්වාමීන්වහන්සේ ප්‍රතික්ෂේප කිරීම යන සියලු දේ පිබිදීමට බාධා ඇති කරයි. දෙවියන්වහන්සේ සීමා කිරීම නිසා අප මධ්‍යයේ දෙවියන්වහන්සේ බලවත් ලෙස ක්‍රියා කිරීමට බාධා ඇතිවේ :

**ඔව්හු නැවත හැරී දෙවියන්වහන්සේ පරීක්ෂාකළෝය, ඉශ්‍රායෙල්ගේ ශුද්ධ තැනන්වහන්සේ උදහස්කළෝය. (ගීතාවලිය 78:41)**

**ඔවුන්ගේ ඇදහිලි නැතිකම නිසා උන්වහන්සේ එහිදී බොහෝ ආශ්වර්යයන් නොකළසේක. (මතෙව් 13:58)**

උදාසීන භාවය පිබිදීමක් ඇති වීම වළක්වයි. මිනිසුන් ක්‍රිස්තුස්වහන්සේ ප්‍රකාශ කිරීම හා අන් අයගේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් උදාසීන භාවයට පත්වේ. අපගේ ආත්මික තත්වයට හා දෙවියන්වහන්සේගේ ආත්මයට සංවේදී නොවීමද පිබිදීමට බාධා ඇති කරයි.

## දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැළැස්ම

පිබිදීමක් ඇතිවන්නේ යාච්ඤාවකට පිළිතුරු වශයෙන් වන බැවින් අප සාකච්ජා කළ සියලුම බාධාවන් මැදහත්කමේ යාච්ඤාව තුලින් තුරන් කරගත හැකිය. පිබිදීමක් උදෙසා යාච්ඤා කළ යුතු ආකාරය පහත දැක්වේ :

**මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත්වී යාච්ඤාකර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි. (2 ලේකම් 7:14)**

පිබිදීමක් තුළ ඇතුළත් බොහෝ වැදගත් ප්‍රතිපත්ති මෙම පදයේ සඳහන් වේ. පළමුව, දෙවියන්වහන්සේ කතා කරන්නේ උන්වහන්සේගේ සෙනඟට බව හඳුනාගන්න. ("මාගේ සෙනඟ"). උන්වහන්සේ කතා කරනුයේ පව්කාරයන්ට, ලෝකයට හෝ පොදුවේ ඕනෑම කෙනෙකුට හෝ නොවේ. උන්වහන්සේ කතා කරනුයේ "උන්වහන්සේගේ නාමය දරන" උන්වහන්සේගේ සෙනඟටය. දෙවියන්වහන්සේගේ සෙනඟට පිබිදීමක් අත්දැකීමට අවශ්‍ය නම් ඔවුන් කළ යුතු දේවල් පහත දැක්වේ :

### 1. "යටත්වී" :

යටත් වීම යනු, දෙවියන්වහන්සේ ඉදිරියේ ඔබ පහත් කර ගැනීමයි (ලෙවී කතාව 26:40-41 අධ්‍යයනය කරන්න). මෙම යටත්වීම තුළ දෙවියන්වහන්සේ ඉදිරියෙහි (2 ලේකම් 34:1-13); උන්වහන්සේගේ වචනය ඉදිරියෙහි (2 රාජාවලිය 34:14-28); හා උන්වහන්සේගේ සෙනඟ ඉදිරියෙහි (2 ලේකම් 34:29-33) යටහත් වීමයි.

### 2. "යාච්ඤාකර" :

(1) දෙවියන්වහන්සේ සෙවීමේ හා (2) ඔබගේ නපුරු මාර්ග වලින් හැරීමේ විශේෂ යාච්ඤාවන් ඔබ විසින් කළ යුතුය. බොහෝ විට අපට "නැත්තේ" අප "නොඉල්ලන" බැවින් හෝ වැරදි ලෙස ඉල්ලන බැවිනි. අප පුබුදු කරන ලෙස අප දෙවියන්වහන්සේගෙන් ඉල්ලිය යුතු අතර උන්වහන්සේගේ ආත්මයේ ක්‍රියාකාරීත්වයට අපගේ හදවත් සූදානම් කර ගැනීම උදෙසා පාපොච්චාරණය කිරීමේ හා පසුතැවිලිවීමේ විශේෂිත යාච්ඤාවන් අප විසින් කළ යුතුය.

## 3. “මාගේ මුහුණ සොයා” :

“දෙවියන්වහන්සේ සෙවීම” යන වාක්‍ය ඛණ්ඩය පරණ ගිවිසුමේ පහත සඳහන් පරිච්ජේද වල සඳහන් වේ :

නික්මයාම 33:7; ද්විතිය කතාව 4:29; එස්රා 8:22; 2 සාමුවෙල් 12:16; 21:1; 1 ලේකම් 16:10-11; 2 ලේකම් 7:14; 11:16; 15:14; 20:4; ගිතාවලිය 105:3-4; 24:6; 27:8; 40:17; 69:7; 70:5; හිතෝපදේශ 28:5; යෙසායා 51:1; යෙරමියා 29:13; 50:4; හොෂෙයා 3:5; 5:6-7; 15; 7:10; දානියෙල් 9:3; ශෙපනියා 1:6; සෙකරියා 8:21; මලාකි 3:1

ස්වාමින්වහන්සේගේ මුහුණ සෙවීම යන්න තුළ පහත කරුණු ඇතුළත් බව මෙම බයිබල් කොටස් සළකා බැලිමෙන් එළිදරව් වේ :

1. ස්වකැමැත්තෙන් හා මුළු හදවතින් දෙවියන්වහන්සේ වෙතට හැරීම.
2. උන්වහන්සේට සේවය කිරීමට කැපවීමේ අභ්‍යන්තරයෙන් පැමිණෙන ආකල්පයක්
3. සියලු නපුරෙන් හැරීමට ගත්තා වූ තීරණයක්
4. උන්වහන්සේගේ කැමැත්ත සම්පූර්ණ කිරීමට ගත් තීරණයක්
5. ජ්වලිතමත් යාච්ඤාව උදෙසා කැපවීමක්

ස්වාමින්වහන්සේ සෙවීම නපුර ඉවත හෙළීමේ ප්‍රධාන උපක්‍රමයකි (ආමොස් 5:4, 14). එය සැබෑ යටහත්කම පිළිබඳ සාක්ෂියයි (ශෙපනියා 2:3. දෙවියන්වහන්සේගේ අභිමුඛය අත්දැකීමේ පදනම එයයි (හොෂෙයා 5:15). එය ජිවය ගෙන දෙන අතර (ආමෝස් 5:4-6) එය මුළු හදවතින්ම කළ යුතුය (යෙරමියා 29:12-13).

## 4. “තමන්ගේ නපුරු මාර්ග අත්හැරියහොත්” :

ඔවුන් යාච්ඤා කිරීම හා දෙවියන්වහන්සේ සෙවීම පමණක් ප්‍රමාණවත් නොවේ. ගමන් මාර්ගයේ වෙනසක් ඇති කරන සැබෑ පසුතැවිලිවීමක්ද ඒ සමඟම සිදුවිය යුතුය. ඔබ ඔබගේ නපුරු මාර්ග වලින් දෙවියන්වහන්සේ වෙතට හැරී ආ යුතුය. සෑම බයිබලීය පිබිදීමක් තුළම වැදගත් කොට දක්වා ඇති සත්‍යය පසුතැවිලි වීමයි. එය පැරණි ගිවිසුමේ පිබිදීම් තුළ දැකිය හැකිය. සභාව ආරම්භ වූයේ පසුතැවිලි වීම උදෙසා වූ කැඳවීම් වලිනි (ක්‍රියා 2). එළිදරව් පොතෙහි සඳහන් අවසන් කැඳවීමද පසුතැවිලිවීම සඳහාය (එළිදරව් 22:16).

පසුතැවිලිවීම යනු ඔබේ ජිවිතයේ මාර්ග වෙනස්කර ගැනීමේ හැකියාව ඔබට ලබා දෙන දෙවියන්වහන්සේගෙන් වූ ත්‍යගයකි (ක්‍රියා 5:29-31; 11:15-18; 2 තිමෝති 2:22-26). සියලු මිනිසුන්ට පසුතැවිලි වීමට අණකර තිබේ (ක්‍රියා 17:30). හැම දෙනාම පසුතැවිලි වීම දෙවියන්වහන්සේගේ කැමැත්ත වන අතර (2 පේත්‍රුස් 3:9), මිනිසුන් පසුතැවිල්ලට ගෙන ඒම උදෙසා දෙවියන්වහන්සේ අනුග්‍රහයෙන් යුතුව ක්‍රියා කරන සේක (රෝම 2:4). පසුතැවිල්ලෙන් තොරව ඔබ විනාශ වනු ඇත (ලූක් 13:3,5). යේසුස්වහන්සේගේ නාමයෙන් සියලු ජාතින්ට පසුතැවිලි වන ලෙස හා පව් වලට සමාව ඇති බවට දේශනා කරන්න යැයි උන්වහන්සේ අණ කළ සේක (ලූක් 24:47).

පසුතැවිලිවීම තුළ පැහැර හැරීමේ පාප (ඔබ කළ යුතු නමුත් ඔබ විසින් නොකරන දේවල්), දැනගැනීම ඇතුව කරන පාප (ඔබ කරන වැරදි දේවල්), සහ තමා සිතන ආකාරයට දේවල් කිරීම නිසා පාප (දෙවියන්වහන්සේගේ උපදෙස් නොසොයා ක්‍රියා කිරීම තුළින් වැරදි කිරීම) යන දේවල් අන්තර්ගත වේ. පසුතැවිලිවීම තුළ “මළ ක්‍රියාවන්” ගෙන් හැරීමද ඇතුළත්වේ. (හෙබ්‍රෙව් 6:1-3). “මළ ක්‍රියාවන්” යනු දෙවියන්වහන්සේගේ ප්‍රසාදය ලබා ගැනීම සඳහා මනුෂ්‍ය ශක්තියෙන් කරනු ලබන ඕනෑම ආගමික ක්‍රියාවකි.

නමස්කාරය, දසයෙන් කොටස් දැමීම, හා කරුණාවේ ක්‍රියාවන් යන දේවල්ද මළ ක්‍රියාවන් තුළ අන්තර්ගතවේ. නමස්කාරය ආත්මයෙන්ද සත්‍යයෙන්ද විය යුතු අතර එසේ නොවේ නම් එය මළ ක්‍රියාවකි. බලහාත්කාරය නිසා, හැඟිම් නිසා හෝ ඔබෙන් ඉදිරියට සම්මාදම් මල්ල නිකම් යැවීමට ඔබ ලැජ්ජා වන නිසා දීම මළ ක්‍රියාවකි. ආශාවකින් තොරව හෝ මහිමය ලබා ගැනීමට කරන කරුණාවේ ක්‍රියාවන් හෝ සේවය, මළ ක්‍රියාවකි.

දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මඟින් පණ පෙවීමට හැකියාවක් නැති ඕනෑම ක්‍රියාවක් මළ ක්‍රියාවකි. උදාහරණයක් ලෙස, දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගේ පෙළඹවීමකින් තොරව හැම තැනකදීම, හැම කෙනෙකුටම ශුභාරංචිය බෙදා ගැනීම ඌරන් ඉදිරියේ මුතු වැපිරීමක් (මතෙව් 7:6) හා නින්දා කරන්නෙකුට නිකරුණේ අවවාද කිරීමකි (හිතෝපදේශ 9:7-8). ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් තොරව මාංශයේ ශක්තියෙන් කරනු ලබන ඕනෑම ක්‍රියාවක් මළ ක්‍රියාවකි.

ඔබ නිරතුරුවම ඔබගේ ආත්මික තත්වය, ඔබේ අභිප්‍රායන් හා සේවය කරන ක්‍රම පරීක්ෂා කර බැලිය යුතුය. එමෙන්ම පැහැර හැරීමේ පාප, දැනගැනීම ඇතුව කරන පාප, තමා සිතන ආකාරයට දේවල් කිරීම නිසා පාප, හා මළ ක්‍රියාවන් පරීක්ෂා කර බැලිය යුතුය.

## සාරාංශය :

පිබිදීම සඳහා සූදානම් වීමට ඔබ කළ යුතු දේවල් පහත දැක්වේ :

-යටත් වන්න
-යාච්ඤා කරන්න
-දෙවියන්වහන්සේගේ මුහුණ සොයන්න
-ඔබගේ නපුරු මාර්ග වලින් හැරෙන්න

ඊට ප්‍රතිචාර ලෙස දෙවියන්වහන්සේ කරන දේවල් පහත දැක්වේ :

-"ස්වර්ගයේ සිට අසන සේක" : ප්‍රතිචාර දක්වයි.
-"ඔවුන්ගේ පව් කමා කොට" : එකමුතුවෙයි.
-"ඔවුන්ගේ දේශය සුව කරමි" : නැතිවූ දේ නැවත පිහිටවනු ලැබේ.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පිබිදීම නිර්වචනය කරන්න.

3. අපට පිබිදීම උදෙසා සූදානම් විය හැක්කේ කෙසේද?

4. පිබිදීමක් අවශ්‍ය වන්නේ කවර අවස්ථාවේදීද?

5. මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡා කරන ලද පසුබට වීමට ලක් වූ අවස්ථාවන්ට ඇති සාක්ෂි සමහරක් සාරාංශගත කරන්න.

6. මෙම පරිච්ඡේදය තුළ සඳහන් පිබිදීම උදෙසා වූ බයිබලීය ප්‍රතිපත්ති ලියා දක්වන්න.

7. "දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැලැස්ම" ගැන සඳහන් බයිබල් පදයක් ලියන්න.

8. පිබිදීමක් උදෙසා මැදහත්කම් කිරීමට "දෙවියන්වහන්සේගේ පිබිදීමේ සැලැස්ම" යොදා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

මෙම ප්‍රතිපත්ති පිළිබඳ වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා පැරණි ගිවිසුමේ පිබිදීම් සපයා තිබේ. සෑම ආත්මික පිබිදීමකම පවතින තත්වයන්, පිබිදීමට හේතු වූ කරුණු, හා පිබිදීමේ ප්‍රතිඵල සාරාංශගත කර තිබේ. ඔබේම සමීක්ෂණ රටාවක් ගොඩනඟා ගැනීම සඳහා පළමු අවස්ථාව උදාහරණ වශයෙන් ලබා දී තිබේ. ඔබගේ අධ්‍යයනයන් සඳහා මෙම පරිච්ජේදය අවසානයේ සපයා තිබෙන පෝරමය ඔබට නැවත සකස් කරගත හැකිය.

## යාකොබ් යටතේ සිදු වූ පිබිදීම : උත්පත්ති 35:1-15

### පවතින තත්වයන් :

1. පවුලේ ප්‍රධානියා දෙවියන්වහන්සේ සමඟ සහභාගිකම් පැවැත්වීමෙන් ඉවත් වී තිබුණි. ආරම්භයේ පටන්ම යාකොබ් රැවටිලිකාරයෙක් සහ වරද ගණන් නොගෙන සිටි අයෙක් විය. ඒසව්ගේ කෝපයෙන් බේරීමට පළා යන අතරතුර දෙවියන්වහන්සේට සේවය කිරීමට ඔහු පොරොන්දු වූ නමුත් ඉක්මනින්ම මෙම පොරොන්දුව අමතක කළේය. යාකොබ් අනුන්ගේ උදව් අවශ්‍ය නොවූ අයෙකු විය. ඔහු දෙවියන්වහන්සේගේ ආශිර්වාදය සෙවුවද, ඔහු අත්පත් කරගත් දේවල් දෙවියන්වහන්සේගෙන් ලැබුණු දේවල් ලෙස ඔහු දුටුවේ නැත. ඔහු විශ්වාස කළේ ඔහුගේ ආශිර්වාදයන් ඔහු විසින්ම අත්පත් කරගත් බවයි. යාකොබ් ද්‍රව්‍යමය දේවල් ගැන සිතූ අතර, දෙවියන්වහන්සේ සමඟ පැවැත්වූ සම්බන්ධතාවය ගැන සළකනවාට වඩා තම වස්තුව හා තමා උදෙසා හා තම පවුල උදෙසා අවශ්‍ය දේවල් සපයා ගැනීම ගැන සැළකුවේය.

2. ඔහුගේ පවුලේ ආකෘතිය බයිබලීය රටාවට අනුකූල නොවීය. යොසෙප්ට විශේෂත්වයක් පෙන්වනු ලැබීය. යාකොබ් තම නිවස හරිලෙස පාලනය නොකළ අතර ඔහුගේ පුතුන් ඔහුගේ දියණිය දූෂණය කිරීමේ පළිය ගත්හ (උත්පත්ති 34). ඔහුගේ භාර්යාවන් රැවටිලිකාර ඊර්ෂ්‍යයා සහගත හා වරද ගණන් නොගෙන සිටින අය වූහ.

3. ආත්මික පරිසරය දුර්වල එකක් විය. ඔහුගේ භාර්යාවන් ඔවුන්ගේ පියාගේ බොරු දෙවිවරු සොරකම් කළේය. ඔහුගේ පුතුන් මිනී මැරුවෝය, සොරකම් කළහ, කොල්ලකෑහ. ඔහු සහ ඔහුගේ පවුල පාපිෂ්ඨ හා පිළිම වලට නමස්කාර කරන අය වූහ : උත්පත්ති 35.

### පිබිදීමට හේතු වූ කරුණු :

1. ඇතැම් දරුණු අවස්ථාවන් යාකොබ් ඔහුගේ සිහිනුවණට ගෙන ආවේය : උත්පත්ති 35.

2. පිබිදීම ආරම්භ වූයේ දෙවියන්වහන්සේගේ වචනයෙනි : උත්පත්ති 35:1

### ප්‍රතිඵල :

පිබිදීම ඇති වූයේ නිවසේදීය. අපගේ නිවෙස් පිබිදුනහොත් සභාවන්ද පිබිදෙනු ඇත !

1. පවුල තම පිළිම වන්දනා වලින් ඉවත්ව තමන්ව පවිත්‍ර කර ගත්හ : උත්පත්ති 35:2

2. ඔවුහු සැබෑ දෙවියන්වහන්සේ පිළිගත්හ : උත්පත්ති 35:3

3. ඔවුහු ආත්මික අත්දැකීම් වෙත නැවත හැරී ආහ : (බෙතෙල්ට යාම) : උත්පත්ති 35:3

4. ඔවුහු පූජාසනයක් ගොඩනඟා, පසුතැවිලිවී, සැබෑ නමස්කාරයට නැවත හැරුණි : උත්පත්ති 35:7

5. ඔවුන්ගේ ජීවිත වෙනස් විය : ආත්මික වෙනසේ ලකුණක් වශයෙන් යාකොබ්ගේ නම වෙනස් විය : උත්පත්ති 32:24-32

6. යාකොබ්ට දෙවියන්වහන්සේ පිළිබඳ නව එළදරව්වක් ලැබුණි : "සර්වබලධාරී දෙවිඳුන්" ලෙස දෙවියන්වහන්සේ තමා හඳුන්වාදුන් අතර එහි අදහස සියලු බලය සහිත, සෑහෙන දෙවිඳුන් යන්නයි : උත්පත්ති 32:24-32.

**දැන්...පරණ ගිවිසුමේ පිබිදීම් පිළිබඳ ඔබගේ අධ්‍යයනයන් තවදුරටත් කරගෙන යාම සඳහා පහත සඳහන් බයිබල් පද හා මෙම පරිච්ඡේදය අවසානයේ ඇති පෝරමය පාවිච්චි කරන්න.**

| | |
|---|---|
| මෝසෙස් යටතේ සිදු වූ පිබිදීම : | නික්මයාම 32:1-35; 33:1-23; පරිච්ඡේද 34-35. |
| සාමුවෙල් යටතේ සිදු වූ පිබිදීම : | 1 සාමුවෙල් 7:1-17 |
| එළියා යටතේ සිදු වූ පිබිදීම : | 1 රාජාවලිය 17-18 |
| ආසා යටතේ සිදු වූ පිබිදීම : | 2 ලේකම් 14-15 සහ<br>1 රාජාවලිය 15:9-24 සඳහන් සමාන්තර වාර්තාව |
| යෙහොෂාපාට් යටතේ සිදු වූ පිබිදීම | :2 ලේකම් 20 |
| හෙසකියා යටතේ සිදු වූ පිබිදීම | :2 ලේකම් 29:1-36; 30:1-27; 31:1-21 |
| යොෂියා යටතේ සිදු වූ පිබිදීම | :11 ලේකම් 34:1-33; 35:1-9 |
| සෙරුබ්බාබෙල් යටතේ සිදු වූ පිබිදීම | :හග්ගයි 1; සෙකරියා 1:1-6 |
| සලමොන් යටතේ සිදු වූ පිබිදීම | :2 ලේකම් 6-7 |
| යෝනා යටතේ සිදු වූ පිබිදීම | : යෝනාගේ පොත |
| නෙහෙමියා යටතේ සිදු වූ පිබිදීම | : නෙහෙමියා 8-10 |

## පැරණි ගිවිසුමේ පිබිදීම්

**පිබිදීමේ නායකකත්වය ගත් පුද්ගලයා :**________________________

**බයිබල් කොටස් :**________________________

**පැවති තත්වයන් :**

**පිබිදීමට හේතු වූ කරුණු :**

**ප්‍රතිඵල :**

# අටවන පරිච්ඡේදය

## ආරම්භ කිරීම හා ඉදිරියට පවත්වාගෙන යාම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කළ පසු ඔබට

- සංවිධානාත්මක යාච්ඤාවකට සැළසුමක් සකස් කිරීමට,
- පෞද්ගලික යාච්ඤා අත්පොතක් සකස් කර ගැනීමට,
- අන්තර්ජාතික මැදහත්කමට සම්බන්ධ වීමට,
- ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට ඇති ප්‍රශ්න හා විසඳුම් හඳුනා ගැනීමට,
- මැදහත්කම් කිරීම ශික්ෂණයෙන් කරන ක්‍රියාවක සිට සතුටින් කරන ක්‍රියාවකට මාරු කිරීමට,
- මැදහත්කමේ සේවයට ඔබව කැප කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නුමුත් නුඹ යාච්ඤාකරන කල්හි නුඹේ ඇතුල් ගෙට වැද, දොර වසා, රහසිගතව වසන නුඹේ පියාණන්වහන්සේට යාච්ඤාකරපන්න, එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙනසේක. (මතෙව් 6:6)**

### හැඳින්වීම

මැදහත්කමේ යාච්ඤාව පිළිබඳ අපගේ අධ්‍යයනයේදී මැදහත්කම යනු කුමක්ද, අපට එය කිරීමේ හැකියාව ලබා දීමට සපයා ඇති ආත්මික සම්පත් හා මේ ආකාරයේ යාච්ඤාවක් කරන්නේ කෙසේද යන කරුණු අප ඉගෙන ගන්නෙමු. එසේම මැදහත්කම් කිරීමේ ආදර්ශය වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැනද සළකා බැලූ අතර බලපෑමක් කළ හැකි ආකාරයේ යාච්ඤාවන් වලට බාධා හඳුනාගැනීමට හා ඒවා සමඟ ගණුදෙනු කිරීමටද ඉගෙන ගන්නෙමු. මැදහත්කමේ යාච්ඤාවේ සේවය ආරම්භ කිරීමට හා අවසන් කිරීමට අවශ්‍ය යෝජනා මෙම අවසන් පරිච්ඡේදයෙන් සපයා තිබේ.

### යාච්ඤාව සඳහා සැළසුම් කිරීම

ඔබට බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත් කරුවෙකු වීමට නම් ඔබට යාච්ඤාවට වෙලාව තිබිය යුතුය. පුද්ගලිකව හා අන්‍යයන් සමඟ නිරතුරු යාච්ඤා කාලයක් සැළසුම් කිරීම මෙය කළ හැකි එක් ආකාරයකි. යාච්ඤා බලවේග සැලසුම් කිරීම පිළිබඳව අලුත් ගිවිසුම පහත ආකෘතිය සපයා දෙයි.

**පෞද්ගලික යාච්ඤාව :**

යාච්ඤාව පෞද්ගලික පදනමකින් යුතුව රහසිගතව සිදු කළ යුතුය.

> **නුමුත් නුඹ යාච්ඤාකරන කල්හි නුඹේ ඇතුල් ගෙට වැද, දොර වසා, රහසිගතව වසන නුඹේ පියාණන්වහන්සේට යාච්ඤාකරපන්න, එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙනසේක. (මතෙව් 6:6)**

සෑම දවසකම යාච්ඤාව සඳහා විශේෂ කාලයක් වෙන් කරන්න, එය ඔබේ දවස ආරම්භ කිරීමට පෙර උදෑසනින්ම කළ හැකි නම් යහපත්ය. ඔබ උදෑසන අවදිවෙන කෙනෙක් නොවේ නම්, ඒ සඳහා සුදුසු වෙනත් වෙලාවක් වෙන් කරන්න. මෙය ප්‍රශංසාවෙන් නමස්කාරයෙන් යුතුව දෙවියන්වහන්සේ ඉදිරියේ සිටගනිමින් හා ආයාචනාවන් හා මැදහත්කම් කරමින් දෙවියන්වහන්සේ හා මනුෂ්‍යයා අතර සිටගනිමින් ඔබේ පූජක සේවය ඉටු කරන කාලයයි. ඔබ මැදහත්කම් කිරීම පටන් ගැනීමට පෙර ඔබ පුද්ගලිකව පසුතැවිලිවීමේ කාලයක් පවත්වා ඔබ සෑම පාපයකින්ම පවිත්‍ර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලිය යුතුය. පසුතැවිලිවීම යනු බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමේ පදනමයි.

## දෙදෙනෙක් එක්ව යාච්ඤා කිරීම :

දෙදෙනෙක් එක්ව යාච්ඤා කිරීම සාමුහික යාච්ඤාවේ කුඩාම ඒකකයයි. පහත බයිබල් පද තුළින් එහි ඇති බලය මෙන්ම එහි බයිබලීය ආකෘතියද එළිදරව් කර තිබේ :

> **නැවතත් නුඹලාට කියමි: පොළොවේදී නුඹලාගෙන් දෙදෙනෙක් තමුන් ඉල්ලන යමක් ගැන එක්සිත්වන්නෝ නම්, ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේගෙන් ඒ දේ ඔවුන්ට ලැබෙන්නේය. (මතෙව් 18:19)**

මැදහත්කරුවෙකු වීමට කැමති මිතුරෙකු සොයාගෙන නිතිපතා එක්ව යාච්ඤා කිරීමට පටන් ගන්න. ඔබ විවාහක නම් ඔබට ඔබේ සහකරු හෝ සහකාරිය තෝරාගත හැකිය. ඔබ සමඟ යාච්ඤා කිරීමට කෙනෙකු සිටී නම් ඔබ අධෛර්යයට පත් වූ විට ඔවුන්ට ඔබ ඉදිරියට ගෙන යා හැකිය.

## කුඩා කණ්ඩායම් :

කුඩා කණ්ඩායම් (ඇතැම් විට “යාච්ඤා සෛල” ලෙස හැඳින්වේ) මැදහත්කම සඳහා එක්වූ තනි පුද්ගලයන් දෙදෙනෙකුට වඩා වැඩි ගණනින් සමන්විතවේ. මෙම අරමුණ සඳහා මිනිසුන් දෙදෙනෙක් හෝ තුන් දෙනෙක් එක්වූ විට මහත් බලයක් තිබේ :

> **මක්නිසාද දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතැන ඔවුන් මැද සිටිමියි කීසේක. (මතෙව් 18:20)**

ඔබගේ මිතුරන්, ඔබ සමඟ වැඩ කරන අය හෝ ඥාතීන්ගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් සමඟ යාච්ඤා කිරීමට ඔබට සතිපතා හමුවිය හැකිය.

## සම්පූර්ණ සාමුහික යාච්ඤාව :

සාමුහික මැදහත්කමේ කාලවලදී මුළු සභාවම එකට එකතු විය යුතුය.

> **උන්වහන්සේ ඔවුන් සමඟ රැස්ව ඔවුන්ට ආඥාකරමින්: යෙරුසලමෙන් අහක්ව නොගොස් නුඹලා මාගෙන් ඇසූ පියාණන්වහන්සේගේ පොරොන්දුව බලා සිටපල්ලා. (ක්‍රියා 1:4)**

පේත්‍රුස් සිරගතව සිටින විට සභාව ඔහු උදෙසා නිරන්තරයෙන් මැදිහත්කම් කළ බව ක්‍රියා 12:5 එළිදරව් කරයි. ඔබ දේවගැතිවරයෙකු නම් එවැනි සාමුහික යාච්ඤා කාලයන් සංවිධානය කිරීම ඔබේ වගකීමකි.

# පෞද්ගලික යාච්ඤා අත්පොතක් නිර්මාණය කිරීම

මැදහත්කම් කිරීමේදී ඔබ මෙහෙයවීම සඳහා පෞද්ගලික යාච්ඤා අත් පොතක් නිර්මාණය කිරීම උපකාරී වේ. විවිධ කොටස් වලට වෙන් කරන ලද සටහන් පොතක් පාවිච්චි කරන්න. ඔබට පහත සඳහන් දේවල් උදෙසා කොටස් වෙන් කළ හැකිය.

- මැදහත්කම් කිරීම හා නිරාහාරය පිළිබඳ අධ්‍යයන සටහන්

- ඔබගේ නගරය, ප්‍රාන්තය හා රට : යාච්ඤා කිරීම සඳහා ඔබගේ නගරයේ, ප්‍රාන්තයේ, හා රටේ සිතියම් ලබා ගන්න. දේශපාලනික හා ආගමික නිළධාරීන්ගේ නම් ලැයිස්තුවක් ගෙන ඔවුන් උදෙසා නම කියා යාච්ඤා කරන්න.

- පෞද්ගලික මැදහත්කම : ඔබගේ පවුලේ, මිතුරන්ගේ හා අන් අයගේ පෞද්ගලික යාච්ඤා අවශ්‍යතා ලියා ඒවා උදෙසා සෑම දවසකදීම මැදහත්කම් කරන්න. මැදහත් කිරීමේ සේවය තුළ ඔබව ධෛර්යවත් කිරීම සඳහා පිළිතුරු ලැබුණු යාච්ඤාවන් වාර්තා කර තබා ගන්න.

- ඔබගේ සභාව : ඔබගේ සභාවේ සංවිධානය පිළිබඳ වගුවක් හෝ නායකයන්ගේ නම් ලැයිස්තුවක් ලබා ගෙන දිනපතා ඔවුන් උදෙසා යාච්ඤා කරන්න. ඔබගේ සභාවේ සෑම සාමාජිකයෙක් උදෙසාම නම කියා යාච්ඤා කරන්න.

- ඔබගේ සේවය : ඔබගේ පෞද්ගලික සේවය උදෙසා මැදහත්කම් කරන්න : ඔබ බයිබල් පංතියක උගන්වන්නේ නම් ඔබේ ශිෂ්‍යයන් උදෙසා යාච්ඤා කරන්න. ඔබ දේවගැතිවරයෙක් නම් ඔබේ සභාවේ සෑම සාමාජිකයෙක්ගේම නම් කියා යාච්ඤා කරන්න. ඔබ දෙමව්පියෙක් නම් ඔබේ දරුවන් උදෙසා යාච්ඤා කරන්න. (ඔවුන් ඔබේ සේවයේ කොටසකි). ඔබ මිෂනාරිවරයෙකු හෝ එවැන්ජලිස්තවරයෙකු නම්, ශුභාරංචිය සඳහා දොරටු විවර වීමට, මිනිසුන්ගේ හැරීම උදෙසා, ඔබේ ගෝලයන් හා ඔබ සමඟ සේවය කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.

- අන්තර් ජාතික මැදහත්කම් : ලෝකයේ ජාතීන් උදෙසා හා දේව රාජ්‍යය ප්‍රචාරය වීම උදෙසා මැදහත්කම් කිරීමට කොටසක් වෙන්කරන්න : භාවස්ටයිම් ජාත්‍යන්තර ජාලය ලෝක එවැන්ජලිස්ත සේවය, කෙරෙහි අවධානය යොමු කරන බැවින්, අපගේ සියලුම මෙහෙයන් සඳහා ගන්නා උත්සාහයන් යාච්ඤාවෙන් එකතු කිරීමට අපට අවශ්‍යය. මේ හේතුවෙන්, අන්තර් ජාතික මැදහත්කම් පිළිබඳ පහත විස්තරාත්මක මාර්ග උපදේශනය අපි සපයන්නෙමු.

## අන්තර් ජාතික මැදහත්කම

තනිව, කුඩා කණ්ඩායම් වශයෙන් හෝ සම්පූර්ණ සභා සහභාගිකමකදී පාවිච්චි කළ හැකි අන්තර් ජාතික මැදහත්කම පිළිබඳ විශේෂ මඟ පෙන්වීමක් පහත දැක්වේ :

### දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න : (විනාඩි 10)

අපි දෙවියන්වහන්සේගේ අභිමුඛයට ඇතුළු වන්නේ ස්තුති දීමෙන් හා ප්‍රශංසාවෙනි : ගීතාවලිය 100:4

### පොදුවේ ලෝකය උදෙසා මැදහත්කම් කරන්න : (විනාඩි 10)

ඔබ මැදහත්කම් කිරීමට පෙර පෞද්ගලික පසුතැවීමේ යාච්ඤාවක් කරන්න : ඊළඟට පොදුවේ ලෝකය උදෙසා පහත කරුණු ගැන යාච්ඤා කරන්න.

- ලෝකය පුරා අලුත් ආත්මික පිපාසයක් ඇතිවන ලෙස

- ලෝකය පුරා දෙවියන්වහන්සේ ජාත්‍යන්තර මැදහත්කමේ බලකායක් නැඟුටුවන ලෙස

- ලෝකයේ සෑම තැනකම සභාවේ වර්ධනය හා දියුණුව උදෙසා

- "අස්වැන්න උදෙසා සේවකයන්" දෙවියන්වහන්සේ විසින් නැඟිටුවන ලෙස

- පවතින සභාවන් හා සේවයන් අතර එක්සත් බව හා සහයෝගය උදෙසා

- විනාශ වන සෙනඟ දිනා ගැනීම උදෙසා උද්යෝගය හා අනුකම්පාව පුබුදුවන ලෙස

- ශුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා පවතින සම්පත් නැණවත් ලෙස පාවිච්චි කිරීමට ඇදහිලිවන්තයන්ට හැකිවන ලෙස. අවශ්‍ය මූලාධාර සපයන ලෙස හා එවැන්ජලිස්ත කටයුතු වලට මුදල් දීමට කැමති හා හැකියාව ඇති අය නැඟිටුවන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න.

- ශුභාරංචිය බෙදා ගැනීමට "කතාකරීමට හැකි අවස්ථාවන් වල දොරටුව" විවර වන ලෙස (එපීස 6:19)

- "වැසුණු දේශයන්" ශුභාරංචියට විවර වන ලෙස (2 තෙසලෝනික 3:1)

- ශුභාරංචියට සවන් දෙන්නන් එයට ඉක්මනින් ප්‍රතිචාර දැක්වීම උදෙසා (රෝම 15:30-31)

- ශුභාරංචිය ප්‍රචාරයට බාධා කරන ලෝකයේ ප්‍රධාන සිදුවීම් උදෙසා

- ආණ්ඩුවේ හා දේශපාලනික නායකයන්ගේ හදවත් වලට සේවයේ හා එවැන්ජලිස්ත සේවයේ කාර්යයන් ඉක්මනින් වැටහෙන ලෙස

- අලුත් සභාවන් හා සේවයන් ආරම්භ කිරීමට සේවකයන් උදෙසා

- ක්‍රිස්තුස්වහන්සේ වෙත වූ තමන්ගේ කැපවීම නිසා හෝ තමන්ගේ සේවය නිසා හිරගතව සිටින ඇදහිලිවන්තයන් උදෙසා

- ලෝකය පුරා සිටින බයිබල් පරිවර්තකයන්ගේ කටයුතු උදෙසා

- ලෝකය පුරා ඇති කිතුනු තැපැල් පාඨමාලා, පුහුණු ආයතන හා බයිබල් විද්‍යාල උදෙසා

- ජාතික කිතුනු සේවකයන් උදෙසා

- විවිධ සංස්කෘත සමඟ ක්‍රියා කරන මිෂනාරි බලකාය උදෙසා

- තරුණ පරපුර අතර දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය උදෙසා, සභාවේ අනාගත නායකයන් ඔවුන්ය.

- ලෝකයේ ජාතීන් හා ගම්මාන වෙත ළඟා වීමට නිවැරදි උපක්‍රමය එළිදරව් වන ලෙස හා මෙම ප්‍රදේශ වලට සේවය කරන අයට එය එළිදරව් කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. සේවය පිළිබඳ සමීක්ෂණ හා උපක්‍රමික කටයුතු වලට නියැළෙන සංවිධාන උදෙසා යාච්ඤා කරන්න.

- සේවකයන් සාතන්ගේ පහර දීම් වලින් ආරක්ෂා කරන ලෙසද ඇදහිලිවන්තයන්ට හා ජාතීන්ට විරුද්ධව ඇති සාතන්ගේ ක්‍රියාවන්ද බැඳ දමන්න. ශුභාරංචියට විරුද්ධ වන්නන්ට ගැළවීම උදෙසා යාච්ඤා කරන්න (රෝම 15:30-31; 2 තෙසලෝනික 3:2).

- ලෝකය පිළිබඳ බයිබලීය දෘෂ්ටිය ඇදහිලිවන්තයන් අතර පැතිරී ඔවුන් දේව සැළැස්මේ ප්‍රේක්ෂකයන් නොව ඊට සහභාගී වන්නන් වන පිණිස.

- විවිධ රටවල ලෞකික ස්ථානවල රැකියා කරන අයට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට හැකිවන ලෙස

- ලෝකයේ විවිධ ප්‍රදේශවල අවිගත් බලකා වල සිටින ඇදහිලිවන්තයන් උදෙසා, ඔවුන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීමේදී බලපෑමක් කළ හැකි ආකාරයේ බලවේගයක් විය හැකිය.

- ශුභාරංචිය පටිගත කිරීම්, චිත්‍රපට, කැසට්පට, කිතුණු ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා වැනි මාධ්‍ය මඟින් කෙරෙන ආගමික කටයුතු.

- ශුභාරංචිය ප්‍රකාශ කිරීම සමඟ වෛද්‍ය හා ශාරීරික සහය සපයන වෛද්‍ය වෘත්තීමය, සහන සැලසීම හා සමාජ සේවාවන් උදෙසා.

- මිෂනාරි ගුවන් සමාගමේ හා ලෝකයේ විවිධ ප්‍රදේශ වෙත මිෂනාරිවරු හා බඩු බාහිර ආදිය ගෙන යන කැපවුණු ගුවන් නියමුවන් උදෙසා.

- සරණාගතයන් හා අනාථ වූවන් උදෙසා සේවය සඳහා,

- රටවල් හා ප්‍රදේශ වල බලපෑම් ඇති කරන සාතන්ගේ ආත්මික බලවේග බැඳ දැමීම උදෙසා. දානියෙල්ගේ පර්සියාව කෙරෙහි අධිපතිකම් කළ කුමාරයා වශයෙන් දක්වනු ලැබූයේ දැනටම පවතින මෙවැනි බලවේග වේ.

- ඇතැම් රටවල් අනෙක් රටවලට වඩා ඉක්මනින් ශුභාරංචියට ප්‍රතිචාර දක්වන්නේ මන්ද යන්න මෙම බලවේග මඟින් පැහැදිලි කරයි. ඇතැම් ආත්ම විවිධ ප්‍රදේශ වල ක්‍රියාකාරීවේ. ඒවා බැඳ දමන තුරු මෙම ප්‍රදේශ ශුභාරංචිය වටහා නොගනු ඇත.

### ලෝකයේ එක් ප්‍රදේශයක් උදෙසා මැදහත්කම් කිරීම : (විනාඩි 10)

ඔබ ජාතීන් උදෙසා යාච්ඤා කරන විට ලෝක සිතියම පාවිච්චි කරන්න. සෑම ජාතියක් ගැනම යාච්ඤා කළ යුතු නිශ්චිත කරුණු සමහරක් පහත දැක්වේ.

- වත්මන් සිදුවීම්, සිදුවන වත්මන් සිදුවීම් නිරීක්ෂණය කිරීමෙන් හෝ එහි සිටින කිතුණු සේවකයන් සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන් ඔබට නිශ්චිත යාච්ඤා අවශ්‍යතා ගැන දැන ගත හැකිය.

- රටෙහි පවතින සභාවන් උදෙසා.

- මෙම රටෙහි ආත්මික කෙතේ වැඩ කරන අය උදෙසා : සභාවන් ආරම්භ කරන අය, ජාතික සේවකයන්, පුහුණු කිරීමේ ආයතන, මිෂනාරීවරු, බයිබල් පරිවර්තකයන්, වෙනත් යන උදෙසා.

- මෙම රටේ සිටින සියලුම ඇදහිලිවන්තයන් උදෙසා.

- රටෙහි සිටින ශුභාරංචිය නොලත් ජනයා උදෙසා.

- මෙම රට තුළ ක්‍රියාත්මක වන සාතන්ගේ බලවේග බැද දමමින්: ශුභාරංචිය ප්‍රකාශ කිරීමට විරුද්ධ වන හා එවැන්ජලිස්ත ක්‍රියාවන් උදෙසා දොරටු වසා දමන බලවේග උදෙසා.

- සෑම සමාජයකම පුද්ගලයන්ගේ සිතීමේ රටාව හැඩගස්වන හා රටෙහි ඉරණම තීරණය කරන ක්ෂේත්‍ර 7 ක් තිබේ. ඒවා නම් නිවස, පවුල, සභාව, අධ්‍යාපනය, කලාව හා විනෝද අංශ, සන්නිවේදන මාධ්‍යයන්, ආණ්ඩුව, සහ ව්‍යාපාර. මෙම ක්ෂේත්‍ර උදෙසා මැදිහත්කම් කරන්න.

### නිශ්චිත මිෂනාරී සේවයක් හෝ ආයතනයක් උදෙසා මැදිහත්කම් කිරීම : (විනාඩි 10)

මිෂනාරී සේවය හෝ ආයතනය සමඟ සම්බන්ධතා පැවැත්වීමෙන් යාච්ඤා කිරීම සඳහා විශේෂිත අවශ්‍යතාවයන් පිළිබඳ ඔබට දැන ගත හැකිය. ඔවුන්ගේ ප්‍රවෘත්ති ලිපි හෝ යාච්ඤා දැන්වීම් පත්‍රිකා ලබා ගැනීමේ ලැයිස්තුවට ඔබේ නම ඇතුළත් කරගන්න.

### ශුභාරංචිය නොඇසූ පුද්ගල කණ්ඩායමක් උදෙසා යාච්ඤාව : (විනාඩි 10)

ශුභාංරචිය නොඇසූ පුද්ගලයන් කණ්ඩායම් 5 බෞද්ධයන්, හින්දු බැතිමතුන්, ගෝත්‍ර වැසියන්, මුස්ලිම්වරු හා චීන ජනයාය.

- මෙම මිනිසුන්ට ආත්මික අවශ්‍යතාවයක් ඇති විම උදෙසා යාච්ඤා කරන්න.
- ඔවුන් සමඟ ශුභාරංචිය දේශනා කිරීමට සේවකයන් උදෙසා යාච්ඤා කරන්න.
- සෑම තනි කණ්ඩාමක් වෙතට ළඟා වීමට අවශ්‍ය උපක්‍රමය එළිදරව් කරන මෙන් යාච්ඤා කරන්න.
- මෙම මිනිසුන් වෙත ළඟා වීමට දැනටමත් උත්සාහ කරන අය උදෙසා යාච්ඤා කරන්න.

### පෞද්ගලික යාච්ඤාව : (විනාඩි 10)

ලෝකය හා සම්බන්ධ ඔබේ පෞද්ගලික අවශ්‍යතාවයන් සළකන්න. ඔබගේ පෞද්ගලික අවශ්‍යතාවයන් ලෝකය උදෙසා වූ දේව සැළැස්මට හා එතුළ ඔබේ කොටසට ගැලපෙන්නේ කෙසේද? ඔබගේ ඉතාම පෞද්ගලික අවශ්‍යතා පවා කෙසේ හෝ ලෝකය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැළැස්මට සම්බන්ධ විය යුතුය. රාජ්‍යයේ ශුභාරංචිය සමඟ ලෝකයේ ජාතීන් වෙත ළඟා වීමේ ආඥාවේ ඔබේ කොටස සම්පූර්ණ කළ හැකි ආකාරයන් දැනගැනීම සඳහා දෙවියන්වහන්සේ සොයන්න. මෙය කිරීම සඳහා ඔබට යහපත් ලෙස ඔබව යෙදවිය හැක්කේ කෙසේද? ඔබට දැන්ම ආරම්භ කළ හැක්කේ කෙසේද? ලෝකය උදෙසා වූ සේවය සඳහා ඔබට ඔබේ පෞද්ගලික කාලය හා මුදල් වඩා යෙදවිය හැක්කේ කෙසේද?

## ජයග්‍රහණය කළ යුතු ගැටලු

බලපෑමක් කළ හැකි පරිදි යාච්ඤා කළ හැකි හැම කෙනෙක්ම ජය ගත යුතු ගැටලු වලට මුහුණ දුන්හ. මෙම අභියෝග ජයගැනීම මැදහත්කමේ කොටසකි.

*"යාච්ඤාවෙන් සටන් කිරීම යනු ජයග්‍රාහී ලෙස යාච්ඤා කිරීමෙන් අපව වළකාලන හෝ සම්පූර්ණයෙන්ම ඉවත් කර තබන බාධාවන් තුළින් පොර බැදීමයි. එහි අදහස අප යාච්ඤාවට කම්මැලි වන විට සහ මෙය ප්‍රතිකාර වශයෙන් අප යාච්ඤාවේ ආත්මයට ඇතුළු වන විට ඒ බව දැන ගැනීම සඳහා පරීක්ෂාවෙන් සිටීම වේ"*

-ආචාර්ය ඕ. හැල්ස්බයි.-

"යාච්ඤාවේ ආත්මයාණන්" (ශුද්ධාත්මයාණන්වහන්සේ) තුළින් ඔබගේ ප්‍රශ්න වලට ප්‍රතිකාර කරන දෙවිඳුන් වෙත ඔබ මුහුණ දෙන සෑම ප්‍රශ්නයක්ම ගෙන යන්න. ඔබට මුහුණ දීමට සිදුවිය හැකි ඇතැම් පොදු ගැටලු සමහරක් පහත දැක්වේ.

## කාලය මද වීම :

අපට සැබවින්ම කිරීමට අවශ්‍ය දේවල් සඳහා අප සෑම විටම කාලය සොයා ගන්නෙමු. කාලය මද වීම නිදහසට කරුණක් නොවේ. ඔබ කාර්යය බහුල වන තරමටම ඔබ මැදහත්කම් කළ යුතුවේ. යාච්ඤාව සඳහා කාලය වෙන් කර ගන්න. එසේම කිසිම දෙයකට එම කාලයට ඇතුලුවීමට ඉඩ නොදෙන්න. ඔබ යාච්ඤාව සඳහා ගත කරන කාලය අන් අය ගත කරන කාලය මත පදනම් නොකරන්න. මක්නිසාද ඔබ යාච්ඤා කරන කරුණු අනුව ඔබට වඩා වැඩි හෝ අඩු කාලයක් වැය විය හැකිය. බලපෑමක් කිරීම සඳහා මැදහත්කම දිගු වීම අවශ්‍ය නොවේ. කුරුසිය මත සිටි සොරාගේ යාච්ඤාවේ බලපෑම ("ඔබගේ රාජ්‍යයට ඔබ පැමිණෙන කල මා සිහිකළ මැනව"),හෝ අයබදු එකතු කරන්නාගේ අවංක ආයාචනයේ බලපෑම (" ස්වාමිනි පව්කාරයකු වු මට කරුණා කළ මැනව"), පරිසියාගේ දිගු, ස්වධර්මිෂ්ඨ යාච්ඤාව සමඟ සසදා බලන්න.

## අවධානය ඉවතට ගන්නා දේවල් :

මැදහත්කම් කරන කාලය අතරතුර බාධාවන් අවම කර ගැනීමට උත්සාහ කරන්න. මේ කාලය අතරතුර ඔබට බාධා කිරීම් සිදු නොවිය යුතු බවට ඔබගේ සහකරුට හෝ සහකාරියට, ලේකම්වරයාට හෝ මිතුරාට උපදෙස් ලබා දෙන්න. ඔබට දුරකථනයක් තිබේ නම්, වෙනත් කෙනෙකුට ඊට පිළිතුරු දෙන ලෙස පවසන්න. නැතහොත් එය විසන්ධි කරන්න, නොඑසේනම් පිළිතුරු දීමට යන්ත්‍රයක් පාවිච්චි කරන්න. ගුවන්විදුලි හෝ රූපවාහිනි යන්ත්‍රයක් ක්‍රියාත්මක වන තැන සිට යාච්ඤා නොකරන්න. ඇතැම් විට සෙමින් නාද වන කිතුනු සංගීතයක් මඟින් වාහන තද බදය නිසා හෝ වෙනත් අයගේ සාකච්ඡාවන් නිසා ඇතිවන බාධාවන් මඟහරවා ගත හැකිය.

## වෙහෙස :

යාච්ඤා කාලය අතතුරදී ඔබ වෙහෙසට හෝ නිදිමතට පත්වුවහොත් ඇවිදිමින් යාච්ඤා කිරීම හෝ හඬ නඟා යාච්ඤා කිරීමට උත්සාහ කරන්න.

## ආශාවක් නැතිකම :

මැදහත්කමේ සේවය උදෙසා වු ආශාවන් ක්‍රමානුකූලව වර්ධනය කළ හැකිය. එය ආරම්භ වන්නේ ඔබ එයට කැමති බව "හැඟුනත්" නැතත් එය දිගටම කරගෙන යාමෙනි. අපගේ සම්පූර්ණ කිතුනු අත්දැකීම් පදනම් වී ඇත්තේ හැඟීම් මත නොව, ඇදහිල්ල මතය, ඔබගේම ජීවිතය තුළ හා ඔබ මැදහත් කරන අන් අයගේ ජීවිත තුළ මැදහත්කමේ ප්‍රතිඵල ඔබ දකින විට, ඔබගේ යාච්ඤා කාලය හික්මවීමෙන් කරන දෙයක සිට ආශාවෙන් කරන දෙයක් දක්වා වෙනස් වනු ඇත.

*"ඔබට ආශාව දෙන්නේ කවුරුන්ද? සැබවින්ම දෙවියන්වහන්සේය. උන්වහන්සේ එය ඔබට ලබා දෙන්නේ සම්පූර්ණ නොවී තබා ගැනීමටද? එය සිදුවිය නොහැකි දෙයකි. උන්වහන්සේ යම්දෙයක් පිළිබඳ ආශාවක් ඔබ තුළ ඇති කරන්නේ එම දෙය ඔබට ලබා දීමේ චේතනාවද ඇතිව වේ; ඔබ එය නිවැරදි ලෙස ඉල්ලුවහොත් උන්වහන්සේ එය ඔබට සහතික ලෙස දෙනු ඇති අතර...නිවැරදි ආයාචනය කිරීමටද උන්වහන්සේ ඔබට උපකාර කරනු ඇත."*

*-ජීන්-නිකලස් ග්‍රෝ.-*

# අවසානයේ ආරම්භය

අප මැදහත්කම පිළිබඳ අපගේ අධ්‍යයනයේ අවසානයට පැමිණ තිබේ. කෙසේ වෙතත්, සැබවින්ම එය අවසානයක් නොව ආරම්භයකි. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට ලබා ගත හැකි ඉතාම බලවත් ආත්මික සම්පත ඔබ ලබා ගත්තා පමණි...එනම් මැදහත්කමයි. මැදහත්කම තුළින්, ඔබට ආත්මිකව ලෝකයේ ඕනෑම තැනකට යා හැකිය. ඔබගේ යාච්ඤාවන්ට ශුභාරංචිය ළඟා නොවුනු දේශයන්ට ඇතුළුවන්නට, භූගෝලීය, සංස්කෘතික හා දේශපාලන බාධක තුළින් ගමන් කිරීමට හැකිය. ඔබට තනි පුද්ගලයන්ගේ මෙන්ම මුළු මහත් රටවල් වලම ඉරණමට බලපෑම් ඇති කළ හැකිය. ඔබට සැබවින්ම පුරුෂයන්ගේ හා කාන්තාවන්ගේත්, පිරිමි හා ගැහැණු ළමුන්ගේත් ජීවිත හා ආත්ම ගළවා ගැනීමට උපකාර විය හැකිය.

මැදහත්කම තුළින් ඔබ දෙවියන්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයකට ඇතුළු වී තිබේ. පහත දේවල් දැනගෙන ඔබට විශ්වාසයෙන් යුතුව යාච්ඤා කළ හැකිය :

> **සේනාවල ස්වාමීන්වහන්සේ දිවුරා කථාකොට: මා යෝජනාකළ ලෙසම සිදුවන්නේය: මා අදහස්කළ ලෙසම ස්ථිරවන්නේය. (යෙසායා 14:24)**
>
> **මුළු පොළොව කෙරෙහි අදහස්කර තිබෙන අදහස මේය. සෑම ජාතීන් කෙරෙහි දිඟුකර තිබෙන හස්තයත් මේය. මක්නිසාද, සේනාවල ස්වාමීන්වහන්සේ අදහස්කළසේක, එය අවලංගු කරන්නේ කවුද? උන්වහන්සේගේ අත දිඟුකර තිබේ. එය ආපසු හරවන්නේ කවුද? (යෙසායා 14:26-27)**

සේනාවල ස්වාමීන්වහන්සේට අරමුණක් තිබෙන අතර, ලෝකයේ, මාංශයේ, යක්ෂයන්ගේ, නිරයේ කිසිඳු බලවේගයකට හෝ සාතන්ටවත් ඊට බාධා කළ නොහැකිය. මැදහත්කම් කිරීමේ සේවය තුළින් ඔබ දැන් එම දිව්‍යමය අරමුණේ කොටසක් බවට පත් වී ඇත. කැනොන් ලිඩන් මඟින් මැදහත්කම පිළිබඳව ඉදිරිපත් කරන ලද මෙම බලවත් විස්තරයත් සමඟ අපි අවසන් කරන්නෙමු

> *"මැදහත්කම යනු පුරුද්දක් ලෙස කරන, නීරස හා යාන්ත්‍රික දෙයක්ය යන්න සැබෑවක්ද? සැබවින්ම යාච්ඤා කර ඇති අයට පිළිතුරු දීමට ඉඩ දෙමු.*
>
> *ඔවුන් ඇතැම් විට ආදි පියා යාකොබ් කළා වැනි, සැබෑ ජීවිතය තුළ නිරතුරුව, බොහෝ රෑ බෝ වනතුරු, හෝ දවස අවසානය දක්වා, නොපෙනෙන බලවේගයක් සමඟ සිදු කරන පොර බැඳීමක් ලෙස යාච්ඤාව විස්තර කරයි. ඇතැම් විට ඔවුන් පාවුල් මෙන් පොදු මැදහත්කම සම්මත පොරබැඳීමක් ලෙස දක්වයි.*
>
> *යාච්ඤා කරන විට ඔවුන් තම දෙනෙත් යොමු කරනුයේ ගෙත්සෙමනෙහි ශ්‍රේෂ්ඨ මැදහත්කරුවාණන් දෙසට හා එම කටුක සමුගැනීම හා පූජාව නිසා වැගුරුනු ලේ බිඳු දෙසටය.*
>
> *සාර්ථක මැදහත්කමේ සාරය ඕනෑකමින් ඉල්ලීමයි (නොකඩවා ඉල්ලීමයි). එහි අදහස උනන්දුවක් නැතිකම නොව නොනවත්වා වැඩ කිරීමයි. ස්වර්ග රාජ්‍යය බලාත්කාරයෙන් ගනු ලැබේ. බලාත්කාරකරන්නෝ ඒක බලයෙන් අල්ලා ගනිති. විශේෂයෙනම මෙය කළ හැක්කේ මැදහත්කම තුළිනි."*
>
> *-කැනොන් ලිඩන්.-*

එවැනි කැපකිරීමක් කිරීමට ඔබ සූදානම්ද?

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

________________________________________________________________________

________________________________________________________________________

2. ඔබගේ පෞද්ගලික යාච්ඤා සැලැස්ම ලියා දක්වන්න. ඔබ ආරම්භ කරන්නේ කවදාද? සෑම දිනකම ඔබ යාච්ඤාව සඳහා වෙන් කරන්නේ කුමන කාලයද? ඔබ යාච්ඤා කරන්නේ කොහේදීද?

________________________________________________________________________

________________________________________________________________________

________________________________________________________________________

3. යාච්ඤා ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධව මෙම පාඩම තුළ සාකච්ඡා කරන ලද ගැටලු වලින් ඔබට ජය ගැනීමට ඇති ගැටලු මොනවාද?

________________________________________________________________________

________________________________________________________________________

________________________________________________________________________

4. ඔබ ඔබගේ පෞද්ගලික යාච්ඤා අත්පොත සකස් කර තිබේද?______________එසේ නොවේ නම්, මෙම පරිච්ඡේදයේ “තවදුරටත් අධ්‍යයනය සඳහා” කොටස සළකා බලන්න.

5. දිනපතා මැදහත්කමේ කාලයක් සඳහා ඔබ කැපවී සිටීද?________________________________

6. ඔබ දේවගැතිවරයෙකු, ගුරුවරයෙකු හෝ වෙනත් කණ්ඩායමක නායකයෙකු නම්, ඔබගේ සභාව, සිසුන් හෝ කණ්ඩායමේ සාමාජිකයන්ද ඇතුළත් කරමින් එක්සත් යාච්ඤාව සඳහා සැළැස්මක් පිළියෙල කරන්න.

________________________________________________________________________

________________________________________________________________________

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

ඔබේ පෞද්ගලික යාච්ඤා අත්පොතක් පිළියෙල කිරීමේදී උපකාරී වීමට මඟපෙන්වීමක් පහතින් සපයා තිබේ.

## පළමු කොටස : අධ්‍යයන සටහන්

ඔබට නිරන්තරයෙන් කියවා බැලිය හැකි වන පරිදි මැදහත්කම හා නිරාහාරය පිළිබඳ ඔබේ අධ්‍යයන සටහන් මෙම කොටසට ඇතුළු කරන්න.

## දෙවන කොටස : නගරය, ප්‍රාන්තය, රට

ඔබගේ නගරයේ, ප්‍රාන්තයේ හා රටේ සිතියම් ලබාගෙන ඒවාට යාච්ඤා කරන්න. දේශපාලනික හා ආගමික නායකයන්ගේ ලැයිස්තුවක් ගෙන ඔවුන් උදෙසා නම කියා යාච්ඤා කරන්න. "ආත්මික සිතියම්ගත කිරීම" සඳහා ඔබේ අසල්වාසීන්, නගරය, ප්‍රාන්තය හෝ ජාතිය පිළිබඳව එකතු කරගත් තොරතුරු ඇතුළත් කරන්න.

## තෙවන කොටස : පෞද්ගලික මැදහත්කම

**පෞද්ගලික අවශ්‍යතා :** ඔබගේ පවුලේ, මිතුරන්ගේ හා වෙනත් අයගේ පෞද්ගලික අවශ්‍යතා ලියා ඒවා උදෙසා සෑම දවසකදීම මැදහත්කම් කරන්න. මැදහත්කමේ සේවයෙහිදී ඔබව ධෛර්යමත් කිරීම සඳහා පිළිතුරු ලැබුණු යාච්ඤාවන් වාර්තා කරගන්න.

**ඔබේ සභාව :** ඔබගේ සභාවේ සංවිධාන ව්‍යුහය දැක්වෙන වගුවක් හෝ නායකයන්ගේ නම් ලැයිස්තුවක් ලබා ගෙන ඔවුන් උදෙසා හැම දවසකදීම යාච්ඤා කරන්න. ඔබේ සභාවේ සෑම සාමාජිකයෙකුගේම නම කියා යාච්ඤා කරන්න.

**ඔබේ සේවය :** ඔබේ පෞද්ගලික සේවය උදෙසා මැදහත්කම් කරන්න. ඔබ බයිබල් පන්තිය උගන්වන්නේ නම් ඔබගේ සිසුන් උදෙසා යාච්ඤා කරන්න. ඔබ දේවගැතිවරයෙකු නම්, ඔබගේ සභාවේ සෑම සාමාජිකයෙකුගේම නම කියා යාච්ඤා කරන්න. ඔබ දෙමව්පියෙක් නම්, ඔබේ දරුවන් උදෙසා යාච්ඤා කරන්න (ඔවුන් ඔබේ සේවයේ කොටසකි). ඔබ මිෂනාරිවරයෙකු හෝ එවැන්ජලිස්තවරයෙකු නම්, ශුභාරංචිය සඳහා දොරටු විවර වන ලෙස, දෙවියන්වහන්සේ වෙතට හැරෙන්නන් උදෙසා, ගෝලයන් සහ ඔබ සමඟ වැඩ කරන්නන් උදෙසා යාච්ඤා කරන්න.

## සිව්වන කොටස : අන්තර්ජාතික මැදහත්කම

මෙම කොටස තුළ, මෙම පරිච්ජේදයේදී ලබා දුන් අන්තර්ජාතික මැදහත්කම පිළිබඳ මාර්ගෝපදේශන වල පිටපතක් තබා ගන්න. මෙම කොටසට ඇතුළු කිරීම සඳහා විවිධ රට වල සිතියම් ද ඔබට ලබා ගත හැකිය.

# උපග්‍රන්ථ

## පළමු උපග්‍රන්ථය : බයිබලයේ යාච්ඤා ලැයිස්තුව

මැදහත්කමේ යාච්ඤාව සඳහා ඇති හොඳම ආදර්ශය යේසුස්වහන්සේ බව ඔබ මෙම පාඨමාලාවේදී ඉගෙන ගත්තේය. බයිබලයේ බලවත් මැදහත්කරුවන් පිළිබඳ තවත් බොහෝ උදාහරණ තිබේ. බයිබලයේ ඇති සියලුම යාච්ඤාවන් පහත ලැයිස්තුව තුළ අන්තර්ගත වේ. මෙම යාච්ඤාවන් හා එම යාච්ඤාවන් කළ අයගේ ජීවිත ගැන අධ්‍යයනය කිරීම තුළින් මැදහත්කමේ යාච්ඤාව පිළිබඳ ඔබගේ දැනුම වර්ධනය කර ගැනීමට මෙම උපග්‍රන්ථයේ සපයා ඇති අධ්‍යයන මාර්ගෝපදේශනය පාවිච්චි කරන්න.

### පැරණි ගිවිසුමේ සඳහන් යාච්ඤාවන්

**උත්පත්ති :**

යාච්ඤා ඉතිහාසයේ ආරම්භය : 4:26
යාච්ඤාව හා ආත්මික වර්ධනය : 5:21-24
යාච්ඤාව හා පූජාසනය : 12-13
උරුමකරුවකුගේ යාච්ඤාව : 15
ආයාචනයේ භාෂාව වන, යාච්ඤාව : 16
යාච්ඤාව හා එළිදරව්ව : 17
නපුරු නගරයක් උදෙසා යාච්ඤාව : 18-19
ප්‍රමාද දෝෂයකට පසුව කරන යාච්ඤාව : 20
කීකරුකමේ යාච්ඤාව : 22
මනාලියක් උදෙසා යාච්ඤාව : 24
වඳ බිරිඳක් උදෙසා යාච්ඤාව : 25:19-23
දේවල් වෙනස් කරන යාච්ඤාව : 26
බාරයක් ලෙස වන යාච්ඤාව :28
වරදකාර සහෝදරයෙකු ගැන යාච්ඤාව : 32
සැඟවුණු ගින්නක් වැනි වූ යාච්ඤාව : 39-41; 45:5-8; 50:20,24
ගෝත්‍ර වලට ආශිර්වාද ඉල්ලීමේ යාච්ඤාව : 48-49

**නික්මයාම :**

කෙඳිරීමක් ලෙස ඉදිරිපත් කළ යාච්ඤාව : 1-2
දෙබසක් ලෙස වූ යාච්ඤාව : 3-4
පැමිණිල්ලක් ලෙස වූ යාච්ඤාව : 5-7
සර්වබලධාරීත්වය සමඟ සම්බන්ධ වූ යාච්ඤාව : 8-10
ප්‍රශංසාව ලෙස වූ යාච්ඤාව : 15
උපද්‍රවයේදී කළ යාච්ඤාව : 17
අවශ්‍යතාවයන් සහිත අය උදෙසා වූ යාච්ඤාව : 22:22-24
ලැබිය යුතු විනිශ්චයක් ප්‍රමාදය උදෙසා යාච්ඤාව : 32
ඉශ්‍රායෙලය උදෙසා මෝසෙස්ගේ පළමු යාච්ඤාව : 32:9-14
මෝසෙස්ගේ දෙවන යාච්ඤාව : 32:30-34
මෝසෙස්ගේ තෙවන යාච්ඤාව : 33:12-23
යාච්ඤාව හා අන්වෙසක්වීම : 34

**ගණන්කථාව :**

ආශිර්වාදයක් ලෙස කළ යාච්ඤාව : 6:24-27
ආරක්ෂාව හා රැකවරණය උදෙසා යාච්ඤාව : 10:35-36
විනිශ්චයක් ඉවත් කරන ලෙස කළ යාච්ඤාව : 11:1-2
අධෛර්යයට පත් හදවතක් උදෙසා වූ යාච්ඤාව : 11:10-35
යටහත් මිනිසෙකුගේ යාච්ඤාව :12

දිව්‍යමය ගෞරවය ඔසවා තැබීමේ යාච්ඤාව : 14
කැරළිකාර කමට එරෙහිව දිව්‍යමය පියවරක් උදෙසා වූ යාච්ඤාව : 16
මරණයෙන් නිදහස් වීම උදෙසා යාච්ඤාව : 21
යාච්ඤාව හා අනාගත වාක්‍යය : 23-24
නව නායකයෙකු උදෙසා යාච්ඤාව : 27

**ද්විතිය කථාව :**

වරප්‍රසාද ලත් කාර්යයක් උදෙසා යාච්ඤාව : 3:23-29
ළඟින් සිටින අයෙකු උදෙසා යාච්ඤාව : 4:7
විනිශ්චයක් වැළැක්වීම උදෙසා යාච්ඤාව : 9:20, 26-29
ආශිර්වාදයක් වැනි යාච්ඤාව : 21:6-9
ස්තුතිදීමක් වැනි වූ යාච්ඤාව : 26
ගීතයක් ලෙස වූ යාච්ඤාව : 32-33

**යොෂුවා :**

අභියෝගයක් වැනි වූ යාච්ඤාව : 5:13-15
දෙවියන්වහන්සේ පිළිතුරු නොදෙන යාච්ඤාව : 7
දරුණු ප්‍රතිඵයක් සමඟ නොසලකා හරින ලද යාච්ඤාව : 9:14
හාස්කමක් ඇති කරන යාච්ඤාව : 10

**විනිශ්චයකරුවන්ගේ පොත :**

මඟපෙන්වීම උදෙසා වූ යාච්ඤාව : 1
යුදසමයේදී කරන යාච්ඤාව : 4-5
ලකුණු උදෙසා යාච්ඤා කිරීම : 6
ව්‍යසනයේදී කරන යාච්ඤාව : 10:10-16
කේවල් කිරීමක් වැනි වූ යාච්ඤාව : 11:30-40
නොඉපදුණු දරුවෙකු උදෙසා යාච්ඤාව : 13
මරණය අභියසදී කළ යාච්ඤාවක් : 16:28-31
සෘජුව පිළිතුරු ලත් යාච්ඤාවක් : 20:23-28
නැතිවූ ගෝත්‍රයක් උදෙසා වූ යාච්ඤාව :21:2-3

**1 සාමුවෙල් :**

වචන වලින් තොර යාච්ඤාව : 1
පිටත පෙනුමෙන් අනාගත වාක්‍යයක් වැනි වූ යාච්ඤාව : 2:1-10
දේවස්ථානයේදී කළ යාච්ඤාව : 3
ජාතික ව්‍යසනයක් උදෙසා යාච්ඤාව : 7
රජ කෙනෙකු උදෙසා යාච්ඤාව : 8
නිදොස් කිරීමක් වැනි වූ යාච්ඤාව : 12
පීඩාවට පත් රජෙකු උදෙසා යාච්ඤාව : 14
ශෝකයෙන් පිරුණු හදවතක යාච්ඤාව : 15:11
කුඩා නිශ්චල හඬක් වැනි වූ යාච්ඤාව : 16:1-12
ධෛර්යයේ රහස වැනි වූ යාච්ඤාව : 17
විමසීමක් වැනි වූ යාච්ඤාව : 23
බිහිරි කන් උදෙසා වූ යාච්ඤාව : 28:7
යුද්ධයෙන් විනාශ වූ දේවල් නැවත ගොඩනැඟීම උදෙසා වූ යාච්ඤාව : 30

**2 සාමුවෙල් :**

අයිතිය උදෙසා යාච්ඤාව : 2:1
ජයග්‍රහණයේ ලකුණු උදෙසා යාච්ඤාව : 5:19-25
නිවස හා රාජධානිය මත ආශිර්වාදය උදෙසා යාච්ඤාව : 7:18-29
රෝගී දරුවකු උදෙසා යාච්ඤාව : 12

රුවට්ලිකාර යාච්ඥාව : 5:7-9
විපත්තිය තේරුම් ගැනීම උදෙසා යාච්ඥාව : 21:1-12
ගීතිකාවක් වැනි යාච්ඥාව : 22
උඩගුකම ගැන පාපොච්චාරණය කිරීමේ යාච්ඥාව : 24:10-17

**1 රාජාවලිය :**

බුද්ධිමත් හදවතක් උදෙසා යාච්ඥාව : 3
කැපවීමේ යාච්ඥාව : 8:12-61
වියැලුණු අතක් උදෙසා යාච්ඥාව : 13:6
වැසුණු ආකාශය උදෙසා යාච්ඥාව : 17
මැරුණු පුත්‍රයා නැවත නැඟිටීම උදෙසා යාච්ඥාව : 17:20-24
දිව්‍යමය ගෞරවය උදෙසා යාච්ඥාව : 18:16-41
යාච්ඥාව හා දැඩි උත්සාහය : 18:45
මරණය උදෙසා යාච්ඥාව :19

**2 රාජාවලිය :**

මැරුණු දරුවෙකු උදෙසා යාච්ඥාව : 4:32-37
දර්ශනයක් උදෙසා යාච්ඥාව : 6:13-17
විරුද්ධවාදී සතුරන්ගෙන් ගැළවීම උදෙසා යාච්ඥාව : 19
දිගු ජීවිතයක් උදෙසා යාච්ඥාව : 20:1-11

**1 ලේකම් :**

ආත්මික සෞභාග්‍ය උදෙසා යාච්ඥාව : 4:9-10
විශ්වාසයේ යාච්ඥාව : 5:20
හිතියේ යාච්ඥාව : 13:12
ගිවිසුමක් ඇතිකිරීම උදෙසා වූ යාච්ඥාව : 17:16-27
ගින්නෙන් පිළිතුරු ලැබුණු යාච්ඥාව : 21
මුරකරුවෙකු වැනි වූ යාච්ඥාව : 23:30
යාච්ඥාව හා දීම : 29:10-19

**2 ලේකම් :**

ජාතික අන්තරාවේදී කළ යාච්ඥාව : 14:11
යාච්ඥාව හා ප්‍රතිසංස්කරණය : 15
යාච්ඥාව හා ඉතිහාසය කෙරෙහි වූ අභියාචනය : 20:3-13
පශ්චත්තාපයේ යාච්ඥාව : 33:13

**එස්රා :**

ස්තුති දීමේ යාච්ඥාව : 7:27-28
යාච්ඥාව හා නිරාහාරය : 8:21-23
යාච්ඥාව හා පසුතැවිලිවීම : 9:5-10: 4

**නෙහෙමියා :**

කළකිරීමෙන් උපන් යාච්ඥාව : 1:4-11
සිරවීම් තුළ කළ යාච්ඥාව : 2:4
දෝෂාරෝපනයන්ගෙන් ගැළවීම උදෙසා යාච්ඥාව : 4:1-6
කෝපය ජය ගන්නා යාච්ඥාව : 4:7-9
යාච්ඥාව හා වන්දි ගෙවීම : 5
කපටිකමට එරෙහි යාච්ඥාව : 6:9-14
යාච්ඥාව හා දේව වචනය : 8:1-13
යාච්ඥාව හා දෙවියන්වහන්සේගේ යහපත්කම : 9

මතක තබා ගැනීම උදෙසා යාච්ඤාව : 13:14, 22, 29, 31

**යෝබ් :**

යටත්වීමේ යාච්ඤාව : 1:20-22
අනුකම්පාව උදෙසා යාච්ඤාව : 6:8-9; 7:17-21
නිර්දෝෂභාවය උදෙසා යාච්ඤාව : 9
අයුක්තියට එරෙහි යෝබ්ගේ යාච්ඤාව : 10
අනාචාරයට ආලෝකය ලැබීම උදෙසා වූ යාච්ඤාව : 14:13-22
යාච්ඤාව හා වාසිය : 21:14-34
යාච්ඤාව හා හේතුව : 23
සුළිසුළඟකින් පිළිතුරු ලැබුණු යාච්ඤාව : 38
පාපොච්චාරණයක් වැනි යාච්ඤාව : 40:3-5; 42:1-6
මැදහත්කමේ යාච්ඤාව : 42:7-10

**ගීතාවලිය :**

කැරලිකාරකමින් උපන් යාච්ඤාව : 3
ශුද්ධකමේ යාච්ඤාව : 4
උදෑසන බලා සිටීමේ යාච්ඤාව : 5
දිව්‍යමය ක්‍රියාවක් උදෙසා යාච්ඤාව : 7
දිව්‍යමය ක්‍රියාවකට ප්‍රශංසා කිරීම උදෙසා යාච්ඤාව : 8
දැන් සහ මින් මතුවට ආරක්ෂාව උදෙසා යාච්ඤාව : 16
කුරුසියේ යාච්ඤාව : 22
එඬේරෙකු වැනි සැළකීමක් උදෙසා යාච්ඤාව : 23
දිව්‍ය මහිමය ප්‍රකාශ වීම උදෙසා යාච්ඤාව : 24
දෙවියන්වහන්සේ වෙතට නගින යාච්ඤාව : 25
විශ්වාස කරන හදවතක යාච්ඤාව : 27
ක්‍රිස්තුස්වහන්සේගේ නිරූපණයක් වැනි වූ යාච්ඤාව : 31
ඉතා දුක්දායක ආත්මයක යාච්ඤාව : 32
සතුරන්ගෙන් ආරක්ෂාව ලැබීම උදෙසා යාච්ඤාව : 35
ප්‍රේමණීය කරුණාවට ප්‍රශංසා කිරීමේ යාච්ඤාව : 36
වන්දනාකරුවෙකුගේ යාච්ඤාව : 39,90,91
යාච්ඤාව හා එය ඉටුවීම : 40
දරුණු කළකිරීමකදී කළ යාච්ඤාව : 41
බලාපොරොත්තුවට දොරටුවක් වැනිවූ යාච්ඤාව : 42-43
දිව්‍යමය සහය උදෙසා යාච්ඤාව : 44
රක්ෂස්ථානයක් උදෙසා වූ යාච්ඤාව : 46
බිඳුනු හදවතක යාච්ඤාව : 51
සෑම කාලයකදීම කරන යාච්ඤාව : 55
කළකිරීමේ යාච්ඤාව : 57
විශ්වාසයේ යාච්ඤාව : 71
දෙවියන්වහන්සේ උදෙසා යාච්ඤාව : 73
දෙවියන්වහන්සේගේ උසස් බවට ප්‍රශංසාවක් වැනි යාච්ඤාව : 96
පරීක්ෂාවන්ගෙන් මිදීම පිණිස යාච්ඤාව : 102-103, 105
මතක් කිරීමේ යාච්ඤාව : 106
මහත් උපද්‍රවයන්ට මුහුණ දෙන අය උදෙසා වූ යාච්ඤාව : 107
යාච්ඤාව හා දේව වචනය අතර සම්බන්ධය : 19, 119
හදවත විමසීමේ යාච්ඤාව : 139

**හිතෝපදේශ :**

පොත පුරා යාච්ඤාව ප්‍රඥාව ලබා ගැනීමේ මාර්ගයක් ලෙස දක්වා තිබේ.

**දේශනාකාරයා :**

පොත, යාච්ඤාව හා එහි දෛවය ගැන සාකච්ඡා කරයි.

**සාලමොන්ගේ ගීතිකාව :**

යාච්ඤාවේ රහස්

**යෙසායා :**

දෙවියන්වහන්සේ සවන් නොදෙන යාච්ඤාව :1:15; 16:12
යාච්ඤාව හා පවිත්‍රවීම : 6
ලකුණු උදෙසා යාච්ඤාව : 7:11
උත්කෘෂ්ඨ භාවයේ යාච්ඤාව : 12
ජයග්‍රහණ උදෙසා ප්‍රශංසා කිරීමේ යාච්ඤාව : 25
සමාදානය උදෙසා යාච්ඤාව : 26
යාච්ඤාව හා විශ්වාසය : 41
යාච්ඤාව හා පුහුණුව : 55
බොහෝ දෙනා අතර ප්‍රසිද්ධ නොවූ යාච්ඤාව : 59
දිව්‍යමය බලය ප්‍රදර්ශනය කිරීමේ යාච්ඤාව : 63-64

**යෙරමියා :**

නොහැකියාව පිළිබඳ පාපොච්චාරණය කිරීමේ යාච්ඤාව : 1
පසුබට වීම ගැන දුක්වීමේ යාච්ඤාව : 2-3
පැමිණිල්ලක් වැනි වූ යාච්ඤාව : 4:10-31
කැරළිකාරකම ගැන දුක්වීමේ යාච්ඤාව : 5
සිරගෙදර සිට කළ යාච්ඤාව : 6
යාච්ඤාව තහනම් කිරීම : 7:16
යුක්තිය උදෙසා යාච්ඤාව : 10:23:25
සැකයේ යාච්ඤාව : 12:1-4
පාපයෙන් හා නියගයෙන් නිදහස්වීම උදෙසා යාච්ඤාව : 14:7-22
දිව්‍යමය පළිගැනීම උදෙසා යාච්ඤාව : 15:15-21
සතුරන් අවුල් කරන ලෙස කළ යාච්ඤාව : 16:19-21; 17:13-18
දුෂ්ඨ උපායන් බිඳ හෙලන ලෙස කළ යාච්ඤාව : 18:18-23
බලාපොරොත්තු විරහිත හදවතක යාච්ඤාව : 20:7-13
දිව්‍යමය යහපත් බවට කෘතගුණ වශයෙන් කළ යාච්ඤාව : 32:16-25
ඉතිරුවූ ඇදහිලිවන්තයන් උදෙසා යාච්ඤාව : 42

**විලාප ගී :**

වේදනාවේ යාච්ඤාව : 1:20-22
ශෝකයේ යාච්ඤාව : 2:19-22
පැමිණිල්ලක් වැනි යාච්ඤාව : 3
විරුද්ධවාදීන් උදෙසා යාච්ඤාව : 5

**එසකියෙල් :**

විරුද්ධත්වය ප්‍රකාශ කිරීමේ යාච්ඤාව : 4:14
ඉතිරිය ආරක්ෂා කිරීම උදෙසා යාච්ඤාව : 9:8-11
යාච්ඤාවේ දේවමාළිගාව : 11:13-16

**දානියෙල් :**

අර්ථකතනය කිරීම යාච්ඤාව : 2:17-18
නියෝගයට අකීකරු වීමේදී කළ යාච්ඤාව : 6:10-15

පාපොච්චාරණයේ යාච්ඤාව : 9
යාච්ඤාව හා එහි ආත්මික ප්‍රතිඵල : 10
ජීවිතයේ කෙටිබව සළකමින් කළ යාච්ඤාව : 12:8-13

**හොෂෙයා :**

පසුතැවිලිවීමේ යාච්ඤාවක් කරන ලෙස පසුබට වූ ජාතියකට දෙවියන්වහන්සේ ආයාචනා කරන සේක.

**යොවෙල් :**

හදිස්සි අවස්ථාවේදී කළ යාච්ඤාව : 1:19-20
යාච්ඤාව හා වැළපීම : 2:17

**ආමෝස් :**

විරාමය හා සමාව උදෙසා යාච්ඤාව : 7:1-9

**යෝනා :**

මිත්‍යා දෘෂ්ටික නැවියන්ගේ යාච්ඤාව : 1:14-16
අපායෙන් කරන ලද යාච්ඤාව : 2
පසුතැවිලිවන නගරයක යාච්ඤාව : 3
අමනාපවූ ප්‍රෝපේතවරයෙකුගේ යාච්ඤාව : 4

**මීකා :**

යාච්ඤාව යනු ස්වාමින්වහන්සේගේ වචනය සම්පූර්ණ කරන ලෙස උන්වහන්සේ දෙස බලා සිටීම.

**හබක්කුක් :**

චෝදනා කිරීමේ හා නිදොස් බව ඔප්පුකිරීමේ යාච්ඤාව : 1:1-4, 12:17
ඇදහිල්ලේ යාච්ඤාව : 3

**මලාකි :**

යාච්ඤාව - පළමු විරුද්ධ වීම : 1:2
යාච්ඤාව - දෙවන විරුද්ධවීම : 1:6
යාච්ඤාව - තෙවන විරුද්ධවීම : 1:7,13
යාච්ඤාව - සිව්වන විරුද්ධවීම : 2:17
යාච්ඤාව - පස්වන විරුද්ධවීම : 3:17
යාච්ඤාව - හයවන විරුද්ධවීම : 3:8

## නව ගිවිසුමේ සඳහන් යාච්ඤාවන් :

**මතෙව් :**

යාච්ඤාව හා සමාව දීමේ අවශ්‍යතාව : 5:22-26· 6:12, 14:15
යාච්ඤාව හා කුහකකම : 6:5-7
ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වූ ආකාරයට යාච්ඤාව : 6:8-13
ක්‍රිස්තුස්වහන්සේ විශේෂිකරණය කළ ආකාරයට යාච්ඤාව : 7:7-11
කුෂ්ඨ රෝගියෙකුගේ යාච්ඤාව : 8:1-4
ශතාධිපතියාගේ යාච්ඤාව : 8:5-13
උපද්‍රවයකදී කළ යාච්ඤාව : 8:23-27
යක්ෂාවේශවූවන්ගේ යාච්ඤාව : 8:28-3
යායිරස්ගේ යාච්ඤාව : 9:18-19

මහලේ රෝගී කාන්තාවගේ යාච්ඤාව : 9:20-22
අන්ධ මිනිසුන් දෙදෙනාගේ යාච්ඤාව : 9:27-31
සේවකයන්ගේ යාච්ඤාව : 9:37-39
දෙවියන්වහන්සේට කෘතගුණ දැක්වීමේ ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤාව : 11:25-27
කන්දක් මුදුනේ කළ යාච්ඤාව : 14:23
කළකිරීමේදී පේත්‍රුස් කළ යාච්ඤාව : 14:28-30
කානානිය ස්ත්‍රියගේ යාච්ඤාව : 15:21-28
අපස්මාර රෝගී දරුවා උදෙසා යාච්ඤාව : 17:14-21
එක්සත්කමේ යාච්ඤාව : 18:19-20
උපමාවක වූ යාච්ඤාව : 18:23-25
වරප්‍රසාද ලත් තත්වයක් උදෙසා වූ ඉල්ලීම : 20:20-28
අන්ධභාවයෙන් සුවය ලැබීම උදෙසා යාච්ඤාව : 20:29-34
ඇදහිල්ලේ යාච්ඤාව : 21:18-22
රැවටීමේ යාච්ඤාව : 23:14,25
ගණන් දීමේ යාච්ඤාව : 25:20, 22, 24
කැමැත්ත යටත් කිරීමේ යාච්ඤාව : 26:26, 36-46
කල්වරියේදී කළ යාච්ඤාව : 27:46,50

**මාර්ක් :**

යක්ෂයෙකුගේ යාච්ඤාව : 1:23-28, 32:34
ක්‍රිස්තුස්වහන්සේගේ යාච්ඤා කිරීමේ පුරුදු : 1:35; 6:41,46
බිහිරි සහ ගොළු අයෙකුගේ යාච්ඤාව : 7:31-37
යාච්ඤාව සහ නිරාහාරය : 2:18; 9:29
තරුණ පාලකයාගේ යාච්ඤාව : 10:17-22

**ලූක් :**

සෙකරියස්ගේ යාච්ඤාව : 1:8, 13. 67-80
නමස්කාරයක් වැනි වූ යාච්ඤාව : 1:46-55
මහත් භක්තිය හඟවන යාච්ඤාව : 2:10-20, 25-38
සේවයේ දොරටුව ලඟ හිඳ කළ යාච්ඤාව : 3:21-22
ජනප්‍රිය බවින් මිදීම උදෙසා යාච්ඤාව : 5:16
යාච්ඤාව හා දොළොස් දෙනා : 6:12-13, 20, 28
යාච්ඤාව හා අන් වෙසක් වීම : 9:28-29
උපමාවක ස්වරූපයෙන් වූ යාච්ඤාව : 11:5-13
අකිකරු පුත්‍රයාගේ යාච්ඤාව : 15:11-24, 29-30
නිරයෙන් පැමිණි යාච්ඤාව : 16:22-31
කුෂ්ඨ රෝගීන් දස දෙනාගේ යාච්ඤාව : 17:12-19
උපමාව ස්වරූපයෙන් වූ යාච්ඤාව : 18:1-8
පරිසියාගේ හා සුංගම් අයකරන්නාගේ යාච්ඤාව : 18:9-14
පේත්‍රුස්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤාව : 22:31
මහත් වේදනාවේ යාච්ඤාව : 22:39-46
යාච්ඤාව සහ නැවත නැගිටුණු ස්වාමින්වහන්සේ : 24:30, 50-53

**යොහන් :**

ආත්මය උදෙසා වූ යාච්ඤාව : 4:9, 15, 19, 28; 7:37-39; 14:16
රාජ්‍ය සේවකයාගේ යාච්ඤාව : 4:46-54
ජීවනයේ ආහාරය උදෙසා වූ යාච්ඤාව : 6:34
ස්ථිරත්වය උදෙසා වූ යාච්ඤාව : 11:40-42
අරමුණු දෙකක් සහිත වූ යාච්ඤාව : 12:27-28
භාග්‍යයක් වැනි වූ යාච්ඤාව : 14:13-15; 15:16; 16:23-36
සියලු යාච්ඤාවන්ගේ යාච්ඤාව : 17

**ක්‍රියා :**

උඩුමහල් මැඳුරේ යාච්ඤාව : 1:13-14
කෙනෙකු තෝරා ගැනීම උදෙසා යාච්ඤාව : 1:15-26
යාච්ඤාව හා නමස්කාරය : 2:42-47
චාරිත්‍රයක් ලෙස කළ යාච්ඤාව : 3:1
සාක්ෂි දැරීමට නිර්භිත බව ලැබෙන ලෙස කළ යාච්ඤාව : 4:23-31
යාච්ඤාව හා වචනයේ සේවය උදෙසා යාච්ඤාව : 6:4-7
පළමු වේද සාක්ෂිකයාගේ යාච්ඤාව : 7:55-60
සමාරිතයන් හා මායාකාරයා උදෙසා යාච්ඤාව : 8:9-25
දෙවියන්වහන්සේ වෙතට හැරුණු ලැබුණු කෙනෙකුගේ යාච්ඤාව : 9:5-6, 11
දෝර්කස් උදෙසා යාච්ඤාව : 9:36-43
කොර්නේලියස් උදෙසා යාච්ඤාව : 10:2-4, 9, 31
සිරගතව සිට පේත්‍රුස් උදෙසා යාච්ඤාව : 12:5, 12-17
සේවය සඳහා වෙන්කිරීමේ යාච්ඤාව : 13:2-3, 43
නිරාහාරය සමඟ යාච්ඤාව : 13:2-3; 14:15, 23, 26
ගංඉවුරේදී කළ යාච්ඤාව : 16:13,16
සිරකුටියේදී කළ යාච්ඤාව : 16:25, 34
යටත්වීමේ යාච්ඤාව : 20:36
මුහුදුබත් වන්නට වූ අවස්ථාවේදී කළ යාච්ඤාව : 27:33,35
උණ රෝගියෙකු උදෙසා යාච්ඤාව : 28:8, 15, 28

**රෝම :**

සාර්ථක ගමනක් උදෙසා යාච්ඤාව : 1:8-15
ශුද්ධාත්මආනුභාවයෙන් කළ යාච්ඤාව : 8:15, 23, 26-27
ඉශ්‍රායෙලය වෙනුවෙන් කළ යාච්ඤාව : 10:1; 11:26
නොකඩවා කෙරෙන සේවයක් වැනි වූ යාච්ඤාව : 12:12
එක්සත් මනසක් උදෙසා වූ යාච්ඤාව : 15:5-6, 30:33
සාතන්ගෙන් ජය ගැනීමට යාච්ඤාව : 16:20, 24-27

**2 කොරින්ති :**

ආශිර්වාදයක් වැනි වූ යාච්ඤාව : 1:2-4
මාංශයේ වූ උල ඉවත් වන ලෙස කළ යාච්ඤාව : 12:7-10

**එපීස :**

යාච්ඤාව හා ඇදහිලිවන්තයාගේ ස්ථානය : 1:1-11
වැටහීම හා බලය උදෙසා යාච්ඤාව : 1:15-20
දෙවියන්වහන්සේ වෙත ළංවීම වැනි වූ යාච්ඤාව : 2:18; 3:2
අභ්‍යන්තර පූර්ණත්වය උදෙසා යාච්ඤාව : 3:13-21
යාච්ඤාව හා ඇතුළාන්තයේ ගීතිකා : 5:19-20
සොල්දාදුවෙකුගේ ආයුධයක් වැනි වූ යාච්ඤාව : 6:18-19

**පිලිප්පි :**

ප්‍රීතිය සඳහා ඉල්ලීමක් වැනි වූ යාච්ඤාව : 1:2-7
යාච්ඤාව සඳහා වූ මනසේ සමාදානය : 4:6-7, 19-23

**කොලොස්සි :**

අවංක බවට ප්‍රශංසාවක් වැනි වූ යාච්ඤාව : 1:1-8
සත් ආකාරයක ආශිර්වාද සඳහා යාච්ඤාව : 1:9-14
යාච්ඤා සහභාගිකම : 4:2-4, 12, 17

**1 තෙසලෝනික :**

මතක තබා ගැනීම උදෙසා යාච්ඤාව : 1:1-3
නැවත පැමිණීම උදෙසා යාච්ඤාව : 3:9-13
යාච්ඤාව, ප්‍රශංසාව හා පූර්ණත්වය : 5:17-18, 23:24, 28

**2 තෙසලෝනික :**

කැඳවීමේ වටිනාකම උදෙසා යාච්ඤාව : 1:3, 11-12
සැනසීම හා ස්ථිරත්වය උදෙසා යාච්ඤාව : 2:13, 16-17
වචනය හා ආරක්ෂාව උදෙසා යාච්ඤාව : 3:1-5

**2 තිමෝති :**

තිමෝතිගේ සේවය උදෙසා යාච්ඤාව : 1:2-7
ඔනේසිපරෝස්ගේ පවුලේ අය උදෙසා යාච්ඤාව : 1:6-18
බොරු මිතුරන් උදෙසා යාච්ඤාව : 4:14-18

**හෙබ්‍රෙව් :**

මැවිල්ල උදෙසා ප්‍රශංසාවක් වැනි වූ යාච්ඤාව : 1:10-12
කරුණාව හා උපකාරය උදෙසා යාච්ඤාව :4:16
යාච්ඤාව හා ක්‍රිස්තුස්වහන්සේගේ සේවය : 5:7-8; 7:24-25
දෙවියන්වහන්සේගේ කැමැත්ත ක්‍රියාවට නැංවීම උදෙසා යාච්ඤාව : 12:9, 12, 15
සම්පූර්ණත්වය උදෙසා යාච්ඤාව : 13:20-21

**යාකොබ් :**

ප්‍රඥාව උදෙසා යාච්ඤාව : 1:5-8, 17
ඉලක්කය මඟහැරුනු යාච්ඤාව : 4:2-3
ජයගන්නා යාච්ඤාව : 5:13-18

**1 පේත්‍රුස් :**

උරුමකමට කෘතවේදී වූ යාච්ඤාව : 1:3-4
විවාහක තත්වයක් තුළ යාච්ඤාව : 3:7-12
යාච්ඤාවෙන් - බලා සිටීම : 4:7
කිතුනු ස්ථිරත්වය උදෙසා යාච්ඤාව : 5:10-11

**2 පේත්‍රුස් :**

අනුග්‍රහය සහ සමාදානය වැඩීම පිණිස යාච්ඤාව : 1:2

**3 යොහන් :**

ගෞරවය ලැබීමේ පසුබිම වන යාච්ඤාව : 1:4; 12

**යූද් :**

ශුද්ධාත්මයාණන් තුළ කළ යාච්ඤාව : 20

**එළිදරව් :**

ගැළවීම උදෙසා බැටළුපැටවාණන්ට ප්‍රශංසාවක් වැනි වූ යාච්ඤාව : 5:9
රන් සුගන්ද ද්‍රව්‍ය පාත්‍රා වැනි වූ යාච්ඤාව : 5:8; 8:3
වේදසාක්ෂිකයන්ගේ යාච්ඤාව : 6:10

අන්‍යජාතිකයන්ගේ යාච්ඤාව : 7:9-12
වැඩිමහල්ලන්ගේ යාච්ඤාව : 11:15-19
මෝසෙස්ගේ යාච්ඤාව : 15:3-4
මහිමයට පත් ශුද්ධවන්තයන්ගේ යාච්ඤාව : 19:1-10
බයිබලය අවසන් කරන යාච්ඤාවන් : 22:17,20

(මෙම යාච්ඤා ලැයිස්තුව - ජ්.එම්. බවුන්ඩ්ස් - විසින් රචිත “බයිබලයේ සියලු යාච්ඤාවන් නමැති කෘතියෙන් උපුටා ගන්නා ලදි”.)

# දෙවන උපග්‍රන්ථය

## අධ්‍යයන මාර්ගෝපදේශකය : බයිබලිය මැදහත්කම

**යාච්ඤාව සඳහන් බයිබල් පදය :**____________________________________________

**මෙම යාච්ඤාව සිදුකළේ කවුද?**______________________________________________

පහත බයිබල් පද තුළ මෙම පුද්ගලයාගේ චරිත කථාමය තොරතුරු සපයා තිබේ.

**මෙම මැදහත්කරුවාගේ ජීවිතය තුළින් පෙන්නුම් කෙරෙන ධනාත්මක ආත්මික ගුණාංග :**

ඔහුව/ඇයව යහපත් මැදහත්කරුවෙකු බවට පත් කළ කරුණු ලැයිස්තු ගත කරන්න. (මේවා ඔබ ඔබේ ජීවිතය තුළද ඇති කර ගත යුතු දේවල්ය)

**මෙම මැදහත්කරුවාගේ ජීවිතයේ රිනාත්මක ගුනාංග :**

ඔවුන්ගේ මැදහත්කමේ සේවයට බාධා කළ ගුණාංග හෝ හැසිරීම් ලැයිස්තුගත කරන්න. (මේවා ඔබ ඔබේ ජීවිතය තුළ ඉවත් කරගත යුතු දේවල්ය.

**යාච්ඤාව විශ්ලේෂණය කිරීම :**

පුද්ගලයාව යාච්ඤාවට පෙළඹවූ අවස්ථා මොනවාද?
යාච්ඤාවේ ප්‍රධාන අරමුණු වූයේ කුමක්ද?
යාච්ඤාව තුළදී කරන ලද විශේෂිත ඉල්ලීම් මොනවාද?
යාච්ඤාවේ කවර කොටසක් මැදහත්කමේ යාච්ඤාවද? ඉල්ලීම්? පාපොච්චාරණයද? නමස්කාරය හා ප්‍රශංසාවද?
යාච්ඤා කරන පුද්ගලයා තුළින් ඇදහිල්ල ප්‍රකාශ වීමක් හෝ ඇදහිල්ල මද බවක් ප්‍රකාශ වීමක් සිදු වන්නේද?
යාච්ඤාව තුළදී උපුටාගෙන ඇති බයිබල් පද මොනවාද?
දෙවියන්වහන්සේට, යේසුස්වහන්සේට හෝ ශුද්ධාත්මයාණන්වහන්සේට සඳහන් යොමු කිරීම් මොනවාද?
යාච්ඤාව තුළ ප්‍රකාශ කර ඇති දෙවියන්වහන්සේගේ පොරොන්දු ලැයිස්තුගත කරන්න.
යාච්ඤාවට පිළිතුරු ලැබුණේද? කවදාද? කෙසේද?
එයට පිළිතුරු ලැබුණේ නැතිනම්, ඒ ඇයි?
යාච්ඤාවේ ප්‍රතිඵල වූයේ මොනවාද?
ඔබේ මැදහත්කම වඩා බලවත් කර ගැනීම සඳහා ඔබට මෙම යාච්ඤාවෙන් ඉගෙන ගත හැක්කේ මොනවාද?

# ස්වයං පරීක්ෂණය සඳහා පිළිතුරු

## පළමු පරිච්ඡේදය :

1. ඉල්ලාපල්ලා, එවිට නුඹලාට දෙනු ලැබේ; සොයාපල්ලා, එවිට නුඹලාට සම්බවේ; තට්ටුකරපල්ලා, එවිට නුඹලාට දොර හරිනු ලැබේ. මක්නිසාද ඉල්ලන්නාවූ සියල්ලන්ට ලැබේ; සොයන්නාට සම්බවේ; තට්ටුකරන්නාට දොර හරිනු ලැබේ. (මතෙව් 7:7-8)

2. යාච්ඤාව යනු දෙවියන්වහන්සේ සමඟ සන්නිවේදනය කිරීමයි. එය විවිධ ආකාර වලින් සිදු විය හැකි නමුත්, මූලිකවම එය සිදුවන්නේ මිනිසා දෙවියන්වහන්සේ සමඟ කතා කරන විට සහ දෙවියන්වහන්සේ මිනිසා සමඟ කතා කරන විටය.

3. යාච්ඤාවට පහත පරිදි පිළිතුරු ලැබුණු බව බයිබලය එළිදරව් කරයි :

| | |
|---|---|
| ඇතැම් විට ක්ෂණිකවම | : යෙසායා 65:24; දානියෙල් 9:21-23 |
| ඇතැම් විට ප්‍රමාද වී | : ලූක් 18:7 |
| අපගේ ආශාවන්ට වඩා වෙනස් ලෙස | : 2 කොරින්ති 12:8-9 |
| අපගේ බලාපොරොත්තු වලටත් වඩා ඉහළින් | : යෙරමියා 33:3; එපීස 3:20 |

4. උන්වහන්සේ යාච්ඤාවට ප්‍රමුඛත්වය දුන් අතර තම ජීවිතයේ ඕනෑම වැදගත් අවස්ථාවකදී යාච්ඤා කළේය. පරිච්ඡේදය තුළ "යේසුස්වහන්සේගේ යාච්ඤා ජීවිතය" ලෙස නම් කර ඇති කොටස බලන්න.

5. වැදගත්කමේ යාච්ඤාවේ මට්ටම් තුනකි : ඉල්ලීම, සෙවීම හා තට්ටු කිරීම.
ඉල්ලීම යාච්ඤාවේ පළමු මට්ටමයි. එය අපගේ ඉල්ලීම් සරලව දෙවියන්වහන්සේට ඉදිරිපත් කර ක්ෂණික පිළිතුරක් ලබා ගැනීමයි. සෙවීම යාච්ඤාවේ වඩාත් ගැඹුරු මට්ටමකි. මෙය ඉල්ලීමේ මට්ටමේදී තරම් ඉක්මනින් යාච්ඤාවට පිළිතුරු නොලැබෙන මට්ටමකි. තට්ටු කිරීම වඩාත් ගැඹුරු මට්ටමකි. එය පිළිතුරු ලැබීමට දිගු කලක් ගත වන විටත් නොනැවති කෙරෙන යාච්ඤාවකි.

6. නමස්කාරය හා ප්‍රශංසාව : නමස්කාරය යනු ගෞරවය හා භක්තිය දීමය. මෙනෙහිකිරීමයි. ප්‍රශංසාව යනු දෙවියන්වහන්සේ කර ඇති දේවල් වලට පමණක් නොව උන්වහන්සේගේ ස්වභාවය ගැන ස්තුතිදීම හා කෘතගුණ දැක්වීම වේ. කැපවීම :මෙය ඔබේ ජීවිතය හා කැමැත්ත දෙවියන්වහන්සේට කැපකිරීමේ යාච්ඤාවයි. මේ තුළ දෙවියන්වහන්සේට උන්වහන්සේගේ ක්‍රියාවට හා උන්වහන්සේගේ අරමුණුවලට භාරවීමේ හා කැපවීමේ යාච්ඤාවන්ද අන්තර්ගත වේ.

   ඉල්ලීම : ඉල්ලීම යනු ඉල්ලීම, සෙවීම හෝ තට්ටු කිරීම යන මට්ටම් වලදී කරන ලද අයැදීම. අයැදීම යනු ඉල්ලීම, සෙවීම හෝ තට්ටුකිරීම යන යාච්ඤාවන්ට තවත් නමකි. කන්නලව්කිරීමද මේ ආකාරයේ යාච්ඤාව සඳහා යොදා ගත හැකි තවත් වචනයකි. පාපොච්චාරණය හා පසුතැවීම :පාපොච්චාරණය කිරීමේ යාච්ඤාවක් යනු පසුතැවිලිවීම හා පාපයට සමාව අයදීමයි.
   මැදහත්කම : මැදහත්කරුවකු යනු වෙනත් කෙනෙකුගේ තැන ගන්නා හෝ වෙනත් කෙනෙකුගේ කාරණයක් උදෙසා පෙනී සිටින්නාය.

## දෙවන පරිච්ඡේදය :

1. එබැවින්, උන්වහන්සේ කරණකොටගෙන දෙවියන්වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා මැදහත්කම්කරන පිණිස උන්වහන්සේ නිරතුරුම ජීවත්වන හෙයින්, ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන. (හෙබ්‍රෙව් 7:25)

2. දෙවියන්වහන්සේගේ උපකාරය අතිශයින් අවශ්‍ය වෙනත් අයෙකු හෝ පිරිසක් උදෙසා කෙනෙකු විසින් කරනු ලබන ශුද්ධ, ඇදහිල්ලෙන් යුතු, නොකඩවා කරන යාච්ඤාවක් ලෙස නිර්වචනය කළ හැකිය.

3. නව ගිවිසුම් ඇදහිලිවන්තයාගේ මැදිහත්කමේ යාච්ඤා සේවයේ පදනම දෙවියන්වහන්සේ ඉදිරියේ පූජකයන් වීමට ඇති කැදවීමය. අප ශුද්ධ වූ පූජකවංශයක් (1 පේත්‍රුස් 2:5), රාජකීය පූජකවංශයක් (1 පේත්‍රුස් 2:9), හා දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ පූජකයන් (එළිදරව් 1:6) බව දේව වචනයෙන් ප්‍රකාශ කරයි.

4. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ.

5. පරණ ගිවිසුමේ පූජකයෙකුගේ ක්‍රියාව හා නව ගිවිසුමේ යේසුස්වහන්සේගේ රටාව අනුගමනය කරන මැදහත්කරුවන් ලෙස, අප දෙවියන්වහන්සේ ඉදිරියේ සහ ධර්මිෂ්ඨ දෙවිඳුන් හා පාපිෂ්ඨ මිනිසා අතර සිටගන්නෙමු.

6. මැදහත්කම වැදගත් වන්නේ යේසුස්වහන්සේ තම සේවය තුළදී මැදහත්කමට දැක්වූ විශේෂත්වය නිසාම එය ඉතාම වැදගත් වේ. බලවත් මැදහත්කම තුළින් බලවත් ප්‍රතිඵල අත්දුටු මිනිසුන්ගේ හා කාන්තාවන්ගේ කතා පුවත් වලින් පිරුණු බයිබලීය වාර්තා තුළින් ද එහි වැදගත්කම එළිදරව් වේ. බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කම් තුළින් ඔබට ආත්මිකව ලෝකයේ ඕනෑම තැනකට යාමේ හැකියාව ඇත.

## තුන්වන වන පරිච්ඡේදය :

1. එකළ උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, (ලූක් 9:1)

2. සතුරාට එරෙහිව ආධිපත්‍ය ඔබට ලැබෙන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් හා ඇදහිලිවන්තයෙකු ලෙස උන්වහන්සේ තුළ ඔබේ තත්වය තුළිනි. සතුරාට එරෙහි බලය ඔබට ලැබෙන්නේ ශුද්ධාත්මයාණන් තුළිනි.

3. "බැඳීම" යන වචනය අසාර් (asar) නමැති හෙබ්‍රෙව් වචනයෙන් සෑදී ඇති අතර එහි අර්ථය "බැඳ තැබීම, සිර කිරීම, ගැට ගැසීම, එතීම, වැඩ ගැනීම" යන්නයි. ඔබේ ජීවිතයේ, නිවසේ, සමාජයේ සහ සභාවේ ක්‍රියා කරන සතුරාගේ බලය බැඳ දැමීමට ඔබට හැකිය.

4. ලිහා දැමීම යනු නිදහස් කිරීමයි. සතුරාගේ පාපයේ, දොම්නසේ හා අධෛර්යයේ බැඳීම් වලින් ඔබට මිනිසුන් හා කාන්තාවන් නිදහස් කළ හැකිය.

5. මතෙව් 16:9

6. අප දෙවියන්වහන්සේ ඉදිරියේ මැදහත්කම් කරන ආධිපත්‍ය යේසුස්වහන්සේගේ නාමයෙන් වන බැවින් එය බලවත්ය. යොහන් 14:14 බලන්න.

7. යේසුස්වහන්සේගේ ලේ තුළින් අපට පිය වූ දෙවියන්වහන්සේ වෙත ළඟා විය හැක.
හෙබ්‍රෙව් 10:19-22

8. සම්පූර්ණ නිරාහාරය යනු ඔබ කිසිම කෑමක් හෝ බීමක් නොගෙන සිටීමයි. මේ සඳහා උදාහරණයක් ක්‍රියා 9:9 හමුවේ. අර්ධ නිරාහාරය යනු ආහාර වේල සීමා කර ඇති අවස්ථාවයි. දානියෙල් 10:3 හි මේ සඳහා උදාහරණයක් තිබේ.

9. නිරාහාරය දෙවියන්වහන්සේ වෙනස් කරන්නේ නැත. එය ඔබ වෙනස් කරයි. ඔබට දෙවියන්වහන්සේ ඔබ සමඟ ක්‍රියා කරන්නේ ඔබ උන්වහන්සේ සමඟ පවත්වන සම්බන්ධතාවය මත පදනම්ව වේ. ඔබ වෙනස් වූ විට, දෙවියන්වහන්සේ ඔබ සමඟ ගනුදෙනු කරන ආකාරයට බලපෑමක් ඇති වේ.

10. දෙවියන්වහන්සේගේ "තෝරාගත්" හෝ දිව්‍යමය අනුමැතිය ලත් නිරාහාරය යෙසායා 58 හි විස්තර කරයි.

11. ඔබ නිරාහාරව සිටින විට, සිදුවන මුල්ම දෙය දෙවියන්වහන්සේ උන්වහන්සේව ඔබට එළිදරව් කිරීමයි. (යෙසායා 58:9). යෙසායා 58 හි දක්වා ඇති නිරාහාරයේ අනෙකුත් ප්‍රතිඵල නම් - ආලෝකවත් කිරීම, මඟපෙන්වීම, සැපයීම, යළි ප්‍රාණවත් වීම හා යළි ගොඩනැගීමයි.

## හතරවන පරිච්ඡේදය

1. උන්වහන්සේ ඉදිරියෙහි අපට තිබෙන නිසැක කම නම්, අප උන්වහන්සේගේ කැමැත්ත ලෙස යමක් ඉල්ලුවොත් උන්වහන්සේ අපේ ඉල්ලීම අසන බවය. අප යම් දෙයක් ඉල්ලන කල උන්වහන්සේ අසන බව අපි දනිමු නම්, අප උන්වහන්සේගෙන් ඉල්ලූ දේ අපට ලැබෙන බව දනිමුව. (1 යොහන් 5:14-15)

2. මැදිහත්කම් කළ යුතු ආකාරය පිළිබඳව හතරවන පරිච්ඡේදයේ සඳහන් කොටස නැවත බලන්න.

3. අප යාච්ඤාවෙන් මැදහත්කම් කළ යුත්තේ මොනවා උදෙසාද යන්න සඳහන් 4 වන පරිච්ඡේදයේ කොටස නැවත බලන්න.

4. 4 වන පරිච්ඡේදයේ සඳහන් බලපෑමක් කළ හැකි ආකාරයේ මැදහත්කමක් උදෙසා වූ ප්‍රතිපත්ති යන කොටස නැවත බලන්න.

5. දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇත්තේ මොනවාදැයි ඉගෙන ගෙන ඒ අනුව යාච්ඤා කරන්න, එවිට ඔබේ යාච්ඤාවට පිළිතුරු ලැබෙනු ඇති බව ඔබ දනී. බයිබලය කියවා දෙවියන්වහන්සේගේ සියලු පොරොන්දු ලකුණු කර ඔබගේ යාච්ඤාවන් මෙම පොරොන්දු මත පදනම් කිරීම මෙය කළ හැකි එක් ආකාරයකි.

### පස්වන පරිච්ඡේදය :

1. නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම්කරන පිණිස වැරදිලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)

2. ඕනෑම ආකාරයක පාපයක්, හදවතේ ඇති දේවතා රූප, සමාව නොදීමේ ආත්මය, ආත්මාර්ථකාමී බව හා වැරදි අභිප්‍රායන්, විවාහ සහකරුට හෝ සහකාරියට වැරදි ලෙස සැළකීම, ස්ව-ධර්මිෂ්ඨබව, අවිශ්වාසය, ක්‍රිස්තුස්වහන්සේට හා උන්වහන්සේගේ වචනයට බැඳී නොසිටීම, යේසුස්වහන්සේගේ නාමයෙන් නොඉල්ලීම, ඝාතකයන්ගේ, යක්ෂයන්ගේ බාධා, පළමුව දේව රාජ්‍යය නොසෙවීම, ඔබ යාච්ඤා කළ යුතු ආකාරය ඔබ නොදන්නා විට.

3. දෙවියන්වහන්සේ ඔබට යමක් කරන්න යැයි පැවසූ විට උන්වහන්සේ ඔබට දුන් මඟ පෙන්වීම අනුව ඔබ ක්‍රියා කළ යුතු වන අතර දෙවියන්වහන්සේ ඔබට දුන් ආඥාව ඉටු කිරීමෙන් වැළකීමට මැදහත්කම නිදහසට කරුණක් වශයෙන් පාවිච්චි නොකළ යුතුය.

## හය වන පරිච්ඡේදය :

1. එහෙයින් නුඹලා මෙසේ යාච්ඤාකරපල්ලා:- ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව. අපේ ණයකාරයන්ට අප කමාකළාක්මෙන් අපේ ණයත් අපට කමාකළ මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගැළවුව මැනව. (මතෙව් 6:9-13)

2. මතෙව් 6:9-13 හා ලූක් 11:2-4.

3. උන්වහන්සේගේ යාච්ඤාව ආරම්භ වන්නේ "අපගේ" යන උත්තම පුරුෂ බහු වචන පදයෙනි. යාච්ඤාවේ ඉදිරියට "අපට දුන මැනව" "අප නොපමුණුවා" හා "අප කමාකළ මැනව" වැනි ප්‍රකාශ අපට දැකිය හැකිය. ඔබ ගැන මෙන්ම ඔබ අනෙක් අය ගැනද යාච්ඤා කරන බැවින් ආදර්ශ යාච්ඤාව මැදහත්කමේ යාච්ඤාවකි.

4. ඔවුන් උදෙසා යාච්ඤා කරන්න "ඇගේ ජීවිතය තුළ ඔබවහන්සේගේ රාජ්‍යය පැමිණෙන මෙන් යාච්ඤා කරමි, ඔබගේ කැමැත්ත ඉටු වේවා. අද දවසේදී ඇයට සැපයුම මැනව..." වෙනත්.

5. දෙවියන්වහන්සේගේ නාමයන්ගෙන් පෙන්නුම් කරන්නේ උන්වහන්සේගේ ස්වභාවය හා අප උදෙසා උන්වහන්සේ කවුරුන්ද යන්න වන අතර ඔබ අන්‍යයන් උදෙසා මැදහත්කම් කරන විට, ඔබට එය ප්‍රකාශ කළ හැකිය. උදාහරණයක් ලෙස : ජෙහොවා ජයිරේ සම්ඳුන් අවශ්‍යතාවයෙන් සිටින අයෙකුට සැපයීම සඳහා යාච්ඤා කිරීම.

## හත්වන පරිච්ඡේදය :

1. මාගේ නාමය දරන මාගේ සෙනඟ යටත්වී යාච්ඤාකර මාගේ මුහුණ සොයා තමුන්ගේ නපුරු මාර්ග අත්හැරියොත්, මම ස්වර්ගයේ සිට අසා ඔවුන්ගේ පව් කමාකොට ඔවුන්ගේ දේශය සුවකරන්නෙමි. (2 ලේකම් 7:14)

2. දෙවියන්වහන්සේගේ රීමා (rhema) වචනය තුළින් පිබිදීම ගැන එළිදරව් වන ප්‍රතිපත්ති ඉගෙන ගෙන අදාළකරගත් මිනිසුන් තුළින් හා ඔවුන් උදෙසා ක්‍රියාත්මක වන දෙවියන්වහන්සේගේ බලවත්, අසාමාන්‍ය ක්‍රියාවකි.

3. අප ඒ සඳහා සූදානම් වන්නේ දේව වචනයේ එළිදරව් කර ඇති ප්‍රතිපත්ති අනුගමනය කිරීම මඟිනි. පිබිදීම යනු දේව ආත්මය හා දේව ජනතාවගේ ප්‍රතිචාරය එක්ව සිදුවන ක්‍රියාවයි.

4. පිබිදීම අවශ්‍ය වන්නේ පසුබටවීමේ තත්වයක් ඇතිවන විටය.

5. හත්වන පරිච්ඡේදයේ සපයා ඇති පසුබට වීමේ තත්වයකට ඇති සාක්ෂි පිළිබඳ සාරාංශය සමඟ ඔබේ පිළිතුර සසඳන්න.

6. හත්වන පරිච්ඡේදයේ දක්වා ඇති පිබිදීම පිළිබඳ බයිබලීය ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය සමඟ ඔබේ පිළිතුරු සපයන්න.

7. නායකත්ව, සභාවෙන් පැමිණෙන, සාමාන්‍ය බාධාවන්. හත්වන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව බලන්න.

8. 2 ලේකම් 7:14

9. ඔබ යටත් වන්න, යාච්ඤා කරන්න, දෙවියන්වහන්සේගේ මුහුණ සොයන්න, ඔබගේ නපුරු මාර්ග වලින් හැරෙන්න. හත්වන පරිච්ඡේදයේ ඇති සාකච්ඡාව බලන්න.

## අටවන පරිච්ඡේදය :

1. නුමුත් නුඹ යාච්ඤාකරන කල්හි නුඹේ ඇතුල් ගෙට වැද, දොර වසා, රහසිගතව වසන නුඹේ පියාණන්වහන්සේට යාච්ඤාකරපන්න, එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට විපාක දෙනසේක. (මතෙව් 6:6)

2. පිළිතුරු විවිධ විය හැකිය.

3. පිළිතුරු තුළ පහත දේවල් ඇතුලු විය හැකිය : කාලය මද බව, අවධානය වෙනස් කරන දේවල්, වෙහෙස, ආශාව මද බව.

4. පිළිතුරු විවිධ විය හැකිය.

5. පිළිතුරු විවිධ විය හැකිය.

6. පිළිතුරු විවිධ විය හැකිය.